# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016 ඔක්තෝබර් 04** වන අඟහරුවාදා
2016 ஐப்பசி 04 செவ்வாய்க் கிழமை
Tuesday 04th October 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.36 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.36 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.36 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ
GOVERNOR'S PROCLAMATION

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 3 අනු ව්‍යවස්ථාවට අනුව, මෙම පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමන් විසින් අංක C.S.A/9/9/4 හා 2016.09.28 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඇති බවත්,*

*එම පනත් කෙටුම්පත බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කර පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක්, අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීමට හැකිවන පරිදි 2016.09.29 වන දින සිට දින 12 ක් ඇතුළත බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන මෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 1/12/3/නීති කටයුතු මිශ්‍ර, හා 2016.09.29 දිනැති ලිපිය මගින් මා වෙත දැනුම් දී තිබෙනවා."*

*එම පනත් කෙටුම්පතේ පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත සම්බන්ධව මෙම පළාත් සභාවේ අදහස් දන්වා යැවීමේදී ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ විශේෂ රැස්වීමක් අද දින සභා රැස්වීමේ තේ විවේකය සඳහා වූ කාලය තුළදී, ඒ කියන්නේ පෙ.ව. 10.30 ත් 11.00 ත් අතර කාලය තුළ දී මගේ නිල කාමරයේදී පැවැත් වෙනවා.*

*ඒ සඳහා සභා කටයුතු පිළිබඳ කාරක සභාව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා, උදෑසන තේ විවේක කාලය තුළ එම සභා කටයුතු පිළිබඳ විශේෂ කාරක සභා රැස්වීමට සහභාගි වන ලෙසට. පනත් කෙටුම්පතේ සෑම පළාත් අමාත්‍යාංශයක් සෑම පළාත් දෙපාර්තමේන්තුවක් හා පළාත් පාලන ආයතනයක් පිළිබඳවද සඳහන් වන නිසා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු අමාත්‍යවරුන්ටද එම කාරක සභා රැස්වීමට සහභාගි වන ලෙස කාරුණිකව ආරාධනා කර සිටිනවා.*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මීට පෙර අවස්ථාවක තොරතුරු දැන ගැනීමේ පනත මේ සභාවේ සාකච්ඡා කළා. සාකච්ඡා කළාට පස්සේ, අපි අපේ විවේචන හා අදහස් සටහන් කරලා පාර්ලිමේන්තුවට යැව්වා. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් අපි අදාළ කෙටුම්පත සහ යෝජනා ලබා ගත්තා. පළාත් සභා කිහිපයක යෝජනා එම කෙටුම්පත සමඟ මන්ත්‍රීවරයාට ලැබිලා තිබුණා. නමුත් බස්නාහිර පළාත් සභාවේ අදහස පාර්ලිමේන්තුවට ගිහිල්ලා තිබුණේ නැහැ. ඒ ඇයි? කියලා දැනගන්න කැමැතියි. ඔබතුමාට දැන් උත්තරයක් දෙන්න බැරි වෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මට කියන්න බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පැහැදිලිවම බස්නාහිර පළාත් සභාවේ අදහස එතැන තිබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන සොයා බලලා ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්නම්, ඊළඟ අවස්ථාවේදී.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, තිරසාර සංවර්ධනය සඳහා වූ මේ පනත පළාත් සභා බලතලවලට සෘජුව බලපාන පනතක්. ඉතින් මේ පනත පිළිබඳව විවාදයක් කරන්නේ නැතිව, පනතට සංශෝධන එකතු කරන්න තිබෙනවා නම්, ඒවා එකතු කරන්නේ නැතිව දින 12 ක් ඇතුළත මෙය සම්මත කරලා යවන එක පළාත් සභාවක් විධියට අපට බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේකට කාලය ඉල්ලාගෙන, විවාද කරන්න දවසක් ඉල්ලගෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් 10.30 ට රැස් වෙන්නේ ඒකටයි. පෙ.ව. 10.30 ට අනිවාර්යයෙන්ම සභා කටයුතු කාරක සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලු අමාත්‍යවරු සහ ගරු විපක්ෂ නායකතුමාත් එම අවස්ථාවට සහභාගි වෙන්න. පෙ.ව. 10.30 ට මාගේ නිල කාමරයේ පැවැත් වෙනවා.

# සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ජනාධිපති ලේකම්ගේ අංක සී.එස්.ඒ/1/08 ඩබ්ලිව්.පී./01 හා 2016.09.28 දිනැති ලිපියට අනුව 2016.09.29 දින බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ධූරයෙහි එම්.ඒ.බී. දයා සෙනරත් මහතා රාජකාරී කටයුතු භාරගත් බව ප්‍රධාන ලේකම් කාර්යාලයේ අංක C.S.O/CS.P/01/01 2016 හා 2016.10.03 දිනැති ලිපිය මගින් සභා ලේකම්තුමා වෙත දන්වා එවා තිබෙනවා. නව ප්‍රධාන ලේකම්තුමාට විශේෂයෙන්ම සුභ පතනවා. ඔබතුමාගේ ඉදිරි කාලය තුළ පළාත් සභාවට දැවැන්ත සේවාවක් කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබෙන්න කියලා. ඒ වාගේම අපේ හිටපු ප්‍රධාන ලේකම්තුමියටත් මේ අවස්ථාවේදී අපි සුභ පතනවා. එතුමියගේ ඉදිරි වැඩ කටයුතු සාර්ථක වෙන්න කියලා."*

*ii*

*"දැනට ක්‍රියාත්මකව පවතින ඉදිරියේදී පරිච්ඡින්න කිරීමට යෝජිතව ඇති 2000 අංක 06 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තියේ පිටපතක් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙනවා. ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරනවා."*

# ලිපි ලේඛන පිළිගැන්වීම
PAPERS PRESENTED

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, *"අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා මගින් මෙම පළාත් සභාවේ අදහස් විමසා එවා ඇති ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත මම මෙම සභාවට පිළිගන්වනවා."*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2013.10.24 දින සිට 2016.03.10 දින දක්වා දින 50 ක් රැස් වූ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා ඇතුළත් කාණ්ඩ අංක 01 හා කාණ්ඩ අංක 02 වාර්තා පිළිගන්වනවා."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2016.09.21 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, බොරලැස්ගමුව, අබේරත්න මාවත, මානෙල් පටුමඟ, අංක 68/4 B හි පදිංචි පී. අබේනායක යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පිළියන්දල, මඩපාත, කොටගෙදර, එච්.පී.ටී. වත්ත, අංක 7/165 හි පදිංචි එච්. ඔස්ටින් සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, කළුතර දකුණ, කටුකුරුන්ද, කච්චේරිවත්ත, ධර්මාරාම පාර හි පදිංචි දිනුෂ මනෝජ් සංජීව යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වත්තල, හුණුපිටිය, කාන්ති මාවත, අංක 759/සී හි පදිංචි ආර්.ඒ. දයාවංශ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, පානදුර, තොටවත්ත, යෝනක මාවත, අංක 38 හි පදිංචි එච්.එම්.එම්. නසීර් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ඒ යටතේ පළමුවෙන්ම සියලුම ගරු අමාත්‍යවරුන්ගේ අවධානය මම යොමු කරනවා. මීට පෙර සභා රැස්වීම්වලදී පිළිතුරු දීමට කල් ගත්ත යම් අතුරු ප්‍රශ්නයක් ඇත්නම් ඒවාට පිළිතුරු ලබා දීමට සූදානම්ව සිටිනවා නම්, න්‍යාය පත්‍රයේ අමාත්‍යාංශ නිවේදන හා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ ඒ සඳහා අවස්ථාව ලබා දී ඇති බවත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**01.**

**ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/83)**

අ. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහබෙල්ලන තොටුපල මාර්ගයේ මාර්ගයට හා අසළ තාප්පවලට හානිදායක අයුරින් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මගින් පස් කැපීමක් සිදු කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ. එසේ නම් එම පස් ප්‍රාදේශීය සභාව කුමන කටයුතු සඳහා යෙදෙව්වේද?

ඇ. එම ක්‍රියාදාමයේදී අදාළ මාර්ගයට හා තාප්පවලට වී ඇති හානිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව මගින් කිනම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

ඉ. එම මාර්ගයෙන් ලබා ගන්නා පස් අලෙවි කර තිබේද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේදී පමණ මහබෙල්ලන තොටුපල මාර්ගයේ දෙපස කාණු කැපීමක් සිදු කර ඇති බව දනිමි.

ආ. කාණු කැපීමෙන් හටගත් පස් කුමන කටයුත්තක් සඳහා යෙදෙව්වේද යන්න මේ වන විට නිශ්චිතව අනාවරණය කර ගත නොහැක.

ඇ. මාර්ගයේ දකුණු පස කොටසේ පමණක් සභාව විසින් මීටර් 217 ක් පමණ දුරට කාණු කොන්ක්‍රීට් කර ඇති අතර, ඊට වැඩිමනත්ව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් ගෙන නොමැත.

ඈ. කාණු කොන්ක්‍රීට් කිරීම සඳහා රුපියල් ලක්ෂ දහයක පමණ මුදල් ප්‍රතිපාදන සලසා ගනිමින්, එම මූල්‍ය සීමාව තුළ කාණු කොන්ක්‍රීට් කර ඇත.

ඉ. පස් අලෙවි කිරීමක් එම අවස්ථාවේ සිදු කළ බවට වර්තමානයේ කරුණු අනාවරණය නොවේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ ප්‍රශ්න අහන්නේ විශේෂයෙන්ම මේවා නැවත නොවෙන්න. නිවැරැදි වෙන්නත් එක්ක. මම අහන්න කැමැතියි. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රයක් තිබෙනවා. ඒ බැකෝ යන්ත්‍රය තිබෙද්දී තමයි පිට කෙනෙකුගේ බැකෝ යන්ත්‍රයක් යොදලා මේ කාණු කපන්නත් නොවෙයි - තනිකර පස් ගන්නම තමයි මේ කාණු ටික කපන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විස්තර කරන්න යන්න අවශ්‍ය නැහැ. ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා මම අහන්න කැමැතියි, සභාවේ බැකෝ යන්ත්‍රයක් තිබෙද්දී ඇයි පිට බැකෝ යන්ත්‍රයක් යොදලා මේ දේ කළේ?

අනික් එක තමයි, පැහැදිලිවම පස් විකුණලා තිබෙනවා. ඒකත් එක්කම දැන් ඒ මිනිස්සු තමයි සම්පූර්ණයෙන් නැවත කාණු වහලා, සමහර තාප්ප තමන්ම හදා ගත්තේ. ඉතින් මම අහන්න කැමැතියි, ප්‍රාදේශීය සභාවෙන් මෙහෙම කරලා ඒ මිනිස්සුන්ගේ තාප්ප ටික හදලා දුන්නේ නැත්තේ ඇයි? මේ අනතුරට ලක් කරලා. මම ඉල්ලා සිටින්නේ, මේවා නිවැරැදි වෙන්න ඕනෑ නිසා. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා වැරැදි කරපු අයට ඒ නියම දඬුවම් දෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න තුනක් වශයෙන්, ප්‍රශ්න දෙකක් ඇහුවා. ඔබතුමා දැන් ගරු මහ ඇමැතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ නේද? හරි. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව. එතුමා නැහැ. පිළිතුර සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**02.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/84)**

*ප්‍රශ්නය :*

*අ. ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති විසින් අංක WP/CB/G/ED/2015/3/15/13 හා 2015 නොවැම්බර් 03 දිනැතිව විගණන විමසුමක් සිදු කර තිබේද?*

පිළිතුර :

අ. ඉහත විගණකාධිපති අංකයෙන් විගණන විමසුමක් ලැබී නැත. එහෙත් WP/CB/ED/2015/3/15/03 හා 2015 නොවැම්බර් 03 දිනැතිව විශේෂ විගණනය - 2016 බප/ජය/විද්‍යාකාර බාලිකා විද්‍යාලය නමින් විගණන විමසුමක් ලැබී ඇත.

ප්‍රශ්නය :

ආ. එසේ නම් එය කුමන කරුණු පදනම් කර ගනිමින්ද?

පිළිතුර :

ආ. ඉහත විගණන විමසුමේ 4 ඡේදයේ කාර්ය මණ්ඩල පරිපාලනය යටතේ, 2015 ජූලි 01 දිනට කාර්ය මණ්ඩල විගණන ඡේදයේ නිරීක්ෂණයන් පදනම් කරගෙන රජයේ පාසලක වර්ෂ 08 කට වඩා වැඩි සේවා කාලයක් නොකඩවා සේවය කළ ගුරුභවතුන් ස්ථාන මාරු කිරීම පිළිබඳව.

ප්‍රශ්නය :

ඇ. එම විගණන විමසුමේ නිර්දේශ මොනවාද?

පිළිතුර :

ඇ. නිර්දේශ ඉදිරිපත් කර නොමැති අතර, නිරීක්ෂණ වශයෙන් අංක 10/2377/436/052 දරන අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ සංදේශයට 2010 ඔක්තෝබර් 18 දින ලබා දී තිබූ අනුමැතිය අනුව රජයේ පාසලක වර්ෂ 08 කට වඩා වැඩි සේවා කාලයක් නොකඩවා සේවය කළ ගුරුභවතුන් ස්ථාන මාරු කළ යුතු බව සඳහන්ව ඇතත් මෙම විද්‍යාලයේ ගුරුවරු තිස්පස් දෙනෙක් වර්ෂ 08 ඉක්මවා සේවයේ නියුක්ත බව පෙන්වා දී ඇත.

ප්‍රශ්නය :

ඈ. පාසලක වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථාන මාරු කිරීමට එමගින් නිර්දේශ කර තිබේද?

පිළිතුරු:

ඈ. වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථාන මාරු කිරීමට එමඟින් නිර්දේශ කර නොමැත. නමුත් ඉහත පරිදි රජයේ පාසලක වර්ෂ 08 කට වඩා වැඩි සේවා කාලයක් නොකඩවා සේවය කළ ගුරුභවතුන් ස්ථාන මාරු කර නොමැති බව සඳහන් කර ඇත.

ප්‍රශ්නය :

ඉ. ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී එය ඇතැම් ගුරුවරුන්ට පමණක් සීමාවන පරිදි ක්‍රියාත්මක කර ඇති බවට තිබෙන තොරතුරු සත්‍යද?

පිළිතුරු :

ඉ. එම විගණන විමසුමේ නිරීක්ෂණ අනුව කටයුතු කිරීමේදී ඇතැම් ගුරුවරුන්ට පමණක් සීමා වන පරිදි කටයුතු සිදු කර නොමැති අතර, විමසුමේ සඳහන් සියලු ගුරුවරුන්ට පොදුවේ ක්‍රියාත්මක කර ඇත. විගණන විමසුමේ පෙන්වා දී ඇත්තේ අවු.08 කට වැඩි සේවා කාලයක් ඇති ගුරුභවතුන් 35 දෙනෙක් සිටින බවටයි. නමුත් බස්නාහිර පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව ස්ථාන මාරු කරනුයේ පාසලක වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ගුරු භවතුන්ය. අවු.10 කට වැඩි සේවා කාලයක් සහිත ගුරුභවතුන් ඒ වන විට සිටියේ 17 දෙනෙකි. ඉන් 14 දෙනෙක් ස්ථාන මාරු කර ඇති අතර, විශේෂ හේතු මත 03 දෙනෙකුට ස්ථාන මාරු ලබා දී නැත. එම තිදෙනා නම්,

1. පූජ්‍ය පේමේගම ධම්මාලෝක හිමි
   ගොඩිගමුව සද්ධර්මාරාම විහාරයේ විහාරාධිපති
   වයස අවු.56 කට වැඩිය.
2. ඩී.ඩී.එල්. ජිනේන්ද්‍ර මයා
   පිළිකා රෝහලෙන් බෙහෙත් ගනු ලබන රෝගියෙකි.
3. රේණුකා රත්නායක මිය
   විදුහල්පති III නව විදුහල්පති ශ්‍රේණිධාරිණියකි. මෙම මහත්මිය විදුහල්පති ශ්‍රේණිධාරීන් ස්ථානගත කිරීමේදී වෙනත් පාසලකට ස්ථාන මාරු කිරීමට නියමිතය.

ප්‍රශ්නය :

ඊ. නොඑසේ නම් එම විගණන විමසුම් නිර්දේශ අදාළ සියලු ගුරුවරුන්ට ක්‍රියාත්මක කළේද?

***ප්‍රශ්නය :***

*ඊ. විගණන විමසුමේ නිරීක්ෂණ අනුව කටයුතු කිරීමේදී සියලු ගුරුවරුන්ට පොදුවේ ක්‍රියාත්මක කර ඇත.*

## 03.

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/85)**

අ. ගම්පහ දිස්ත්‍රික්කයේ හේනෙගම මධ්‍ය මහ විද්‍යාලය නමින් පාසලක් පවතින්නේද?

ආ. i. එම විද්‍යාලයේ වත්මන් විදුහල්පතිවරයාගේ නම කුමක්ද?

ii. එම තනතුරට පත්වීම සඳහා ඔහුට සුදුසුකම් ප්‍රමාණවත්ද?

ඇ. එම විද්‍යාලයේ 10 වන වසරේ පන්ති කොපමණ ප්‍රමාණයක් පවතින්නේද?

ඈ. එම 10 වන වසරේ එක් එක් පන්තිවල දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. i. විජය සත්‍යජිත් කුලරත්න මහතා

ii. ප්‍රමාණවත්ය. විදුහල්පති I ශ්‍රේණිධාරියෙකි. (2008 සිට)

ඇ. පන්ති 06 යි.

ඈ.

| | | |
|---|---|---|
| 10 A | - | 51 |
| 10 B | - | 37 |
| 10 C | - | 51 |
| 10 D | - | 48 |
| 10 E | - | 49 |
| 10 F | - | 53 |
| | | 289 ÷6 |
| | | 48 - මධ්‍ය අගය |

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න අංක 01. ඔබතුමාට මතකයක් තිබෙනවාද? අමාත්‍යාංශයේදී මෙම විද්‍යාලයට ළමයෙකු ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මම පැමිණි බව. ඔබතුමාට මතකයක් තිබෙනවාද? ප්‍රශ්න අංක 01 ඒක.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සුනිල් වටගල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලින් අහපු ප්‍රශ්නයට අදාළව ප්‍රශ්න අහන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ප්‍රශ්න අංක 03 "ඈ" පිළිතුර සම්බන්ධයෙනුයි මේ අතුරු ප්‍රශ්නය නඟන්නේ. මෙම විද්‍යාලට ළමයෙකු ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මම ගරු අධ්‍යාපන ඇමැතිතුමාව හම්බ වුණා. ඔබට මතකයක් තිබෙනවාද? ප්‍රශ්න අංක 02, එම අවස්ථාවේදී මෙතුමා ඇත්ත වශයෙන්ම ඒ අවශ්‍යතාවය සලකලා මෙම විද්‍යාලයට - මොකද, 10 වැනි ශ්‍රේණියට ළමයෙකු ඇතුළත් කිරීමේදී පදිංචිය - ඒ තැනැත්තාව ගංවතුරට අහුවෙලා සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගිහිල්ලා තිබුණා. ඒ අනුව එම පවුල පදිංචියට ඔය පාසල ආසන්නයේ ස්ථානයකට ගියා. ඒ අවශ්‍යතාවය පදනම් කරගෙන තමයි ගරු සභාපතිතුමනි, ඒ ඉල්ලීම කළේ. ගරු අධ්‍යාපන ඇමැතිතුමා ඒ අවශ්‍යතාවය පිළිගෙන එම ළමයාව විද්‍යාලයට ගැනීමට අදාළ නිර්දේශය කරන්නය කියලා අදාළ නිලධාරීන්ට කිව්වා. එතකොට ගරු ඇමැතිතුමනි, 49 සීමාව තුළ ඇතුළත් කරන්න කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න තුනක් අහන්න. එතකොට ගරු ඇමැතිතුමා උත්තර දෙයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දෙවැනි ප්‍රශ්නය. 49 සීමාව තුළ ඇතුළත් කිරීමට අදාළ නිර්දේශයක් කරලා තිබෙනවා. ඔබතුමා ඒක පිළිගන්නවාද? මා ළඟ කොළේ තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම හැබැයි ඒ පත්‍රිකාව දැක්කේ නැහැ. හැබැයි ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට කන් දීමක් හැටියට ඒකට අවශ්‍ය උපකාර කරන්න කියලා කිව්වා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, අවසන් ප්‍රශ්නය. ගරු ඇමැතිතුමා අදාළ නිර්දේශය අදාළ නිලධාරීන්ට යොමු කරලා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට මම මේ ලිපිය අරගෙන ගියාට පස්සේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කිව්වා, කළිසම ඇඳගෙන මට මේක අත්සන් කරන්න බැහැයි කියලා. කළිසම ඇඳගෙන. මම අද අහනවා, කළිසම ඇඳගෙන ද දැන් මේ ශ්‍රේණිවල - ශ්‍රේණි දෙකක ඇරෙන්න හැම ශ්‍රේණියකම ළමයි 49 ට වඩා වැඩියි. ළමයින් 51 ඉන්නවා. 53 ඉන්නවා. එතකොට ගරු සභාපතිතුමනි, ගංවතුරට අහුවෙලා සම්පූර්ණයෙන් නිවස විනාශ වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධයෙන් මෙතුමා දැන් උත්තරයක් දෙයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඊට අදාළව ගරු සභාපතිතුමනි, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දුරකථනයෙන් විමසලා විදුහල්පතිවරයාව එතැනට ගෙන්නුවා. ගෙන්නුවාම කිව්වා, 49 සීමාව එක පන්තියකවත් නැහැයි කියලා. දැන් කියනවා, 51, 53 ඉන්නවා කියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු මන්ත්‍රීතුමා, මොකක්ද පාසල.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හේනේගම මධ්‍ය මහ විද්‍යාලය. ගම්පහ දිස්ත්‍රික්කයේ. දැන් කියනවා, 51 ක් ඉන්නවා කියලා. ඒක යම් යම් අවශ්‍යතාවයන් - මෙතුමාගේ වරදක් නොවෙයි මම මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් හරි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මම ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් අහනවා. මේ දරුවාට සාධාරණයක් කරනවාද? කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා සාධාරණයක් කරයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, නිවැරැදි කිරීම් එකක් දෙකක් කරන්න වෙනවා. පළමුවැනි එක ගරු මන්ත්‍රීතුමා විමසනකොට හිටියේ කුමන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

වත්මන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ශ්‍රී ලාල් නෝනිස් මහත්මයාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. ශ්‍රී ලාල් නෝනිස් මහත්මයා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්. හැබැයි, මේකේ පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු මන්ත්‍රීතුමා, කීයේ පන්තියටද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

10 වැනි වසරේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

10 වැනි වසරේ. මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට උත්තර දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. සමාවෙන්න. ගරු ඇමැතිතුමා ඉන්නවා නේ? ප්‍රශ්නය ගරු ඇමැතිතුමාගෙන් අහන්නේ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මගේ ආසනය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආසනය වුණාට කමක් නැහැ, මෙතැන අධ්‍යාපන ඇමැතිතුමා සභාවේ ඉන්නවා නේ? විෂයය භාර ඇමැතිවරයා ඉන්නවා. සමාවෙන්න. විෂයය භාර ඇමැතිවරයා ඉන්නවා. එතුමා උත්තර දෙයි. අධ්‍යක්ෂතුමා ඉතින් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අධීක්ෂණ මන්ත්‍රී.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නැහැ. එහෙම නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා පැහැදිලි උත්තරයක් දීලා, ඔබතුමා ඉවරයක් කරන්න. අනවශ්‍ය ඒවාට යන්න ඕනෑ නැහැ. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට පිළිතුරු -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මෙතුමා බොරු කියන්නේ ඒකයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සමස්ත -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොරු නොවෙයි. එතුමා ලේඛන පෙන්නුවා නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මොකක්ද?

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවෙයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අනේ මේ කෑ නොගහා ඉන්නවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මගේ ආසනේ ඔබතුමා කොහොමද දන්නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තමුන්නාන්සේගේ ආසනේ තමුන්නාන්සේ මොනවද දන්නේ?

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා හිටියේ නැහැ. හිටපු -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ණයට කහින්නේ නැතිව ඉන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

හිටපු එක්කෙනා ඉන්න කාලයේ ඒවා දැම්මේ. දැන් කොච්චර කල්ද? මෙතුමා එතකොට ඇමැතිත් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා. එතුමා අහපු ප්‍රශ්නයට ඇමැතිතුමා උත්තරයක් දෙයි. එතකොට ඉවරයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සීනි කිරන්නේ නැතිව යන්න. මෙතැන අනුන්ට සීනි කිරන්න එනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් අහන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

රීති දන්නේ නැතිව. අනේ නිකන් සද්ද නැතිව ඉන්න. නිකන් සීනි කිරන්න එනවා මෙතැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා උත්තරයක් දෙන්න කෝ. ප්‍රශ්නය ඉවර නේ. පටන් ගත්තා විතරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොළඹ ඉඳලා ගම්පහට සීනි කිරන්නේ ඔබතුමා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඔබතුමා කොළඹ දිස්ත්‍රික්කයේ. අපේ ආසනය ඒක.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඉස්කෝල වත්තේ ගස් කපන කොට කොහෙද හිටියේ? මෙතැන ගොට්ට අල්ලන්න එනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එතුමාගේ ඉල්ලීමට කන් දීලා, ඒ වගකීම අපි ඉෂ්ට කරනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා හිටියෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ඔබතුමාගේ ප්‍රශ්නය හරි නේ? දැන් වාඩි වෙන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

උත්තරේ මොකක්ද? ඇහුණේ නැහැ. පොඩ්ඩක් කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න කෝ. උත්තර දෙයි. සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොළඹ සීනි නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබෙනවා, පළාත් සභාව තුළ ප්‍රශ්නයක් අහන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙරිල් ගරු මන්ත්‍රීතුමා, එතුමා බස්නාහිර පළාත් සභා මන්ත්‍රී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගම්පහද? කොළඹද? කියලා ප්‍රශ්නයක් නැහැ, මන්ත්‍රීවරයෙකුට. ඕනෑම මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබෙනවා, පළාත් සභාව තුළ ප්‍රශ්නයක් අහන්න. ඒක ගම්පහද? කළුතරද? කොළඹද? කියලා එකක් නැහැ. එතුමාට අයිතියක් තිබෙනවා. එතුමාට අහන්න පුළුවන්. එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගෙන් අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පස්වාන් දහසකට බුදු වෙන්න. මගේ වරදක් නොවෙයි. සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එතුමා දැන් අහන්නේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම යළිත් ගරු මන්ත්‍රීතුමාට කරන කන්දීමක්, සැලකීමක් හැටියට මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා අවශ්‍ය කාරණා ඉෂ්ට කර දෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු ඇමැතිතුමා අපෙත් 30 ක් ඉන්නවා, ඒ සීමාවට දාන්න. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා අපෙත් 30 ක් ඉන්නවා. ඒවත් දාලා දෙන්න කියන්න ඕනෑ. ඔබතුමාගෙයි, අපෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සභාව යන්නේ රීතියක් යටතේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මෙතුමා කියනවා, ඒ වැඩේ කරනවා කියලා. එතකොට අධ්‍යක්ෂතුමා කළිසම ගලෝද්ද අත්සන් කරන්නේ? එතකොට එතුමා කිව්වා නේ කළිසම ගලවන්න වෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ ප්‍රකාශය කළේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ෆයිල් පිටින් දාගත්තේ ඔබතුමන්ලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ අපේ ප්‍රශ්න නේ? මේකට අදාළ ඇමැතිවරයා මම. ඔබතුමා පාලනය කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පාලනය කළා. ඔබතුමා උත්තරයක් දෙන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම උත්තර දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ...එහෙනම් එච්චරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉක්මණට කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මාර්ගයෙන් අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි. අධ්‍යාපනය සම්බන්ධයෙන් අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා ඉන්නවාද කියලා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්. ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම ප්‍රශ්න අහන්න බැහැ. 36(1) ට ඕවා අදාළ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අදාළයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ආණ්ඩු පක්ෂයෙන් පත් කරලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපිත් ඉන්නවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඇහුවේ අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා ඉන්නවාද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පත් කරලා ඉන්නවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒවා දැන් අවලංගුයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නැහැ, නැහැ. අවලංගු නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් නව මහ ඇමැති කෙනෙක් ඉන්නේ. ඇමැතිතුමාට උත්තරයක් දෙන්න කියන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒවා අවලංගු නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම උත්තරයක් දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට අපේ වරප්‍රසාද කඩ කරන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒවා අවලංගු නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක අපේ වරප්‍රසාදයක්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට වැඩ කරනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඒක නවත්වන්න බැහැ. අපට පිළිතුරක් ඕනෑ, අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලාද? නැද්ද? කියලා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු මන්ත්‍රීතුමා ඕක දිගට ගෙනි යන්න ඕනෑ නැහැ. මම ඕකට උත්තරයක් දෙන්නම්. මේ පිළිබඳව හිටපු මහාමාත්‍යවරයෙකු වන සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ලිපි නිකුත් කරලා, අධ්‍යාපන අධීක්ෂණ කියලා මන්ත්‍රීවරුන්ව පත් කළා. ඒක අවලංගු කරලා කාටවක්වත් ලියුමක් ඇරලා නැහැ. ඒක තවම වලංගුයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, මහ ඇමැතිතුමා වෙලා හිටපු කාලේ ආදී කාලේ. අවුරුදු පහෙන් ඒක ඉවරයි. ප්‍රසන්න ඇමැතිතුමාගේ කාලයේ පත් කරපු අය දැන් ඒ තනතුරේ ඉන්න බැහැ. අලුත් මහ ඇමැතිතුමා එහෙමනම් ඒකට පත් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ඔබතුමාත් වාඩි වෙන්න. මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්නම්. වාඩි වෙන්න කෝ. අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා කිව්වා, සුසිල් ප්‍රේමජයන්ත ගරු ඇමැතිතුමාගේ කාලයේ පත් කළා කියලා. අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කළා. ඊට පස්සේ එහෙම නම් කරලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, මම ගරු ඇමැතිතුමාගෙන් අහන්නේ. ගරු ඇමැතිතුමාට උත්තරයක් දෙන්න කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. මම දැන් අහන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා පත් කළේ දෙවැනි පළාත් සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පත් කරලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පත් කරලා නැහැ. ගරු ඇමැතිතුමා අපට පිළිතුරක් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පත් කරලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා පිළිතුරට එකඟයිද? ඇමැතිතුමා, (බාධා කිරීමක්) මෙතුමා කියනවා නේ පත් කරලා ඉන්නවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා කියනවා පත් කරලා ඉන්නවා කියලා. ඇමැතිතුමා දැන් කිව්වා, පත් කරලා ඉන්නවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කියන්නේ කොහොමද නැහැයි කියලා. එතුමා පත් කරලා ඉන්නවා කියන කොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඞ්ඩක් වාඩි වෙන්න කෝ. මහත්මයෙක් වාගේ වාඩි වෙන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම දැනගන්න කැමැතියි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්න ඇද ගන්වා නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට ඕනෑද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න කෝ. එක එක ප්‍රශ්න අහන්නේ නැතිව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධ්‍යාපන ඇමැතිතුමා කවුද කියලා අපි දැනගන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දූකට කෑ ගහන්නේ. හෙට අනිද්දා සංවිධායකකමත් නැති වෙනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි සාධාරණ ප්‍රශ්නයක් අහපුවාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ප්‍රශ්නය වහන්න හදනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තේරුම් ගන්න කෝ? ඔබතුමා බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බුද්ධිමත් තමයි. ඒක තමයි මම අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, ඇමැතිවරයා වෙනුවට ඔබතුමාට උත්තර දෙන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිවරයාගෙන් ඔබතුමාට ප්‍රශ්න අහන්නත් බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමැතිවරයෙක් ඉන්නවා නේ? ඇමැතිතුමාට උත්තර දෙන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්න අහන්නේ මූලාසනයෙන්. ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්න ඇමැතිතුමාගෙන් අහන්න බැහැ. ඇමැතිවරයෙකුගෙන් ඔබතුමාට ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ප්‍රශ්න ඇහුවේ ඇමැතිතුමාගෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න මගෙන් අහන්න. මේ සභාවේ ඔබතුමාට ඕනෑ විධියට ප්‍රශ්න අහන්න බැහැ. වරප්‍රසාද ප්‍රශ්න සභාපතිවරයාගෙන් අහන්නේ. ඇමැතිවරයාගෙන් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගේ මාර්ගයෙන් තමයි මම ඇමැතිවරයාට යොමු කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. උත්තරයක් දෙන්නම්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මම අධ්‍යාපන ගරු ඇමැතිතුමාට ස්තූතිවන්ත වෙනවා, මාව ඊයේ අධීක්ෂණ මන්ත්‍රීට පත් කරපු එක ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බුද්ධිමත්ව ඔබතුමා හැසිරෙන්න. උදේ පාන්දරම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ කාලයේ උත්තරයක් නේ දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ගරු ඇමැතිතුමාගෙන් අහනවා, ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට උත්තරයක් දෙන්න පුළුවන්ද? හැබැයි, මගේ අවසරය පිට දෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගේ අවසරය මත එතුමා විසින් රීති ප්‍රකාරව ඊළඟ ප්‍රශ්නාවලියට මේ ප්‍රශ්නය ඉදිරිපත් කළොත් මම ඊළඟ සභා වාරයේ පිළිතුරු දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හතරවැනි ප්‍රශ්නය. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව. එතුමා නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/86)**

*ප්‍රශ්නය :*

*අ. බස්නාහිර පළාත තුළ ගුරු ස්ථාන මාරු සිදුවන්නේ "ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට" අනුවද?*

*පිළිතුර:*

*අ. ඔව්*

*ප්‍රශ්නය :*

*ආ. එම ස්ථාන මාරු විධිමත්ව හා විනිවිධභාවයෙන් සිදු කරන බවට තහවුරු කරන්නේද?*

*පිළිතුර:*

*ආ. ඔව්*

*ප්‍රශ්නය :*

*ඇ. බස්නාහිර පළාත තුළ හා කලාප තුළ ගුරු ස්ථාන මාරුවීම් සිදු කිරීමේ බලතල පවරා ඇත්තේ කාටද?*

***පිළිතුර:***

*ඈ. බස්නාහිර පළාත තුළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා අධ්‍යාපන කලාපය තුළ අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත බලතල පවරා ඇත.*

***ප්‍රශ්නය :***

*ඈ. ඒ අනුව නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට ස්ථාන මාරු කිරීමේ බලතල හිමි වන්නේ කෙසේද?*

***පිළිතුර:***

*ඈ. ඇතැම් විශේෂ අවස්ථාවල අධ්‍යක්ෂගේ අනුමැතිය යටතේ නියොජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) වෙත බලය පවරනු ලැබේ.*

***ප්‍රශ්නය :***

*ඉ. පිළියන්දල අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරිය තම බලතල අභිබවා ස්ථාන මාරුවීම් සිදු කරමින් ඇති බව ඔබ දන්නෙහිද?*

***පිළිතුර:***

*ඉ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ වාර්තාව අනුව එවැනි ස්ථාන මාරු වීම් සිදු කළ බවට වාර්තා වී නොමැත.*

***ප්‍රශ්නය :***

*ඊ. මෙබඳු ක්‍රියා සම්බන්ධයෙන් ඔබ ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?*

***පිළිතුර:***

*ඊ. නිලධාරීන් තම බලතල අභිබවා කටයුතු සිදු කර ඇත්නම් එවැනි අවස්ථාවලදී ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගනු ලැබේ.*

## 05.

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/87)**

අ. 2016.09.08 සහ 2016.09.09 යන දියන් හි ඔබ අමාත්‍යාංශය මගින් හෝමාගම විල්ප්‍රඩ් සේනානායක ක්‍රීඩාංගණයේදී ප්‍රදර්ශනයක් පවත්වන ලද්දේද? එම ප්‍රදර්ශනයට සහභාගි වූ ආරාධිතයන් කවුරුන්ද?

ආ. එම ප්‍රදර්ශනයට ප්‍රචාරක කටයුතු සඳහා වැය වූ මුදල් ප්‍රමාණය කොපමණද?

ඇ. එම ප්‍රදර්ශනයට වැය වූ සමස්ත මුදල් ප්‍රමාණය කොපමණද?

ඈ. කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වෙළඳ කුටි කීයක් එම ප්‍රදර්ශනයේදී පිහිටුවා තිබුණේද?

ඉ. එම වෙළඳකුටිවල පැළ වර්ග කොපමණ ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන ලද්දේද? එම පැළ වර්ග අලෙවි කිරීමෙන් ලද ආදායම කොපමණද?

ඊ. අලෙවි කිරීම සඳහා එම පැළ වර්ග ලබා ගන්නා ලද්දේ කුමන පුද්ගලයෙකුගෙන් හා /හෝ කුමන ආයතනයකින්ද?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

අ. ඔව්.

**කෘෂිකර්ම හා සත්ව පාලන ප්‍රදර්ශනය සඳහා සහභාගි වූ ආරාධිත අමුත්තන්**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
2. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවර කේ.සී. ලෝගේෂ්වරන් මැතිතුමා,
3. බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා,
4. බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ගරු අමාත්‍ය ගාමිණී තිලකසිරි මැතිතුමා,
5. බස්නාහිර පළාත් ගරු ප්‍රවාහන හා සමුපකාර ගරු අමාත්‍ය ලලිත් වනිගරත්න මැතිතුමා,

6. බස්නාහිර පළාත් සභාවේ ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමා,
7. බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් (හෙක්ටර් බෙත්මගේ මැතිතුමා, ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා, සුමිත් විජයමුණි ද සොයිසා මැතිතුමා, පී.ඩී. අබේරත්න මැතිතුමා සහ කිත්සිරි කහටපිටිය මැතිතිතුමා.)
8. හිටපු පළාත් සභා මන්ත්‍රී ගරු ගාමිණී සිල්වා මැතිතුමා,
9. හෝමාගම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය,
10. හෝමාගම සමූපකාර සංගමයේ සභාපතිතුමා,
11. බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්තුමිය හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නිලධාරීන්,
12. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන්,
13. කෘෂිකර්ම අමාත්‍යාංශයීය මාණ්ඩලික නිලධාරින්,
14. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්,
15. වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්,
16. ඉඩම් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්,
17. කෘෂිසේවා අධිකාරියේ සභාපතිතුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන්,
18. විදුහල්පතිවරුන්,
19. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන්

ආ. මුළු වියදම - 80820.00

ඇ. මුළු වියදම - රු.4,029,360.00

ඈ. තාක්ෂණික තොරතුරු ප්‍රදර්ශනය සඳහා කුටිබ-18

කෘෂි ව්‍යවසායකයින් සඳහා - 05

එකතුව - 23

ඉ. ඇමුණුම 02 මගින් දක්වා ඇත. රු. 64250.00

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළ**
**අලෙවිසැල් පිළිබඳ විස්තර**

ඇමුණුම 02

| අංකය | පැළ වර්ගය | ප්‍රමාණය | ඒකක මිල රුපියල් | මුළු ගණන රු. |
|---|---|---|---|---|
| 1 | බද්ධ පැළ | 20 | 180 | 3600.00 |
| 2 | දෙළුම් බීජ පැළ | 30 | 50 | 1500.00 |
| 3 | ජම්බු අතු පැළ | 12 | 75 | 900.00 |
| 4 | ජම්බු බද්ධ පැළ | 15 | 135 | 2025.00 |
| 5 | බද්ධ පේර පැළ | 19 | 135 | 2565.00 |
| 6 | බද්ධ දොඩම් පැළ | 40 | 180 | 7200.00 |
| 7 | බද්ධ කොස් පැළ | 74 | 180 | 13320.00 |
| 8 | බද්ධ අලිපේර පැළ | 05 | 135 | 675.00 |
| 9 | බද්ධ නාරං පැළ | 47 | 180 | 8460.00 |
| 10 | බද්ධ අනෝදා පැළ | 11 | 135 | 1485.00 |
| 11 | අනෝදා බීජ පැළ | 10 | 40 | 400.00 |
| 12 | බද්ධ රඹුටන් පැළ | 40 | 180 | 7200.00 |
| 13 | බීජ උගුරැස්ස පැළ | 15 | 30 | 450.00 |
| 14 | බීජ චීන පේර පැළ | 20 | 50 | 1000.00 |
| 15 | බීජ ලොවි පැළ | 13 | 30 | 390.00 |
| 16 | ලෙමන් අතු පැළ | 70 | 75 | 5250.00 |
| 17 | බද්ධ සැපතිල්ලා පැළ | 21 | 135 | 2835.00 |
| 18 | බද්ධ බෙලි පැළ | 34 | 135 | 4590.00 |
| 19 | බද්ද දෙහි පැළ | 03 | 135 | 405.00 |
| | **එකතුව** | | | **64250.00** |

ඊ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අලෙවි සැල සඳහා පැළ ලබා ගන්නා ලද්දේ මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපලවල් වලිනි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඇමුණුම පරිශීලනය කිරීමෙන් අනතුරුව අතුරු ප්‍රශ්න වෙනත් අවස්ථාවකදී යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව දෙන්න පුළුවන්.

**06.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/88)**

අ. කොළඹ අධ්‍යාපන කලාප බල ප්‍රදේශයට අයත් ක්ලිෆ්ටන් බාලිකා විද්‍යාලය නමින් විද්‍යාලයක් පවතින්නේද?

ආ. එම විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන්නන් මේ දිනවල තාවකාලික මඩුවල අධ්‍යාපනය හදාරණ බව ඔබතුමා පිළිගන්නේද?

ඇ. එසේ සිදු වී ඇත්තේ යාබද ඉඩමක තට්ටු නිවාසයක් ඉදි කරීමට යාමේදී නිසි සැලකිල්ලකින් තොරව ඉදි කරන නීති විරෝධී ගොඩනැගිල්ලක් නිසා ඔබ ඔබතුමා පිළිගන්නේද?

ඇ. එම ගැටලුවලට අදාළව පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. තාවකාලික මඩු ගසා නැත. එම ගොඩනැගිල්ලේ තිබූ පන්ති කාමර, ගෘහ විද්‍යාගාරය, ගණිතාගාරය, ප්‍රධාන ශාලාව, ගුරු විවේකාගාරය හා ප්‍රාථමික කොරිඩෝවේ පන්ති පවත්වාගෙන යයි.

ඇ. නීති විරෝධී ගොඩනැගිල්ලක් බව නිශ්චිතව කිව නොහැක.

ඇ. මේ පිළිබඳව දැනට වාර්තාවක් සකස් වෙමින් පවතින බැවින් ඉදිරි සභා වාරයේදී ලබා දීමට බලාපොරොත්තු වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හත්වැනි ප්‍රශ්නය. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

# නොපැමිණ සිටීමේ අවසරය
# LEAVE OF ABSENCE

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"සමන්මලී සකළසූරිය ගරු මන්ත්‍රීතුමියට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
# MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, ගිය පළාත් සභා රැස්වීමේදී සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර.

ජාතික ගමනා ගමන කොමිෂන් සභාව මගින් බස්නාහිර පළාතේ කොළඹ නගරයේ බැස්ටියන් මාවත පර්යන්තයට අදාළ බස් රථ සඳහා පමණක් මෙම තීරණය ගෙන ඇත. බස්නාහිර පළාතේ වෙනත් ප්‍රධාන බස් නැවතුම් ස්ථානවලින් ද අන්තර් පළාත් බස් රථ ගමන් කරන අතර, එම ස්ථානවල ආදායම් රැස් කිරීමේ කටයුතු බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් සිදු කරනු ඇත.

රටෙහි සමස්ත මගී ප්‍රවාහන සේවාවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ බැස්ටියන් මාවත බස් නැවතුම් ස්ථානයෙනි. එබැවින් ජාතික ගමනා ගමන කොමිෂන් සභාව බැස්ටියන් මාවත පර්යන්තයේ මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීමේ අරමුණින් මෙසේ පවරා ගැනීම සිදු කර ඇත.

[ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා ]

අනිකුත් පළාත් සභා යටතේ ක්‍රියාත්මක මගී ප්‍රවාහන සේවාවන් ප්‍රමාණය මෙම පළාතට සාපේක්ෂව අවම මට්ටමක පවතින බැවින් ජාතික ගමනා ගමන කොමිෂන් සභාව එම පළාත් සභා යටතේ පවතින සේවාවන් විධිමත් කිරීමේ ක්‍රියාවලියට මැදිහත් වී නොමැති බව පෙනී යයි.

මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් අනුව බැස්ටියන් මාවත බස් නැවතුම්පොළ පවරා ගැනීමේ බලතල ජාතික ගමනා ගමන කොමිෂන් සභාවට ලැබී ඇත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගේ පිළිතුර සභාගත කරනවා නම් මේ පිළිබඳව තවදුරටත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මම ඊළඟ සභා වාරයේදී අහන්නම්.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

සභාගත කරනවා.[1]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය සතියක දවසක වත්තල නගර සභාවේ තිබුණු රැස්වීමකදී මට පොඩි ප්‍රශ්නයක් මතු වුණා. ඒ ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම එල්ල වුණේ, වත්තල විවිධ සේවා සමූපකාර සමිතියේ කාලසීමාව අවසන් වෙලා නැවත සභිකයන් පත් කරගන්න නාමයෝජනා කැඳෙව්වා. මීට කාලයකට ඉස්සෙල්ලා. දැන් ඒ නාම යෝජනා කැඳවපු අවස්ථාවේදී යම් ස්ථානයක සිද්ධියක් වුණා කියලා - ඒක තමයි පදනම් වුණේ. ගරු ඇමැතිතුමාගේ නියෝගය පරිදි මේ නිල වරණය පවත්වන දිනය කල් දැම්මා. ඊට පස්සේ මේ සභාවේදී මේ පිළිබඳව අහපුවාම බොහොම පැහැදිලි උත්තරයක් දුන්නා, මාස දෙකක් ඇතුළත මේ නිලවරණය පවත්වනවාය කියලා. ඒ අතරතුරේ හිටපු සභාපතිවරයාගේ බලය අයින් කරලා වෙනත් පුද්ගලයෙක්ව සභාපති තනතුරට දැම්මා. දැන් ආයෙත් කොහොම හරි නීතිමය ප්‍රශ්නයක් මතු වෙලා හිටපු සභාපතිවරයාත් ආයේ ඉන්නවා. අර සභාපතිවරයාත් ඉන්නවාද නැද්ද කියලා මම දන්නේ නැහැ. දැන් කොහොම වුණත් දැන් තිබෙන ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් පොඩ්ඩක් මට කියන්න. සමූපකාර ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ ප්‍රශ්නය එන්නේ මට. ඒකයි මම මේ කිව්වේ. එදා, ඇයි මේ නිලවරණය පවත්වන්නේ නැත්තේ කියලා සමූපකාර සමාජිකයන් බොහොම දරුණු උද්ඝෝෂණයක් කෙරුවා. ඉතින් ඒක නිසා මම ගරු ඇමැතිතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, දැන් සමූපකාර ඡන්ද පවත්වන කොට, ඒක පාර්ශවයක් දිගින් දිගටම ජයග්‍රහණය කරනවා කියලා උදම් ඇනීමක් තිබෙනවා. මම හිතන්නේ නැහැ වත්තල ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා කියලා. ඒක නිසා කරුණාකරලා මේ නිලවරණයට නාම යෝජනාත් කැඳවලා තිබෙන නිසා පුළුවන්තරම් ඉක්මණින් මේ සමූපකාර ඡන්දය පවත්වනවාද? පවත්වන්නේ කවදාද? කියන එක පිළිබඳව ගරු ඇමැතිතුමාගෙන් ඇත්ත වශයෙන්ම දැන ගැනීමට අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උත්තරයක් දෙන්න ලැහැස්තිද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඔව්. ගරු සභාපතිතුමනි, වත්තල විවිධ සේවා සමූපකාර සමිතියේ පසුගිය ඡන්ද තිබෙන අවස්ථාවේදී යම් ප්‍රශ්නයක් ඇති වුණා. ආරක්ෂක හේතුන් මත ඡන්දය කල් දැම්මා. මම හිතන්නේ, බොහොම හැකි ඉක්මණින්ම ඡන්දය පවත්වන්න අපි දැන් සූදානම් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි නේද? අපි නැවත වරක් න්‍යාය පත්‍රයට යනවා. අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ ඇමැතිවරු තවත් ප්‍රකාශ කරනවාද?

[1] පිළිතුර ඉහතින් සඳහන් වේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට මගේ යුතුකමක්, ඒ වාගේම වගකීමක් තිබෙනවා. බස්නාහිර පළාත 42 වන ජාතික ක්‍රීඩා උළෙලේදී ලැබූ සුවිශේෂ අතිවිශිෂ්ට ජයග්‍රහණය සඳහා ගරු සභාපතිතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අපේ ගරු මැති ඇමැතිතුමන්ලා, සභාවක් හැටියට මුළු සභාවේම අපේ ගෞරවය සහ ස්තුතිය, කෘතවේදීත්වය මේ ජයග්‍රහණය සඳහා පිරිනමන්න. ඒ නිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට 42 වැනි ජාතික ක්‍රීඩා උළෙල රන් පදක්කම් 113 ක්, රිදී පදක්කම් 74 ක් හා ලෝකඩ පදක්කම් 67 ක් හැටියට පදක්කම් 254 කින් බස්නාහිර පළාත රනින් සරසන්නට, රිදියෙන් සරසන්නට, පදක්කම්වලින් බබළන්නට බස්නාහිර පළාතේ අපේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වූ බව ඉතාම සතුටින් ගරු සභාපතිතුමා මගින් මේ සභාවට මතක් කර සිටින්න ඕනෑ. මේ ජයග්‍රහණය තුළ අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මීට පෙර පැවැති ජාතික ක්‍රීඩා උළෙලවල් 40 කදීම අපට උපරිම ලබන්නට පුළුවන්කම ලැබුණේ - 2015 රන් පදක්කම් 77 ක් පමණයි. මේ අවස්ථාවේදී ජාතික ක්‍රීඩා උළෙලදී අපි සුවිශේෂ ජයග්‍රහණ දෙක තුනක් අත්පත් කර ගත්තා. එක පැත්තකින් නව ශ්‍රී ලංකා වාර්තාවන් දෙකක් බිහි කළා. යගුලිය විසි කිරීම සම්බන්ධව ඩබ්ලිව්.ටී.කේ. ප්‍රනාන්දු ක්‍රීඩිකාව, කළුතර දිස්ත්‍රික්කය හැටියට. ඒ වාගේම රිටි පැනීම සම්බන්ධව එම්.එච්.අයි. සඳරුවන් ක්‍රීඩකයා, ගම්පහ දිස්ත්‍රික්කය. ඒ වාගේම ජාතික මලල ක්‍රීඩා ශූරතාවය බස්නාහිර පළාතට ලැබුණේ.

ගරු සභාපතිතුමනි, මේ කාරණාවලදී මම එකක් කියන්න ඕනෑ. මේ සියලුම දේවල්වල රහස සැඟ වී තිබෙන්නේ අපේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ඉන්න ක්‍රීඩා ඇමැතිවරයාගේ හපන්කම තුළ නොවෙයි. මම ඒක නිහතමානීව කියන්න ඕනෑ. මම පියෙක් වගේ මේ ගැන සතුටු වෙන්නේ. ඔබ හැමෝම පියවරු. මේ ජයග්‍රහණයේ ගෞරවය මට ඕනෑකම තිබෙන්නේ, මේ පදක්කම් මෙතැනට ගෙන එන්න කැප වුණු, වෙහෙස මහන්සි වුණ, ඒ සඳහා මගේ නායකත්වය තුළ කටයුතු කරපු මගේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා, ඒ වාගේම විවිධ බාධක කම්කටොළු මැද මේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හැසිර වූ අපේ ක්‍රීඩා අධ්‍යක්ෂ රත්නායක මැතිතුමා, ඒ වාගේම දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන්, ප්‍රාදේශීය වශයෙන් එන ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන්, ඔවුන්ගේ ඉතාම සුවිශාල කැප කිරීම තුළ තමයි ජයග්‍රහණයේ හිනි පෙත්තට අපට ගොඩනඟින්න පුළුවන්කම ලැබුණේ. මේ දරුවෝ, අපි මේ සියලු දෙනා අද සතුටු වෙන්නේ. මේ ගම් මට්ටමේ පිපිණු ලස්සන මල් වාගේ. කැළේ පිපුණු මල් කැළේට පරවෙන්නට නොදී මේ දිස්ත්‍රික්ක තුනේම මේ හැකියාවන් තිබෙන, මේ දක්ෂතාවයන් තිබෙන දරුවෝ අද ජාතික මහා ක්‍රීඩා උළෙලේ බස්නාහිර පළාතට මේ ගෞරවය එකතු කළා. ඒ දරුවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශාල දුෂ්කරතාවයන්, අභියෝග තිබෙනවා. නොයෙකුත් අඩුපාඩුකම් තිබෙනවා. මම ඒක ඇහෙන්ම දැක්කා. මම ඒ හඬට කන් දුන්නා. මේ දරුවන්ගේ තත්ත්වය නිසා විශාල මුදලක් මට ඉදිරියේදී වෙන් කරන්න වෙනවා. ඒ සියලු දරුවන්ට, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සියලු දෙනාට මේ අවස්ථාවේදී ඇමැතිවරයා හැටියට මමත්, සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවත්, අපේ ගෞරවය පිරිනමනවා.

ඒ වාගේම සංහිඳියාව ගොඩනැගෙන හෝරාවක තමයි මේ උත්සවය අපි පැවැත් වූයේ. ඉතිහාසයේ පළමුවැනි වතාවට යාපනයේ ජාතික ක්‍රීඩා උළෙලක් පවත්වලා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත මේ ලැබුවා වූ පදක්කම්වලට වඩා එහා ගිය විශිෂ්ට ජයග්‍රහණයක් අපි ලැබුවා. ඒ බැඳීම, ඒ සහෝදරත්වය, ඒ මිත්‍රත්වය ඒ භූමියේදී අපි ගොඩනැඟුවා. මේ සඳහා අපට මඟ පෙන් වූ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට - ඒ වාගේම ජාතික මට්ටමේ දක්ෂ ක්‍රීඩා ඇමැතිවරයෙක් අපට ඉන්නවා. ජාතික ක්‍රීඩා ඇමැතිවරයාට විශේෂයෙන් ස්තුතියක් කරන්න ඕනෑ. ගරු දයාසිරි ජයසේකර මැතිතුමාටත් මේ සඳහා විශේෂ ස්තුතියක් කරනවා. ගරු සභාපතිතුමනි, මේ ප්‍රකාශය කරන්න ඉඩ ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ පසුගිය දිනක හදිසියේ මම බලය වැඩ සටහන බලාගෙන සිටියා. ඒකට සහභාගි වුණු මන්ත්‍රීවරු අතරේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්න මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ඒ වැඩ සටහනට සම්බන්ධ වුණා. ඒ වැඩ සටහන යන අතරේ පළාත් සභාව සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් ඇහුවා. මම ඒක හොඳට පරීක්ෂා කළාම එතුමාගේ මුහුණෙන් දිස් වුණේ -

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

එතුමාගෙන් ඒ අහපු ප්‍රශ්නවලට උත්තර දෙන්න එතුමාට අවබෝධයක් තිබුණේ නැහැ. එතුමා ඒකට ප්‍රතිඋත්තරය දුන්නේ, මේ බස්නාහිර පළාත් සභාව අකාර්යක්ෂමයි කියලා. ගරු සභාපතිතුමනි, මම පිළිගන්නේ නැහැ - මම දන්නවා මේ වන කොට ඇතැම් පළාත් සභාවල්වලට වැඩ කරගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. නමුත් අපි එහෙම කරලා නැහැ. අපි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් කිව්වත්, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වත්, වෙන පක්ෂයක මන්ත්‍රීවරයෙක් කිව්වත්, මට ඇවිල්ලා මොකක් හරි කිව්වොත් මම ඒක කරන්න කවදාවක්වත් පසුබට වෙන්නෙත් නැහැ. නොකර ඉන්නෙත් නැහැ. ඔබතුමා දන්නවා. ඉතින් ඒ නිසා මම කනගාටු වෙනවා. මොකද, මමම දැකපු නිසා මම මේ කියන්නේ. වගකිවයුතු මන්ත්‍රීවරුන්ට. ඒ වැඩ සටහන මෙහෙය වන අය යම් ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්නේ නැතිව මේ පළාත් සභාව අකාර්යක්ෂම පළාත් සභාවක් හැටියට විවේචනය කරන එක වැරැදියි කියන එක මම මේ වේලාවේදී තමුන්නාන්සේට මතක් කර සිටිනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ගියවරත් ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව කථා කෙරුවා. මොකද, ජා-ඇළ ඔතේකැලේ ඉඩමට කුණු ගේනවා කියලා ලොකු මතයක් තිබුණු නිසා තමයි එක වරක් සියලුම පරිසරවේදීන් සහ ජාති, පාට, පක්ෂ භේද නැතිව සියලුම ජනතාව ඒකරාශි වෙලා විරෝධය පළ කෙරුවා. දෙවැනි වරට ඒකළ ප්‍රදේශයේ විශේෂයෙන්ම වෙළඳ සංගමය සහ ඒ වාගේම ස්වේච්ඡා සංවිධාන ගිය එපිට සුමානයක හවසක අපි සියලුම පක්ෂවල පාර්ලිමේන්තු, පළාත් සභා සහ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, ඒ වාගේම නායකයින්, නායක ස්වාමීන් වහන්සේලා, ගරු පියතුමන්ලා කැඳවලා රැස්වීමක් පැවැත් වූවා. ඒ වේලාවේ සියලුදෙනාම ඉල්ලීමක් කෙරුවේ, කොළඹ නගර සභාවෙන් බැහැර කරන ලද කුණු කසළ ජා-ඇළට ගේන්න එපා කියලයි. ඒක තමයි සියලු දෙනාගේම ඉල්ලීම වුණේ.

ගරු සභාපතිතුමනි, ජා-ඇළ ප්‍රාදේශීය සභාවට මේ වනකොට කොම්පෝස්ට් අංගනයක් තිබෙනවා. 2004 රෙජිනෝල්ඩ් කුරේ ගරු මහ ඇමැතිතුමා මේ පළාත් සභාව තුළ ඉන්න කාලයේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය පිහිටුවලා, ඊට පසු ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාත්, වත්මන් අපේ ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය තුළ ජා-ඇළ ප්‍රාදේශීය සභාවට පමණක් මේ වන විට ලක්ෂ 213 ක් ලබා දීලා තිබෙනවා, මේ කුණු කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියට. එක පැත්තකින් ට්‍රැක්ටර් ලබා දීලා තිබෙනවා. එක පැත්තකින් කොම්පෝස්ට් අංගනය ඉදි කරන්න මුදල් ලබා දීලා තිබෙනවා. තවත් පැත්තකින් කුණු, දිරන කුණු සහ නොදිරන කුණු හැටියට බේරලා ගැනීමට කොම්පොස්ට් ටිං ලබා දීලා තිබෙනවා. මේ වාගේ ලක්ෂ 213 ක් ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම ජා-ඇළ නගර සභාවට ඒ වාගේම තව කොම්පෝස්ට් අංගනයක් පිහිටුවීමට සහ ට්‍රැක්ටර් සහ මේ කොම්පෝස්ට ටිං ලබා දීමේදී ලක්ෂ 89 ක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අද ජා-ඇළ නගර සභාවේ විතරක් දවසකට කුණු ටොන් 15 ක් එකතු වෙනවා. ඒ වාගේම ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ කුණු ටොන් 35 ක් එකතු වෙනවා. මේ කොම්පෝස්ට් අංගන පිහිටෙව්වත් මේ වන විට ජා-ඇළ නගර සභාවට ඒ ටොන් 15 න් ටොන් 05 ක් පමණයි - ටොන් 10 ක් දාන්නේ වෙනත් ඉඩමකට. ඒ වාගේම ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ අද දිරන කුණු සහ නොදිරන කුණු හැටියට බේරලා ගත්තත් ටොන් 25 ක් එකතු වෙනවා. ඒකෙන් ටොන් 15 ක් පමණයි අපේ කොම්පෝස්ට් අංගනයට එන්නේ. ඉතිරි ටොන් 10 දඩුගම දේවාලේ පිටුපස ඉඩමකට බැහැර කරනවා. එහෙම තිබෙන අපේ ජා-ඇළ නගර සභා සීමාවේ තිබෙන කුණුවත් නගර සභාවටවත්, ප්‍රාදේශීය සභාවටවත් පාලනය කරන්න බැරි අවස්ථාවක තමයි මේ කොළඹ නගර සභාවේ කුණු ගේන්න හදන්නේ. ඒ මේ ව්‍යාපෘතිය ජා-ඇළට කියලා, මේකට ලොකු කථාවක් ගිහිල්ලා, මේ උද්ඝෝෂණය පැවැත් වුණා.

එක පැත්තකින් ජා-ඇළ ආසනයේ ඉන්න සියලුම නායක ස්වාමීන් වහන්සේලා, ඒ වාගේම ඒ ප්‍රදේශයේ ඉන්න ගරු පියතුමන්ලා, ඒ වාගේම පාර්ලිමේන්තුව නියෝජනය කරන කාවින්ද ජයවර්ධන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, ඒ වාගේම පළාත් සභාව නියෝජනය කරන මෙතැන ඉන්න ශිරන්ත අමරසේකර, ශ්‍රීනාත් පෙරේරා, මම, ඒ වාගේම

අනිකුත් සියලු ගරු මන්ත්‍රීවරුන් එතැනට පැමිණියා. ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරුන් පැමිණියා. ඒ වාගේම ප්‍රදේශයේ ඉන්න ස්වේච්ඡා සංවිධාන පැමිණියා. ඒ අය සියලු දෙනාම ලියවිල්ලක් අත්සන් කරලා, ප්‍රාදේශීය සභාවට, ලේකම්තුමියට හා ප්‍රාදේශීය ලේකම්තුමාට මේ ලියවිල්ල ගිහිල්ලා භාර දුන්නා. අපි ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට දැනුම් දෙනවා. මේ වන කොට මහාධිකරණයෙන් දැනුම් දීලා තිබෙනවා, ඔක්තෝබර් 13 වැනිදාට කොළඹ නාගරික කොමසාරිස්ට මේ ජා-ඇළ ඒකල ඔතේකැලේ කුණු බැහැර කිරීමට ඒ පළාත් පාලන ආයතන සහ අනිකුත් ආයතනවලින් නිර්දේශයක් ලබා දෙන්නය කියලා.

මම හිතන්නේ අපේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා එදා රැස්වීමේදීත් පැවසුවා, කොළඹ නාගරික කොමසාරිස්තුමා ප්‍රාදේශීය ලේකම්ට ලිපියක් ඇරලා තිබෙනවා, නිර්දේශ කිරීමට අවශ්‍ය කරුණු පැහැදිලි කරලා ලිපියක් එවන්නය කියලා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව, පළාත් සභාව, ප්‍රාදේශීය සභා සහ නායක ස්වාමීන් වහන්සේලා, පියතුමන්ලා ඒ වාගේම ස්වේච්ඡා සංවිධාන අත්සන් කරපු ලියවිලි සභාගත කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. මොකද, එතුමා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා. විශේෂයෙන්ම ඝන අපද්‍රව්‍ය අධිකාරිය තිබෙන්නේ එතුමාගේ අමාත්‍යාංශය යටතේ. ඒ නිසා මේ ජා-ඇළට කුණු ගේන එකට ජා-ඇළ කොට්ඨාශයේ සියලු දෙනාම විරෝධය පළ කරනවා වාගේම පළාත් සභාව තුළිනුත් එතුමා දැනුවත් කරලා, එතුමාටත් විරෝධය පළ කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. මොකද, මේක අත්‍යවශ්‍ය කරුණක්. මේක පැහැර හරින්න එපා. මොකද, මේ ලිපි සභාගත කරන්නේ, මේ වනකොට ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියට දැනුම් දීලා තිබෙනවා. ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාට දැනුම් දීලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාට ලිපි යවලා තිබෙනවා. අග්‍රාමාත්‍යතුමාට ලිපි ඇරලා තිබෙනවා. පළාත් පාලන විෂයය භාර ගරු ප්‍රධාන ඇමැතිතුමාට ලිපි ඇරලා තිබෙනවා. පරිසර අමාත්‍යතුමාට ලිපි ඇරලා තිබෙනවා. ඒ නිසා මේ සියලු දේ ගැන හිතලා ඒ ජා-ඇළට කුණු ගේන එක ගැන සම්පූර්ණ විරෝධය පළ කරනවා. මෙම ලිපි සභාගත කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. ගියපාර ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා ඉල්ලීමක් කෙරුවා. මේ වාර්තාවේ තිබෙනවා. ජා-ඇළ අක්කර 30 ක ඉඩමක් තිබෙනවා. ඒ අක්කර 30 ක ඉඩම මීට ඉහත හිටපු එක දේශපාලඥයෙක් පාසලකට දෙන්න ගිහිල්ලා ඒක නවත්තා ගත්තා. එතකොට ගියපාර ගරු ප්‍රධාන ඇමැතිතුමාට චෝදනාවක් කෙරුවා, නැවත කුණුවලට මේ අක්කර 30 ගන්න යනවා කියලා. අද ආරංචි වෙලා තිබෙනවා, ඒ අක්කර 30 කුණුවලටත් නොවෙයි. වෙනත් ව්‍යාපෘතියකට ගන්න යනවා කියලා. අපට එහෙම ආරංචියක් තිබෙනවා. මොකද, ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. අන්න ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්නය කියලා අපි ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, පොඩි කරුණක්. දැන් මගේ නම සඳහන් කරලා කිව්වා, මම මේක දන්නවා කියලා. 36(1) යටතේ මට බලපාන වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් ඉවර කරන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපි ඔක්කොටම බලපාන ඉතා වැදගත් දෙයක්. ගරු සභාපතිතුමනි, දැන් ප්‍රාදේශීය සභාවල් විසුරුවලා තිබෙන වෙලාවේ මේ ප්‍රාදේශීය සභාවල්වලට අයිති ඉඩකඩම් ටික කවුරු කවුරු හරි ඒ අයට ඕනෑ විධියට පාවිච්චි කරන්න හදනවා. දැන් ජා-ඇළ ප්‍රාදේශීය සභාවට අයිතිව තිබෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට සමාවෙන්න. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට මට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපට බලපාන දෙයක්. මමත් හිටපු සභාපතිවරයෙක්. මම සභාපති වෙලා ඉන්න කාලයේ අක්කර 30 ක ඉඩමක් ප්‍රාදේශීය සභාවට ලියා ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔහොම යන්න ගියාම කාලය ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න. ඔබතුමාට තිබෙන ප්‍රශ්නය කෙටියෙන් කියන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පොඩ්ඩක් ඉඩ දෙන්න. අපේ ගරු මහ ඇමැතිතුමාට පොඩ්ඩක් මතක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාගෙන් අපි ඉල්ලනවා. මේ පළාත් පාලන ආයතනවලට අයිති ඉඩම් ටික රැකලා දෙන්න කියලා. ලේකම්වරුන්ට ඕනෑ විධියට ඒවා පාවිච්චි කරන්න නොදී, ඒ ඉඩම් ටික රැකලා දෙන්නය කියලා ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා, ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කඩවන තත්ත්වයක් තිබෙනවා ඔය ප්‍රශ්නය නිසා. ඔබතුමා එහෙමනම් ඒක බේරලා දෙන්න. කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, යහපාලනය සහ පළාත් සභාව. ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මම ගෞරවයෙන් ඉල්ලනවා. මේ කථාව සම්බන්ධයෙන් බාධා කිරීමකින් තොරව ඇහුම්කන් දෙන්නය කියලා. මේ කථාව පටන් ගන්න කොට හිතේවි මේ කථාව මගේ කථාව කියලා. හැබැයි මේ කථාව ඉවර කරන කොට දැනේවි 104 දෙනෙක්ගෙන් 99 දෙනෙක්ගේ කථාව, මේ කථාව කියලා. ඒ නිසා ගෞරවයෙන් ඉල්ලනවා. බාධා කරන්නේ නැතිව යන්තම් අහගෙන ඉන්නය කියලා.

අපි ප්‍රජාතන්ත්‍රවාදය නමින් ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන කොට ත්‍රස්තවාදයේ නාමයෙන් රට නිර්ධනිකරණයක් කරා ගෙනියනකොට සංවර්ධනය මුවාවෙන් රාජ්‍ය දේපළ මංකොල්ල කන කොට ඒකට විරුද්ධ වුණා. ඒ විරුද්ධ වෙලා පවුල් වාදයත්, ඒකාධිපතිත්වයත්, ආගම් වාදයත්, ජාති වාදයත් කරපින්නා ගත්ත කාලයක් නිමා කරලා සදාකල් බලයේ ඉන්න ඕනෑය කියන තත්ත්වය වෙනස් කරලා ජනවාරි 08 වැනිදා වෙනසකට මුල පිරුවා. ඒ වෙනසේ ප්‍රතිඵලය බවට පත් කරන්නට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය කල් තියා හඳුනාගත්ත පොදු අපේක්ෂකයාත්, අපවත් වී වදාළ අතිගෞරවණීය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ ඒ අඳුන ගත්තු පොදු අපේක්ෂකයාට නිර්මාණය කරපු වේදිකාවක් මත ඉඳගෙන මේ ජනවාරි 08 වැනිදා මේ සැබෑ වූ වෙනස දියත් කරන්න අපි මූලික වුණා. එතැනදී එක්සත් ජාතික පක්ෂය, හෙළ උරුමය, සරත් ෆොන්සේකා මැතිතුමා, හකීම් මැතිතුමා, දිගන්බරම් මැතිතුමා ඇතුළු පිරිස වැඩිම දායකත්වයක් ලබා දීලා, ජනතා විමුක්ති පෙරමුණ අඩු වැඩි වශයෙන් එකතු වෙලා ඒ වාගේම මේ තත්ත්වයේ ප්‍රතිඵලයක් විධියට හිර ගෙදර යන්න වෙනවාද? අඩි හයක් පොළව යට යන්න වෙනවාද? අහිමි වෙන්න දේවල් තිබෙනවාද? මාධ්‍ය ආයතන ආපසු ගිණිබත් වෙනවාද? මාධ්‍යවේදීන් මහමඟ මැරෙනවාද? කියන එක තකන්නේ නැතිව යථාර්ථයට මුහුණ දිය යුතු නිසා යථාර්ථය මොනතරම් කටුක වුණත් එදා ජනවාරි 08 වැනිදා මේ දේ කළා. අගෝස්තු 17 වැනිදා ඒක යථාර්ථයක් බවට පත් කරන්න තවත් මේකට මහන්සි වෙලා මේ කටයුත්ත කළා. හැබැයි, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂයෙන් අඩුම සහයෝගයක් අරගෙන, අනිකුත් දේශපාලන පක්ෂවල

බහුතර සහයෝගයෙන් මේ රටේ බලයට පත් වුණු එකම දේශපාලඥයා බවට පත් වෙන්නේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. තමන් නියෝජනය කරපු දේශපාලන පක්ෂයෙන් අඩුම සහයෝගයක් අරගෙන බහුතර සංවිධාන හා දේශපාලන පක්ෂවල අනෙක් උදවියගේ සහයෝගයෙන් බලයට පත් වුණු ලංකා ඉතිහාසයේ එකම දේශපාලඥයා මේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. අද බලන්න. අද මේ ජනාධිපතිවරයාගේ පත්වීමයි, අගෝස්තු 17 වැනිදා අගමැතිවරයා විධියට යහපාලන ආණ්ඩුව හැදීමයි අතර තිබෙන ඒ එකතුව, ඒ වෙනස මේ වෙනස් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඔබතුමාගේ විනාඩි 03 ක කාලය අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙමනම් කමක් නැහැ. ගරු සභාපතිතුමා විනාඩි 03 කට කථාවක් කරන්න පුළුවන්ද කියලා හිතන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය මට දෙන්න බැහැ. ඒ විධියට කාලය වෙන් කරලා තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විනාඩි තුනට ටොයිලට් එකට ගිහිල්ලා පස්ස හෝදගෙන එන්න බැහැ. විනාඩි තුනකට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තවම එන්ජින් එක ස්ටාර්ට් කළා විතරයි. ගියේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඔබතුමා කථා කරන්න කිව්වාට කාගෙන්ද කාලය දෙන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එක්සත් ජාතික පක්ෂයෙන් ඔබතුමාට දීලා තිබෙන්නේ විනාඩි තුනයි. ජේනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාගෙන්ද ඔබතුමා අයින් කරන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතැනම කුමන්ත්‍රණයක් නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමා අහක බලාගෙන ඉන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යහපාලනයට හොඳ කියන්න විනාඩි තුනයි. බණින කොට කැපුවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

යහපාලනෙත් කාලය ඉවරයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න. ඔබතුමා කථා කරගෙන යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය වෙන් කරලා තිබෙන්නේ ආණ්ඩු පක්ෂයට විනාඩි 17 යි. විපක්ෂයට 13 යි. විනාඩි 30 යි තිබෙන්නේ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කියන්න, කාගෙන්ද මම කාලය කපන්නේ කියලා. ඔබතුමා අහක බලාගෙන ඉන්නේ. ඔබතුමා කාලය දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩියක කාලයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩියක් එතුමා කථා කරලා ඉවරයි. විනාඩියක් බැහැ. දැන් එතුමාගේ කථාව ඉවරයි. එහෙම කරන්න බැහැ. කථාවක් කියන්න එතුමාට කාලය ඉල්ලනවා නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ ආදර්ශය අරගෙන පාර්ලිමේන්තුවේ ධීවර ඇමැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන කොට යූ.ඇන්.පී එකෙන් රාජ්‍ය ඇමැති බවට පත් වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ප්‍රවාහන හා ගුවන් සේවා ඇමැති පත් වෙන කොට යූ.ඇන්.පී එකෙන් නියෝජ්‍ය ඇමැති පත් වෙනවා. මුදල් ඇමැති යූ.ඇන්.පී වෙන කොට රාජ්‍ය ඇමැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පත් වෙනවා. හැබැයි, ඒ ආදර්ශය පාර්ලිමේන්තුවෙන් දුන්නාට පළාත් සභාවට මොකද වෙලා තිබෙන්නේ? අද පළාත් සභාවේ තිබෙන තත්ත්වය පිළිබඳව මේ යහපාලන සංකල්පය, මේ සහජීවනය පිළිබඳව වෙලා තිබෙන එකම දේ තමයි ජනවාරි 08 වැනිදායි, අගෝස්තු 17 වැනිදායි ප්‍රතිඵලයේ ප්‍රතිඵලය තමයි තිරිවාන කැටේ යට ගිහිල්ලා මේකේ ගොමරිටි උඩ මතු වෙලා තිබෙන තත්ත්වයක් තිබෙන්නේ. තිරිවානේ කැටේ යට ගිහිල්ලා ගොමරිටි (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මැණික්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මැණික් කියන්න තරම් පිරිසක් නැති නිසයි තිරිවාන කැට කියන්නේ. තිරිවාන කැට යට ගිහිල්ලා ගොමරිටි උඩ මතු වෙලා තිබෙනවා. ගරු මහ ඇමැතිතුමනි, මේ තත්ත්වය මම දකිනවා,

*අන්තෝ ජටා බහි ජටා - ජටාය ජටිතා පජා*
*තං තං මහ ඇමැති පුච්චාමි - කෝ ඉමං විජටයේ ජටංති*

මේ කාරණයේ ඇතුළත් අවුල්. පිටත් අවුල්. මහ ඇමැතිතුමනි ඔබෙන් අහනවා ඇරුණු කොට කාගෙන්ද අහන්නේ? සමහරු කරපටි මාරු කරගත්තා විතරයි කළේ. සමහරු දවල් මීගෙල් රෑ ඩැනියෙල් දෙයක් කරලා, සමහරු දෙපැත්තම කකා මේ ගත්ත ප්‍රතිඵලය භුක්ති විඳිනවා. ගරු මහ ඇමැතිතුමනි, ගරු සභාපතිතුමනි, මොහොතක් ඉන්න. මේ ප්‍රතිඵලය බස්නාහිර පළාතේ ජනතාවට ලැබිලා තිබෙනවාද? බස්නාහිර පළාතේ ජනතාවට ලැබිලා නැහැ. සමහරු විශ්වාස කරනවා, තමන්ට මේක අයිතිවාසිකමක්. වරප්‍රසාදයක් විධියට මේ පුටුවල වාඩි වුණයි කියලා. හැබැයි, මේ පුටුවල වාඩි වුණේ අයිතිවාසිකමක් වරප්‍රසාදයක් හැටියට නොවෙයි. ගරු සභාපතිතුමනි, කල්පනා කරලා බලන්න. ලලිත් වනිගරත්න ඇමැතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයෙන් 4 වැනියාට මනාප අරගෙන තමුන්නාන්සේ ඇමැති පුටුවේ වාඩි වෙලා ඉන්නවා. ඒ වාගේම ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා 08 වැනියාට මනාප අරගෙන ඇමැතිකමේ අමාත්‍යාංශයක පුටුවක වාඩි වෙලා ඉන්නවා. ඒ වාගේම රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ 05 වැනියාට මනාප අරගෙන ඇමැතිකමේ පුටුවක් තිබෙනවා. සුමිත් ලාල් මැන්දිස් මැතිතුමා (බාධා කිරීම්) අටවැනියට අරගෙන වාඩි වෙලා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරදි ප්‍රකාශ කරන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරැදි දත්තයන් දෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නිශාන්ත වර්ණසිංහට විරුද්ධව අත උස්සලා ඒ සෞඛ්‍ය ඇමැතිකම සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාට ගිය එක ගැන මම කනගාටු වෙනවා. මම එහෙම කියන්නේ ඇයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එතුමාට ලබා දුන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට දුන්නේ නැති හින්දාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හැබැයි, සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වෙබ් එකේ තිබුණේ ඔබතුමාට කියලා නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම ගරු සභාව -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ ඉල්ලීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.30 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.30 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ මුල් පේළියේ කවුරුත්ම නැහැ නේ. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට මන්ත්‍රීවරු අදහස් දක්වන වෙලාවේ. කිසිම කෙනෙක් නැහැ. පහත් බිම් ගොඩකිරීම් හා පරිසර හානිය පිළිබඳව ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 මැයි මාසයේ 23 වන දින ආපදා කළමනාකරණ පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකායේ විශේෂ රැස්වීමේ ප්‍රධාන තීරණ ඇතුළත් වාර්තාවක් අප සතුව ඇත. එහි අංක පහ යටතේ ගත් තීන්දුව ලෙස ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කය තුළ සියලුම ඉඩම් ගොඩකිරීම් තහනම් කළයුතු බවයි. ගරු අගමැතිතුමා ඇතුළු මැති ඇමැතිවරුන් අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු 67 දෙනෙක් එයට සහභාගි වී ඇත. ඒ අතර බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාද වේ. විශේෂයෙන්ම වගුරු බිම් ගොඩකිරීම නොකළ යුතු බවට ගත් මෙම තීරණයට මාධ්‍ය හරහාද විශාල ප්‍රචාරයක් ලැබී තිබිණි.

ගරු සභාපතිතුමනි, ගන්නා වූ තීන්දු එසේ වුවත් සිදු වන්නේ අනෙකකි. අද පහත් බිම් ගොඩකිරීම් ගජරාමෙට සිදු වේ. අලුත්ම තත්ත්වය නම් ගොවිජන සංවර්ධන කොමසාරිස්ට කිසිවෙකුගේ නිර්දේශ වාර්තා නොමැතිව කොළඹ තම කාමරයේ සිට ගොඩකිරීම් සඳහා අනුමැතිය දීමට සර්වබලධාරී බලයක් ලබා දී ඇත. ඕනෑම කුඹුරු යායක් එක පැන් පාරකින් ලියැද්දක් හෝ ගොඩබිම ඉඩමක්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ලෙස නම් කිරීමේ හැකියාව ඔහු සතුව ඇත. කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර සහ ප්‍රාදේශීය කෘෂි නිලධාරීට අද රාජකාරියක් නොමැත. ඒ අතර පළාත් කෘෂිකර්ම ඇමැතිතුමා එළු පැටව් ටිකක් කුඩුවකට දමා මහජනතාවට ප්‍රදර්ශනය කරන, වටු පැටව් ටිකක් කුඩු කර ප්‍රදර්ශන පවත්වන, පැළ වර්ග ටිකක්, ක්‍රෝටන් ටිකක් පෝච්චිවල දමා ප්‍රදර්ශනය කරන අසරණ ඇමැතිවරුන් බවට පත් කර ඇත. මහ පරිමාණ ගොඩකිරීම්වලට එරෙහිව එතුමාට කළ හැකි දෙයක් නැති බව උපදේශක කාරක සභාවේදී පැහැදිලි විය.

ගරු සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ කළුතර දිස්ත්‍රික්කයට කොටසක් අයිති වන්නා වූ කැස්බෑව - බණ්ඩාරගම මාර්ගය ආසන්නයේ බඳුවිල ප්‍රදේශයේ මේවන විට අක්කර 100 කට ආසන්න වගුරු බිමක් ආශ්‍රිත පරිසර පද්ධතියක් විනාශ කිරීමට ඇම්රෝස් පෞද්ගලික සමාගම නම් ස්විස්ටර්ලන්ත සමාගමක් කටයුතු සූදානම් කර ඇත. වගුරුබිම් සහිත ජල පෝෂක පරිසර පද්ධතියක් ගොඩකර නිවාස 1200 ක ව්‍යාපෘතියකට ඉඩ දෙන බවට තොරතුරු අනාවරණය වී ඇත. මේ අක්කර 100 තුළ කොළඹට කීර එළවළු, කෙසෙල්, බුලත්, පුවක් වගාවන් ආහාර සපයනවා සේම එකී වගාවන් වලින් හා වෙළඳාම ඇතුළු ආණ්ඩුවලින් රස්සාවල් නොඉල්ලා ජීවත්වන පවුල් ප්‍රමාණය 1000 ක් පමණ වේ. එසේම කැකිල්ල යටි වගාවන්ද. දං, දවට, ඇඹිල්ල, වෙල්අත්ත, දියපර වැනි පරිසර හිතකාමී විශාල ගස් වර්ගයන්. එරමිනියා, ගොවි වැල්, හිඹුටු වැනි දුර්ලභ ගණයේ වැල් වර්ගවලින් පෝෂිතය. මඟුරා, කාවයියා, කොරලි හා ආඳා වැනි මත්ස්‍යයින් ගහන පොකුණු රාශියකින්ද සමන්විත වේ. එසේම බොල්ගොඩ ගඟ ආශ්‍රිතව ගොඩ ඉඩම් ජල ගැල්මෙන් බේරා ගන්නා පරිසර පද්ධතිය ආරක්ෂා වී ඇත්තේ මෙම තෙත් බිම් ප්‍රදේශය නිසාවෙනි. වර්ෂා කාලයේදී මෙම මුළු අක්කර 100 ම ජලයෙන් පිරුණු බිමක් බවට පත් වේ. ඕනෑතරම් ගෙවල් හැදීමට ගොඩ ඉඩම් තිබුණු රටක මෙවැනි වටිනා පරිසර පද්ධතියක් ගොඩ කර ගෙවල් හැදීමට අවස්ථාව දිය හැක්කේ ඕනෑම දේකට මිල තීරණය කළ හැකි නමුත් වටිනාකමක් නොදන්නා නරුමයින්ට පමණකි. ගරු සභාපතිතුමනි, මෙම තෙත් බිම් පරිසරය පිහිටි පළාතම කිඳෙල්පිටිය, වැල්මිල්ල, හෙරලියවල, වීදියගොඩ, බටුවන්දර යන ගම්මාන පමණක් නොව, ජඹුරලිය, කහතුඩුව, ගෝනපල, දියගම, කිරිවත්තුඩුව වැනි කොළඹ සහ කළුතර ගම් රාශියක් ජලයෙන් යට වීම වැළැක්විය නොහැකි තත්ත්වයක් මෙම තෙත් බිම් ගොඩ කිරීමෙන් විනාශකාරී පරිසරයක් ගොඩ නැඟේ. සියල්ල මුදල් මත තීරණය කරන විදේශීය සමාගම්වලට හා ඒවාට අනුබල දෙන්නා වූ ආත්මාර්ථකාමීන්ට අප රටේ වටිනා පරිසර පද්ධතිය ගැන හැඟීමක් නොමැත. නමුත් මේ රටේ වටිනා පරිසරයෙන් උපන් සංවේදී මිනිසුන් වේ නම් තමන්ට හිමි අවම ඉඩකඩ යටතේ හෝ අප රටේ වටිනා පරිසරය රැක ගැනීම වෙනුවෙන් ඉදිරිපත් විය යුතුය. තම වගකීම සහ යුතුකම වෙනුවෙන් අවධානය යොමු කළ යුතුය. බස්නාහිර පළාත් සභාවේ කාර්ය භාරය වෙනුවෙන් මේ සඳහා අවධානය යොමු කරවමු.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රකාශයට පොඩි කොටසක් එකතු කරන්න බැරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බැහැ. එහෙම අවස්ථාවක් රීතිවල නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ආ... ගොඩ කරන එක නතර කරනවා නම් මොක්ක හරි කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා එහෙම බැහැ. පෞද්ගලික පැහැදිලි -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒ වාගේම දෙයක් සිද්ධ වුණා. දිගටම මෙවැනි දේවල් සිද්ධ වෙනවා. හැබැයි ඉහළ ඉන්න නිලධාරීන්වත්, පොලීසියවත් ඇහුම්කන් දෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක යෝජනාවක් වශයෙන් සභාවට ගේන්න. එතකොට කථා කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ කථාව අවසන් කරන්න සහ ඒ කථාවට සාධාරණ කාලයක් ලබා දුන්නේ නැහැ. හේතුව ඔබතුමන්ලාත් අපත් දේශපාලනය කරන උදවිය. අපට වඩා ඔබතුමාට ගොඩක් අත්දැකීම් වැඩියි. නමුත් විනාඩි 03 කට කාට හරි කථා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට විනාඩි 05 ක් දුන්නා. එහෙම කියන්න එපා. විනාඩි 05 ටත් වැඩියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කථාව පටන් ගන්න තැනම විනාඩි 03 යි කියලා කිව්වාට පස්සේ මනුස්සයෙකුට කථාව කරන්න බැහැ. ඒ නිසා මම කියන්නේ මේකයි. මට වේවා, තව කෙනෙකුට වේවා මේ පැත්තට විනාඩි 16 නම් තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 13 යි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විනාඩි 13 නම් තිබෙන්නේ එක්කෝ රීති සංශෝධනය කරලා ඒ ප්‍රමාණය වැඩි කරන්න උත්සාය කරන්න. නැත්නම් විනාඩි 03 කට මනුස්සයෙකුට තමන්ගේ අදහසක් පළ කරන්න බැහැ. දේශපාලඥයෝ වුණු සභාපතිතුමන්ලා, මේ අත්දැකීම් පරිපූර්ණ උදවිය මේ කාරණය සම්බන්ධයෙන් අනුකූලතාවයක් නැත්නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා මට පැහැදිලියි. මම තේරුම් අරගෙන ඉන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙම නැත්නම් විපක්ෂයෙන් භාර ගන්න කථා ප්‍රමාණයට ඔබතුමන්ලා මැදිහත් වෙලා කථා දෙකකට පමණක් සීමා කරන්න. අවසානයේ කාටවත් ප්‍රයෝජනයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ සංවිධායකතුමා එකඟ නම් මමත් ඒකට එකඟයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අවසානයේ කාටවත් ප්‍රයෝජනයක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා ඕවා මෙතැන කථා කරන්න ඕනෑ ඒවා නොවෙයි නේ? ඕවාට කාරක සභා තිබෙනවා. කථා කරන්න සභාවල් තිබෙනවා. මෙතැන කථා කරන්න සුදුසු තැන් නොවෙයි නේ? සභාවේ වැඩ කටයුතු ඉස්සරහාට කරගෙන යන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පණ්ඩිත වෙන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

න්‍යාය පත්‍රයට යන්න. අපේ අයිතිවාසිකම් උල්ලංඝණය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. පාසල් පරිපාලනයේ ගැටළු පිළිබඳව අදහස් දැක්වීමට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ වෙලාවේ අධ්‍යාපන ඇමැතිතුමා නොමැතිවීම ගැන කනගාටු වෙනවා. මොකද, අධ්‍යාපන ඇමැතිතුමාට මම පල්ලෙහාදී කිව්වා, මම අධ්‍යාපනය ගැන යම් ප්‍රකාශයක් කරනවා පොඩ්ඩක් ඔබතුමාගේ අවධානය ඉතාම අවශ්‍යයි කියලා. ගරු සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රකාශය කරන්න. ලේකම්තුමා ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක සඟරාවක් කිව්වොත් නිවැරැදියි. මේකේ එක තැනක තිබෙනවා, නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විදුහලේ ඇතුළේ අර්බුදය කියලා දැවැන්ත ලිපියක් ලියලා. දැන් මේකෙන් පේන්නේ අපේ අධ්‍යාපනය කොයි තරම් වැටිලාද කියන එක. මේක ගුණාත්මකව වැටෙන්න අධ්‍යාපනය බලපානවා. ඒ වාගේම මේ පාසලේ පාසල් සංවර්ධන සමිතිය මා වෙත එවලා තිබුණා තොරතුරු සහිත ලිපි ගොනුවක්. දැන් මේක කියවලා බැලුවාම මේකේ සමහර ලේඛන නිල ලේඛන. මොකද, එක තැනක තිබෙනවා මේක යවලා තිබෙන්නේ එම්.ඒ.බී. දයා සෙනරත්. ලේකම්. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්. සමුද්‍රදේවී බාලිකා විදුහලට අදාළ මූලික විමර්ශන. ඇත්ත වශයෙන්ම මේ ලිපි සියල්ල කියවලා බැලුවාම සහ මම ඉස්සර හිතාගෙන හිටියේ මේ සඟරාවේ දාන්නේ ගොතපුවා, එහෙම නැත්නම් හිතළු කියලා. දැන් බලාගෙන ගියාම මේකේ තිබෙන තොරතුරු ගරු සභාපතිතුමනි, මට ලැබිලා තිබෙන ලිපි ගොනුවේ තිබෙන තොරතුරුත් බොහෝ දේවල් එකිනෙක සමපාත වෙනවා. සමාන වෙනවා. ඒ නිසා මම කියන්නේ මේක කියවලා බැලුවාම තේරෙනවා, අනේ මේ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයේ මැවෙන චිත්‍රය හරියට ගව ගාලකට වඩා අන්තයි. මම කියන්නේ මේක ඉතා හොඳ කීර්තිමත් පාසලක්. අපි බොහොම කැමැති, දියුණු පාසලක්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ළමයින් ඉන්න ඉස්කෝලයකට එහෙම කියන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේකේ භෞතික ස්වරූපය - ගරු මන්ත්‍රීතුමා මේකේ භෞතික ස්වරූපය පෙන්වන්නේ ගව මඩුවක තත්ත්වය. දරුවන් ගැන නොවෙයි මේ කියන්නේ. ඒ නිසා මම කියන්නේ මේ එක පාසලක් විතරයි. ගරු සභාපතිතුමනි, මෙවැනි පාසල් ගණනාවක් පිළිබඳ තොරතුරු මම ඇමැතිතුමාට කියලා තිබෙනවා. ලේකම්තුමාට කියලා තිබෙනවා. මෙවැනි පාසල් පිළිබඳව ලිඛිතව දීලා තිබෙනවා. ඒ නිසා මේවා ගැන පියවර ගන්නේ නැත්නම්, මේවා ගැන විමර්ශනය කරන්නේ නැත්නම් කරුණාකරලා ලේකම්තුමා ඉන්නවා. අපේ ඇමැතිතුමාට කියන්න අඩුම ගාණේ පාසල් සම්බන්ධව එල්ල වන චෝදනා සම්බන්ධයෙන් සොයා බලන්න, විමර්ශනය කරන්න කමිටුවක් පත් කරන්න කියලා. දැන් මේ ලිපියේ එක තැනක මෙහෙම තියෙනවා.

*"මන්ත්‍රී කෝටා යටතේ දෙන දරුවන් සංඛ්‍යාව අඩු කොට ඇය විසින් ඇගේ අවශ්‍යතා මත පළමුවන ශ්‍රේණියට දරුවන් 45 සීමාව උල්ලංඝණය කරමින් පසුගිය අප්‍රේල් මස දරුවන් පාසලට ඇතුළත් කර ඇත."*

දැන් මේකේ වෙන කතන්දරයකුත් තිබෙනවා. සමහර මන්ත්‍රීවරු එක්ක ගැටුමකුත් තිබෙන බව මේක බැලුවාම පේනවා. හැබැයි ඒක නොවෙයි ප්‍රස්තුත කාරණය. මේ පාසලේ කටයුතු සම්බන්ධයෙන් එල්ල වන චෝදනා. මේ සියලු චෝදනා බස්නාහිර පළාත් මහ ඇමැති, බස්නාහිර පළාත් අධ්‍යාපන ඇමැති රංජිත් සෝමවංශ සියලු දෙනා වෙත දෙමව්පියන් සහ ගුරුවරුන් ඔවුන්ව දැනුවත් කොට ඇත. මේ ඇමැතිතුමාව දැනුවත් කරලා තිබෙනවා කියලා මහ ඇමැතිතුමාව දැනුවත් කරලා - මම පෞද්ගලිකව දන්නවා මහ ඇමැතිතුමා දැනුවත් කළ බව. නමුත් මේක ඉෂ්ට වෙලා නැහැ. මේ ගැන සොයා බලලා නැහැ. ඒ නිසා පාසල් මෙහෙම විනාශ වෙන්න දෙන්න එපා. කරුණාකරලා මේකට ක්‍රියා මාර්ගයක් ගන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විශේෂ ඉල්ලීමක්. පුළුවන්කමක් තිබෙනවා නම්, අපි මේ කථාව මුල ඉඳලා අහන්න සලස්වලා දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න බැහැ. ඔබතුමා වෙලාවට එන්න ඕනෑ. ඔබතුමා සභාවේ ඉන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේකේ කියනවා කොට්ඨාශ අධ්‍යක්ෂවරයා ජයවර්ධනපුර කලාප අධ්‍යක්ෂිකාව හා අනෙකුත් අධ්‍යක්ෂිකාවන් කිසිදු විමර්ශනයක් හෝ

පරීක්ෂණයක් පවත්වා නැත. මේ කිසිදු දේකට පරීක්ෂණයක් පවත්වා නැත. පළාත් අධ්‍යාපන ඇමැති රංජිත් සෝමවංශ මහතාගේ යටතේ ඇති විමර්ශන අංශයද මේ වනවිට අකර්මන්‍ය වී ඇත. පළාත් මට්ටමෙන්ද කිසිදු නිලධාරියෙක් මේ දූෂණ හෝ වංචා පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම රටේ අභාග්‍යයකි. ගරු සභාපතිතුමනි, -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔය කැලෑ පත්තරයක්. ඔය කැලෑ පත්තරයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කැලෑ පත්තරයක් -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අමාත්‍යාංශයේ එහෙම නැහැ. ඔය කැලෑ පත්තරයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මයික්‍රෆෝනය ක්‍රියාත්මක කරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමන්ලාම කිව්වා නේ අයවැයේදී අධ්‍යාපන අමාත්‍යාංශය ගැන තීරණයක් ගන්නවා කියලා. ඔබතුමන්ලා දැන් අනෙක් පැත්තට කථා කරනවා නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද කිව්වේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් වශයෙන් අහන්න එපා. නම් වශයෙන් කිව්වාම අපහසුතාවයට පත් වෙනවා නේ? ගරු සභාපතිතුමනි, මගේ ඉල්ලීම - මේ සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය මෙහෙම අර්බුද තිබෙන එක පාසලක් විතරයි. ඒ නිසා මේ සියලු අර්බුද සොයන්න. ඔබතුමාට ඕනෑතරම් මේ වාගේ දේවල් ගැන කියලා තිබෙනවා. මාලබේ රාහුල බාලිකා විද්‍යාලයේත් මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා. විමර්ශනයකුත් කරලා. හැබැයි ඒ පිළිබඳව නිවැරැදි ක්‍රියා මාර්ග අරගෙන නැහැ. අපට ඕනෑ විදුහල්පතිවරු එලවන්න. මම කියන්නේ නැහැ විදුහල්පතිවරිය එලවන්න කියලා. අයින් කරන්න කියන්නේ නැහැ. මාරු කරන්න කියන්නේ නැහැ. හැබැයි මෙහෙම චෝදනා ආවාම ඒවා විධිමත් විධියට පරීක්ෂා කරන්න. එක්කෝ ඒ අයව නිදහස් කරන්න. එහෙම නැත්නම් ඒ අය මාරු කරලා යවන්න. ඒ නිසා මේ පිළිබඳව නිවැරැදි ක්‍රියා මාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෝමාගම මූලික රෝහලේ අඩුපාඩු සම්බන්ධව අදහස් දැක්වීමට ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ පත්තරේ නමවත් මම දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙලාවට සභාවට එන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පත්තරේ පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා නොහිටපු එක ගැන කනගාටුයි. මා ළඟ තිබෙනවා පාසල් සංවර්ධන සමිතිය එවපු ලිපි ගොනුවක්. ඒ ලිපි ගොනුවේ තිබෙනවා නිලධාරීන් විසින් (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒක සභාගත කරන්න කෝ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂයේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විශේෂ ප්‍රකාශයකට ප්‍රශ්න අහන්න බැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒකට පිටින් යන්න හදන්න එපා ගරු ඇමැතිතුමා. ඔබතුමා කියන්නේ මේකේ කරුණු හොයන්න නොවෙයි. ඔබතුමා අවශ්‍ය නම් කරුණු ටික ආයිත් කියන්නම්. මේක ගැන පරීක්ෂණයක් පවත්වනවාද කියන්න. එපමණයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එතුමාගේ කාරණාව ගැන වගකීම මම භාර ගන්නවා.

[සභාවේ ඝෝෂා]

මම අහන්නේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කියවන පත්තරේ මොකක්ද කියලා. මට මෙතැන වෙන මුකුත් ප්‍රශ්නයක් නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒකේ නම ඊතලය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අයියෝ, ඕක පත්තරයක්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කැලෑ පත්තරේත්, පත්තරයක්. ඒක කැලෑ පත්තරයක් නම්, කැලෑ පත්තරේ කියන්නෙත් පත්තරයක්. පත්තරේ කියන්නෙ Information ගන්න එකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, හෝමාගම මූලික රෝහලේ වර්තමාන තත්ත්වය පිළිබඳව ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මම ඉතාමත්ම කනගාටු වෙනවා හෝමාගම මූලික රෝහලේ වර්තමාන තත්ත්වයේ පවතින අඩුපාඩු පිළිබඳව. විශේෂයෙන්ම අද මේ වනකොට හෝමාගම මූලික රෝහල තුළ X-RAY ක්‍රියා කරවන්නන් - X-RAY එකක් ගන්න ගියාම සවස 4.00 න් පස්සේ X-RAY ගන්නේ නැහැ. නිවාඩු දවස්වල X-RAY ගන්න කට්ටිය නැහැ. මේ පිළිබඳව වර්ෂයක් දෙකක් විතර දිගින් දිගටම හෝමාගම රෝහලේ වෛද්‍යවරු අපේ අමාත්‍යාංශය දැනුවත් කරලා තිබෙනවා කියලා කියනවා. නමුත් ඒ පිළිබඳව මෙතෙක් කිසිම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ.

මොකද, මේ තත්ත්වය ඇති වෙන්නේ මම පසුගිය පළමුවැනිදා ළමයින් සම්බන්ධව උත්සවයක් කරන අවස්ථාවේදී අවුරුදු දෙකක විතර ළමයෙක් අනතුරකට පත් වෙලා ඒ දරුවාව රෝහලට අරගෙන ගියා. රෝහලට අරගෙන ගිහිල්ලා ඒ දරුවාගේ ඇඟිල්ල කැඩිලා වෛද්‍ය ප්‍රතිකාර ගන්න ගියාම වෛද්‍යවරු ඒ අවස්ථාවේ ප්‍රතිකාර කරන්න උත්සාහ කරලා නමුත් එතැනින් එහාට ඒ දරුවාට මොකක්ද කරන ප්‍රතිකාර කියන එක පිළිබඳව වෛද්‍යවරුන්ට කරන්න කිසිම ක්‍රියා මාර්ගයක් නැහැ. ඒ දරුවාගේ ඇඟිල්ලට බෙහෙත් ටිකක් දාලා දරුවාව එළියෙන් තියලා තියෙනවා. ඇඟිල්ල කැඩිලා. ඇඟිල්ල ආයිත් හදන්න පුළුවන්ද කියලා බලා ගන්න විධියක් නැහැ X-RAY යන්ත්‍ර ක්‍රියා කරවන්නන් හෝමාගම රෝහල තුළ X-RAY යන්ත්‍රය කටයුතු කරන්නේ නැහැ කියලා කිව්වා. ඒ අවස්ථාවේ හොඳ වෙලාට මට එතැන හිටපු අය කථා කරලා කිව්වා - ඒ දරුවා අසල දෙමව්පියෙකුගේ දරුවෙක්. ඒ පාර මට සිද්ධ වුණා මගේ යාළුවෙකුගේ වාහනයකින් ඒ දරුවාව අරගෙන ගිහිල්ලා කළුබෝවිල රෝහලට ඇතුළත් කරන්න. හෝමාගම රෝහල කියන්නේ, ගොඩක් ධානපතීන්ගේ පෞද්ගලික ආධාර උපකාර ලැබිලා ගොඩනැගිලි අතින් සම්පූර්ණ වුණු රෝහලක්. නමුත් අද මේ වනකොට පවතින තත්ත්වය - මම එක පැත්තක් විතරයි කියන්නේ. X-RAY යන්ත්‍රය ක්‍රියා කරන්නේ නැතුව ඇති වෙලා තිබෙන මේ අසරණ තත්ත්වය තුළ රෝගීන් ඇවිල්ලා - සවස 4.00 න් පස්සේ අනතුරක් වෙලා, එහෙම නැත්නම් නිවාඩු දවසක අනතුරක් වුණොත් ඒ රෝගියාට

බෙහෙත් කරන්න විධියක් නැහැ. මොකද, X-RAY කරන්න විධියක් නැති නිසා එතැන ලොකු අනතුරකට පත් වෙනවා.

ඒ වාගේම පසුගිය දවස්වල අපේ හිතවත් දානපති මහත්මයෙක් හෝමාගම මූලික රෝහලට ගොඩනැගිල්ලක් පරිත්‍යාග කරන්න සූදානම් වුණා. ඒකේදී එතැන තිබෙන මෝචරිය ඉවත් කරලා ඒ වෙනුවට තාවකාලික මෝචරියක් ලබා දෙන්න කියලා අමාත්‍යාංශයට කිව්වා. මම දන්න හැටියට අද වනකල් ඒ කටයුත්ත කරලා නැහැ. ඒ නිසා ඒ දානපති මහත්මයා ඒ ගොඩනැගිල්ල හදලා දෙන කටයුත්ත එකතැන නතර වෙලා තිබෙනවා. මම ඇමැතිතුමාට කිව්වා. ඇමැතිතුමාත් ඒ සඳහා මැදිහත් වුණා. ඒ වාගේම සමහර අවස්ථාවල - මම දන්නේ නැහැ හෝමාගම රෝහලේ සුළු සේවකයින් ප්‍රමාණය ඇතිද, මදිද කියලා. අනතුරකට ලක් වෙලා හෝ ටිකට් කපලා එන ලෙඩෙක් ට්‍රොලියේ දාගෙන ඒ ලෙඩාගේ කවුරු හරි යන්න ඕනෑ. වාට්ටුවට ගිහිල්ලා Identity Card එක වාට්ටුවේ තියලා ට්‍රොලියෙන් තල්ලු කරගෙන ඇවිල්ලා, ඒ ලෙඩාව වාහනයට දාලා නැවත ට්‍රොලිය උඩට ගෙනිහිල්ලා දුන්නාම තමයි රෝගියාගේ කවුරු හරි එන කෙනාට හැඳුනුම්පත දෙන්නේ. මේ රෝහලේ එහෙම තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. ඒ නිසා කනගාටුවෙන් කියනවා, මේ පිළිබඳව හොයලා බලන්න වෙනවා. මොකද, මේ රෝහල දැක්කාම අංග සම්පූර්ණ රෝහලක් වාගේ පේන්නේ. මිනිස්සු දන්නේ නැහැ, මේ රෝහලට ගිහිල්ලා සමහර වෙලාවට අසරණ තත්ත්වයට පත් වෙනවා කියලා. ඒ අම්මා, ඒ දරුවාව තියාගෙන හිටියා නම් එහෙම ඒ දරුවාගේ ඇඟිල්ල කපන්න සිද්ධ වෙනවා. මොකද, ප්‍රතිකාර නැහැ. දවසක් දෙකක් ප්‍රතිකාර නැතුව හිටියා නම්, පසුවදා උදේ වෙනකල් හිටියා නම්, ඒ ඇඟිල්ල මැරෙනවා. ඉතින් ඒ නිසා මේ තත්ත්වය ඇති කරන්න එපා. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලන්නේ මේ පිළිබඳව සොයා බලා - සමහර අවස්ථාවල රෝහලකට බෙහෙත් ගන්න ගියාම තුණ්ඩුව දෙනවා ලේ, මුත්‍රා, අනෙක් ඒවා පරීක්ෂණ කරන්න කියලා. ඒවා රෝහල ඉස්සරලා තිබෙන පෞද්ගලික පර්යේෂණාගාරවලින් කරගන්න කියලා කියනවා. මේවා තුළ අපි බලාපොරොත්තු වන තත්ත්වය පළාත් සභාව තුළින් කරන්න බැරි නම්, මධ්‍යම ආණ්ඩුවෙන් ඒ සඳහා ප්‍රතිපාදන ලැබෙන්නේ නැත්නම්, මම නම් හිතන්නේ මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ නිසා මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා - ඔබතුමාට එදත් කථා කළා. එනවා කිව්වා. මේක බලලා මේ අඩුපාඩු ටික සම්පූර්ණ කරන්න කියනවා. මොකද, මේ හෝමාගම රෝහලෙන් විශාල ජනතාවක් ප්‍රතිකාර ලබනවා. මේ තත්ත්වය අවබෝධ කර නොගත්තොත් සමහර වෙලාවට අමාරු ලෙඩෙක් ආවොත් ගෙදර යන්න වෙන්නේ මිනී පෙට්ටියකින් තමයි. ඒ නිසා තමයි මේ තත්ත්වය ගැන කියන්නේ. ඒ නිසා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියලා ඉතාම ගෞරවයෙන් ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාවත් අදාළ බලධාරීන්වත් දැනුවත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017 වර්ෂයේ පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම, ස්ථානගත කිරීම් පරීක්ෂණ මගින් කිරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධය අදහස් දැක්වීමට යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මම මේ කාරණය පිළිබඳව ගරු සභාපතිතුමා මාර්ගයෙන් අධ්‍යාපන ඇමැතිතුමාටත්, අධ්‍යාපන ඇමැතිතුමා මගින් අවශ්‍ය නිලධාරීන්ටත් මතක් කරන්නයි මේ මාතෘකාව තෝරා ගත්තේ. මෙතෙක් ඉතිහාසයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා ලබා දී තිබුණු චක්‍රලේඛයේ නොයෙක් අඩුපාඩුකම් තිබුණා. හැබැයි කෙසේ අඩුපාඩුකම් තිබුණත් දරුවන් ඇතුළත් කිරීම යම් ප්‍රමාණයක ක්‍රමවත් භාවයට ගෙන එන්න ස්ථානගත පරීක්ෂණයක් කරලා, මේ දරුවන්ට උප්පැන්න නැති වුණාට, ඡන්ද බලය නැති වුණාට ඒ නගරයක් පෝෂිත ප්‍රදේශයේ සිටින සැබෑ දරුවන් ඇතුළත් කරන්න ඕනෑ කියලා කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරී මහත්වරුන්ට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට ක්‍රමවේදයක්, බලයක් තිබුණා. ඒ වාගේම විදුහල්පතිතුමා ඇතුළු ඒ පාසල් සංවර්ධන කමිටුවට නැත්නම් ළමුන් ඇතුළත් කිරීමේ කමිටුවට බලයක් තිබුණා. නමුත් මේ 2017 වර්ෂයේදී දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයක් නැත්නම් එවලා තිබෙන තොරතුරු අනුව තමන්ට වුණු අසාධාරණය, නැත්නම් තමන්ට තමන්ගේ බල ප්‍රදේශයේ දරුවා ඇතුළත් කරන්න කලාප අධ්‍යාපන කාර්යාලයට අභියාචනයක් ඉදිරිපත් කරලා, කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ස්ථානගත පරීක්ෂණයක් කරන්න බැහැ. ඒක බරපතළ අර්බුදකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙන සිද්ධියක්. ඒ වාගේම පාසලේ

විදුහල්පතිතුමාටයි, ඒ ඉන්න දරුවන් ඇතුළත් කිරීමේ කමිටුවේ අයටත් ඉදිරිපත් කරන ලිපි ලේඛනවලට පිටින් ගිහිල්ලා, ඒ ලිපි ලේඛනවල අඩුපාඩුකම් තිබුණත්, සැබෑම පදිංචියේ ඉන්න දරුවන්ව ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයක් නැහැ. ඒක නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් අධ්‍යාපන ඇමැතිතුමාට මතක් කරනවා. වහාම, දින කිහිපයක් ඇතුළත මේ දවස්වල ලැයිස්තු දාන්න විදුහල්පතිවරු බොහොම බලාගෙන ඉන්නවා, මේ හිතට එකඟව වෙලා තිබෙන අසාධාණ සිදුවීමට මුහුණ දෙන්න බැරුව. ඒ නිසා කලාප අධ්‍යාපන කාර්යාලයටත්, විදුහල්පතිතුමා ඇතුළු ඒ කමිටුවටත් සැබෑ දරුවන් පෝෂක ප්‍රදේශයේ ඉන්න දරුවන්, ලිපි ලේඛනවල යම් යම් අඩුපාඩුකම් තිබුණත්, ඒ දරුවන් ඒ පාසලට ඇතුළත් කර ගන්න ස්ථානීය පරීක්ෂණයක් කිරීමේ බලය ලිඛිතව හැකිතාක් ඉක්මණින් ලබා දෙන්නය කියන කාරුණික ඉල්ලීමයි මම මේ අවස්ථාවේදී ඉල්ලන්නේ. එසේ ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව මීළඟට තිබෙන්නේ පොදු කටයුතු. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවෙන් ලක්ෂ 05 ක ණයක් මේ මන්ත්‍රීවරු ඔක්කෝටම දෙනවා. මගේ ඥාතියෙකුගේ ඉඩමක් තියලා මම මේ ණය ගත්තා. මට පළාත් සභාවෙන් රතු නෝටිස් එකක් එවනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවෙන්ද එවන්නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාවේ ආදායම් දෙපාර්තමේන්තුවෙන් එවනවා මුද්දර ගාස්තු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, අදායම් කොමසාරිස් ජනරාල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් පැහැදිලි කරන්න ගරු මන්ත්‍රීතුමා. ඒක පැහැදිලි නැහැ. සභාවට වැරැදි අවබෝධයක් යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාව කියලා එවනවා. මට රතු නෝටිස් එකක් එවනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් සමාවෙන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මන්ත්‍රීතුමා පොඩ්ඩක් පැහැදිලි නැහැ. ආයිත් කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට මේ සභාවෙන් වාහනයක් ගැනීම සඳහා ලක්ෂ 05 ක ණයක් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ 10 යි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ගත්තු ගාණ 05 යි. ඒකයි මම මේ කියන්නේ. දැන් ඒකට මම මේ පළාත් සභාවට ඉඩමක් තිබ්බා. මේ පළාත් සභාවට තියලා ඇටෝර්නි බලයක් තමයි මේකට පැවරෙන්නේ. මේක පළාත් සභාවේ ලියවෙන්නේ නැහැ නේ? මේ ඉඩමක් විකුණලා නොවෙයි නේ? මම 59,000 ක මුද්දලකුත් ගෙවලා තිබෙනවා. ඊට පස්සේ මට රෙඩ් නෝටිස් එකක් එවනවා. එච්.එම්.යූ. කොඩිකාර, 425/23 උදේනිවත්ත පාර, උඩහමුල්ල, නුගේගොඩ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔය ලියුම කොහෙන්ද එවලා තියෙන්නේ? ආයතනය මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආයතනය තමයි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඔය පටලවාගෙන තියෙන්නේ. ඔය ණය සම්බන්ධ එකක් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස්නාහිර පළාත් සභාව, අදායාම් දෙපාර්තමේන්තුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. ආදායම් දෙපාර්තමේන්තුව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඉඩම් ලියාපදිංචි කරලා මුද්දර ගාස්තු ගන්න ආයතනය. මට එවනවා ඔබ මුද්දර ගාස්තු නොගෙවා ඇති හෙයින් වහාම මුද්දර ගාස්තු ගෙවන්න කියලා රෙඩ් නෝටිස් එකක්. මේකේ තියෙනවා. නැත්නම් 89 වැනි වගන්තිය යටතේ -

[සභාවේ ඝෝෂා]

අහගෙන ඉන්න. මේ ගිරව් වාගේ එච්නුත් මේකේ ඉන්නවා නේ? මේ ඉන්නේ ගිරව්. පෙත්තෝ බත් කැවද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හිටපු ඇමැතිතුමා බාධා කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යහපාලනයේ ගිරව් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලයේ ප්‍රශ්නයක් තියෙනවා. පැහැදිලියි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ගැන මම සොයා බලන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක වෙන්නේ මට විතරක් නොවෙයි. අනෙකුත් ඉඩම් විකුණන මිනිස්සු - එතකොට මේකේ තක්සේරුවක් අරගෙන මුද්දර ගාස්තුව ගෙවනවා. ගෙව්වාම ආයිත් මොකක්ද ගෙවන්න කියන්නේ? 59,000 ක් ගෙවලා තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා වාඩිවෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේක අපට විතරක් නොවෙයි බලපාන්නේ. බස්නාහිර පළාත් සභාවේ සියලුම ඉඩම් විකුණන මිනිස්සුන්ට, ඉඩම් ගන්න මිනිස්සුනට බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා මේකට ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ මන්ත්‍රී මණ්ඩලයක් පත් කරලා - මේ ප්‍රඥප්තියත් මගේ අතේ තිබෙනවා. (බාධා කිරීම්) මේ අය Valuation කරන අය නොවෙයි. මේ අය ඉස්සර BTT එකතු කරපු අය. ඒ නිසා වහාම මට ඊළඟ සභාවේදී මේ සම්බන්ධව පිළිතුරක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කරපු ප්‍රකාශය සම්බන්ධව පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මන්ත්‍රීතුමන්ලාට සභා ලේකම් කාර්යාලයෙන් වාහන ණය නිකුත් කිරීමේදී ඔප්පුවක් සකස් කරනවා Power of Attorney ලියා ගන්න. ඒකට මුද්දර ගාස්තු වැය වෙන්නේ නැහැ. සතයක්වත් මුද්දර ගාස්තු ගෙවන්න ඕනෑ නැහැ. ඔබතුමා 59,000 ක් ගාස්තු ගෙව්වා කියන්නේ මට තේරෙන හැටියට වෙන ඔප්පුවක්. මට තේරෙන හැටියට. මම සොයා බලන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔප්පුවක් නොවෙයි. මේ ඉඩම පළාත් සභාවට අපි බලපත්‍රයක් දීලා. ඒකට කියන්නේ ඇටෝනි බලපත්‍රයක් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට සල්ලි ගන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සිංහල භාෂාවෙන් කියන්නේ. Power of Attorney. මේ Lawyers ලා දන්නවා. මම ඒ ගැන හරියට දන්නේ නැහැ. ඒක තමයි මේ කරලා තියෙන්නේ. මේකට මොකටද මුද්දර ගාස්තු? අපි ලක්ෂ 05 ක් අරගෙන, 59,000 කුත් ගෙවලා ආයිත් මුද්දර ගාස්තු ගෙවන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ගරු මන්ත්‍රීතුමා. මීළඟට පොදු කටයුතු විෂයය යටතේ -

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. දැන් අපි මේ සභාවට ආවාම ගොඩක් වෙලාවට මේ සභාවේ මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා අපි ආයතන පරිපාලනය - අපි මන්ත්‍රී වරප්‍රසාදවලට යට වෙලා නිරන්තරයෙන් අපි කරන්නේ එක්කෝ නිලධාරීන්ට පහර ගහනවා. එක්කෝ ආයතනවල පරිපාලනය ඉලක්ක කරලා අපි කථා කරනවා. අපි හිතනවා ඒක මන්ත්‍රී වරප්‍රසාද වෙන්න පුළුවන් කියලා. හැබැයි මේකෙන් පිටට ගියාම වැඩක් කරගන්න තිබෙන අපහසුතාවය මේ හැම මන්ත්‍රීවරයෙකුම දන්නවා. අද නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා වැඩ කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒ අය FCID අරගෙන ගිහිල්ලා. හරි නිර්වචනය නැතුව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න තත්ත්වයක් නැහැ. නිලධාරීන් අපත් එක්ක සුහදව කටයුතු කළා. යම් නිර්වචනයක් දුන්නාම නිර්වචනයට ගැළපෙන විධියට ඒක ගලපාගෙන අපි කටයුතු කළා. අද මේ මන්ත්‍රීවරුන්ගේ යම් යම් වැරැදි ප්‍රකාශ නිසා, මේ සභා ගර්භය තුළ වරප්‍රසාද පාවිච්චි කරලා කරන ප්‍රකාශ නිසා අද පිටතට ගිහිල්ලා අපට කිසිම වැඩක් කර ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. තව මාසයකින් දෙකකින් අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරන කොට මීට වඩා අපි අයවැය පිළිබඳව කථා කරන්න වෙයි. හැම වචනයකම ඉස්පිල්ලක්, පාපිල්ලක් ගාණේ අපි අර්ථ කථනය කරන්න වෙයි, වැඩක් කර ගන්න. ඒ නිසා මම හිතන්නේ අපි මන්ත්‍රීවරු වශයෙන් මීට වඩා හික්මීමක් ඇතිව කටයුතු කළොත් ඉදිරියේදී අපට වැඩක් කර ගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය මගේ වරප්‍රසාදයක් වශයෙන් ඉදිරිපත් කරනවා. මම ඒක අත්විඳලා තිබෙන නිසා තමයි අද මේ ප්‍රකාශය කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු විෂයය යටතේ බස්නාහිර පළාතේ 2016 අංක ..... දරන තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය පළමුවන වර කියැවීමේ තිබෙන්නේ. ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ඒ සඳහා අවස්ථාව.

## බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය : පළමුවනවර කියැවීම

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, "*2016 අංක ........ දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය*" පළමුවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව මීළඟට තිබෙන්නේ ලේකම්තුමා විසින් අසුනින් නැඟී සිට ප්‍රඥප්තියේ පූර්විකාව කියැවීම.

***[පූර්විකාව ]***
*[Preamble]*

**හේමන්ත සමරකෝන් - සභා ලේකම්වරයා**
Hemantha Samarakoon - Secretary of the Council

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව ලෙසින් වූ,

*"බස්නාහිර පළාතේ පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වූ තොරතුරු හා සන්නිවේදන කාර්යයන් විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා ද*

*පද්ධති හා ක්‍රම විශ්ලේෂණය හා වර්ධනයත්, පරිගණක තාක්ෂණය හා ඒ ආශ්‍රිත කටයුතු විධිමත් හා පුළුල් කිරීම සඳහා ද තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීම සඳහා ද ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද, 2000 අංක 06 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා වූ ද ප්‍රඥප්තියකි"*යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව සභා රීති ප්‍රකාරවය ප්‍රඥප්තියේ පළමුවර කියැවීමේ වැඩ කටයුතු අවසන් වුණා. මීළඟට මෙම ප්‍රඥප්ති කෙටුම්පත දෙවනවර කියැවීමට දිනයක් නියම කර ගත යුතුව තිබෙනවා. ඒ වාගේම ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීමද සලකා බලා දෙවනවර කියැවීමට දිනයක් නියම කර ගැනීමට අවස්ථාව.

මීළඟට තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු. නමුත් මේ වනවිට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාවක් මා වෙත ඉදිරිපත් කර තිබෙනවා. මම විශ්වාස කරනවා මේ වනවිට එම යෝජනාව ඔබතුමන්ලාට ලැබිලා ඇති.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම රීති ප්‍රශ්නයක් මතු කරන්නේ. මේ සභාවේ කාර්ය පටිපාටි රීති යටතේ තිබෙනවා අපි මොකක් හරි මාතෘකාවක් සම්බන්ධයෙන් සාකච්ඡා කළාට පස්සේ මාස 06 ක් යනතුරු ඒ පිළිබඳව සාකච්ඡා කරන්න බැහැයි කියලා. එතකොට සාමාන්‍යයෙන් උතුරේ මහ ඇමැති කියන්නේ ජාතිවාදියෙක්. එතුමා මාස 06 ක් යනකල් ඉන්නේ නැහැ, ජාතිවාදය කථා කරන්න. එතුමා මාසයක් දෙකක් ඇතුළත ජාතිවාදී මොනවා හරි දෙයක් කියනවා. එහෙම මොනවා හරි කිව්වාට පස්සේ අපට මේ රීතිය යටතේ මේවා සාකච්ඡා කරන්න බැහැ. මීට පෙර එතුමා කරපු ප්‍රකාශයක් සම්බන්ධව මේ සභාවේ සාකච්ඡාවට ලක් වුණා. ඒ නිසා මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒ සභා රීතිය කඩ නොකර මේ සම්බන්ධව සාකච්ඡාවට නොගන්නා ලෙසට මගේ පැත්තෙන් අදහස් ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද කියලා ඇත්තටම මේ යෝජනාවට ගැළපෙන්නේ නැහැ. එතුමා විසින්ම ක්‍රීඩා උත්සවයේදී තීන්දු කළා. ඒ නිසා මේ යෝජනාවට අපි විරුද්ධ වෙනවා. එහෙම නම් ඡන්ද විමසීමක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ - මම හිත්නනේ ඔබතුමන්ලාට යෝජනාව ලැබිලා ඇති නේද?

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරු වශයෙන් අපට ඒ යෝජනාව තවම ලැබිලා නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉන්න බෙදනවා. මම යෝජනාව ප්‍රකාශ කළාම තමයි ඒක බෙදන්නේ. ඊට කලින් බෙදන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අපි ඡන්දයක් විමසමු.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මීට පෙර ආදර්ශයක් තිබෙනවා. අපි සණස තැන්පත්කරුවන්ගේ ප්‍රශ්නය ගෙනාවට පස්සේ යෝජනාව ගෙනාවේ නැහැ. ඊට කලින් ඡන්දය විමසුවා. දැන් මගේ පැත්තෙන් විරුද්ධත්වයක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඔබතුමා ඡන්ද විමසීමක් කරන්න ඒ සම්බන්ධව. මම මේකට විරුද්ධ වෙනවා. මේ රීති අත්හිටුවීමට මම විරුද්ධ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කිරීමට පෙරාතුව රීති අත්හිටුවීමේ යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, දැන් මේ යෝජනාව බෙදාගෙන යනවා. දැන් මේකේ තියෙන්නේ පසුගියදා කරන ලද

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

ප්‍රකාශයක් කියලා. ජනමාධ්‍ය මඟින් දැන ගන්න ලැබුණේ නැත්නම් මොකක්ද මේ ප්‍රකාශය කියලාවත් අපි දන්නේ නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

දන්නේ නැහැ නේ ගරු සභාපතිතුමනි. මේක විහිළුවක් නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකක්ද මේ යෝජනාව. මට නම් තේරෙන්නේ නැහැ. මොකක්ද කරපු ප්‍රකාශය කියලාවත් දන්නේ නැහැ. ඇත්තටම මේක අනවශ්‍ය වැඩක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක වෙලාව නාස්ති කරන වැඩක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කිසිම හදිසියක් නැහැ මේකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ යෝජනාව ඔබතුමා භාර ගැනීමත් අපට ගැටළුවක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරු ලකුණු දාගන්න. ජාතිය අවුස්සන යෝජනාවක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කොල කැල්ලක් බෙදලා නිකන් කාලය නාස්ති කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක ලකුණු දාගන්න කරන වැඩක්.

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

ගරු සභාපතිතුමනි, මේ උතුරු පළාතේ මහ ඇමැති කවුද? උතුරු පළාතේ මහ ඇමැති කවුද? මේ වාගේ මහ ඇමැති කෙනෙක් නැහැ. මේ යෝජනාවේ තියෙන්නේ කේ. විග්නේෂ්වරන් කියලා. එහෙම මහ ඇමැති කෙනෙක් උතුරේ නැහැ. උතුරේ ඉන්නේ සී.වී. විග්නේෂ්වරන්. මේක වැරැදියි. මේකේ තියෙන්නේ කේ. විග්නේෂ්වරන් කියලා. මේක වැරැදියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම හදාගමු.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේකේ පැහැදිලිව උතුරු පළාත් සභාවේ මහ ඇමැති කියලා තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද රීති අත්හිටුවීමේ යෝජනාවට ඡන්දය විමසීමේ අවස්ථාව.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 38 යි, විරුද්ධව 30 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and the Council divided as per Rule No 61 (3), 38 for, 30 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් අද උදේ 09.20 ට රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. න්‍යාය පත්‍රයේ වැදගත් දේවල් අවසන් කරලා මම තීරණය කළා, එතුමාගේ රීති අත්හිටුවීමේ යෝජනාව සභාවේ සාකච්ඡාවට ගන්න.

නමුත් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් එනම් විපක්ෂයේ ප්‍රධාන සංවිධයාකතුමා සහ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමට විරෝධතාවය ප්‍රකාශ කළා. යෝජනාවට නොවෙයි. රීති අත්හිටුවීමට. ඒ නිසා මට සිදු වුණා ඡන්දයකට යන්න. ඒ අනුව පක්ෂව 38 ක්ද, විරුද්ධව 30 ක්ද, වැළකුණු 00 ක් යනුවෙන් ඡන්දය පාවිච්චි කළා. ඒ අනුව ඔබතුමන්ලා විසින් විරෝධතාවය ප්‍රකාශ කළ රීති අත්හිටුවීමට පක්ෂව වැඩි ඡන්ද 08 ලැබුණු බව මම ප්‍රකාශ කරනවා. ඒ අනුව එම යෝජනාව සභාවේ සාකච්ඡාවට ගැනීමට සිදු වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපි මේ යෝජනාව ගෙන එනවාට විරුද්ධ වුණේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව නොවෙයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

රීති අත්හිටුවීමට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අතරමැද කථා එපා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, එහෙම කරුණු පැහැදිලි කරන්න දෙන්න එපා. අපේ කාලය අපරාදේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගන්න වැඩ කටයුත්ත -

[සභාවේ ඝෝෂා]

අපි මේ යෝජනාව විරෝධතාවය දක්වලා සභාවෙන් පිට වෙලා යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද, පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව ඊට අනුශාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
## PRIVATE MEMBERS MOTION :
# උතුරු පළාත් ප්‍රධාන අමාත්‍ය සී.වී. විග්නේෂ්වරන් මැතිතුමාගේ ජාතිවාදී ප්‍රකාශ හෙළා දැකීම

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව සංශෝධන සහිතව ඉදිරිපත් කරනවා.

*"උතුරු පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය සී.වී. විග්නේෂ්වරන් මැතිතුමා විසින් පසුගිය දා කරන ලද ජාතිවාදී ප්‍රකාශයන් දැඩි පිළිකුලෙන් යුක්තව හෙලා දැයි යුතු යැයි මෙම ගරු බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටී."*

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*Question proposed*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් එක්ක මෙය මතු කරන්නේ. එතුමා ඒ යෝජනාව කරනවා නම් හොඳයි. සී. විග්නේෂ්වරන් මහතා කරන ලද ප්‍රකාශයන් කියලා තියෙන්නේ. මොනවාද කරන ලද ප්‍රකාශයන් කියලා නිශ්චිත නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජාතිවාදී.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මෙන්න මේ මේ ප්‍රකාශයන් කියලා සභාවට කිව්වා නම් වඩාත් පැහැදිලි වෙයි අපට සාකච්ඡා කරන්න ඕනෑ කාරණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මෙතැන කියලා තිබෙනවා ජාතිවාදී ප්‍රකාශයන් කියලා. ජාතිවාදී ප්‍රකාශ විතර නේ? අනෙක් ප්‍රකාශ ගැන කථා කරලා නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාව සඳහා ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ කථික ලැයිස්තු මට ලැබිලා තිබෙනවා. කථාවලට අවස්ථාව ලබා දෙන්න කලින් මම පොඩි නිවේදනයක් කරනවා. අපි සභාව ආරම්භ කරන අවස්ථාවේ කිව්වා තේ විවේකයේදී පොඩි සාකච්ඡාවක් කරමු කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (3) අනු ව්‍යවස්ථාව අනුව පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා එවා ඇති ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත් කෙටුම්පත අද උදැසන සභාවට ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී මෙම සභාවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලද පරිදි ඒ පිළිබඳව අද තේ විවේක අවස්ථාවේදී පැවැති සභා කටයුතු කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කළා.

එම පනත් කෙටුම්පත සම්බන්ධව අදහස් දැක්වීම සඳහා ලබා දී ඇති කාලය ප්‍රමාණවත් නොවන බැවින් 2016.10.18 වන දින සභා රැස්වීමේදී පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර සභාවේ අදහස් දන්වා යැවීමට හැකි වන පරිදි අවශ්‍ය කාලය ලබා දෙන ලෙසට ගරු ආණ්ඩුකාරතුමා වෙතින් ඉල්ලා සිටීමටත්, පනත් කෙටුම්පතේ අඩංගු කරුණු සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හෝ සුදුසු නිලධාරියෙකු සමග සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සාක්ච්ඡාවක් 2016.10.11 වන දින පෙ.ව. 09.30 ට පැවැත්වීමටත්, පනත් කෙටුම්පත සම්බන්ධයෙන් 2016.10.18 වන දින සභා රැස්වීමේදී කාර්ය පටිපාටි රීති 63 අ (2) හා (3) විධිවිධානයන්ගෙන් නිදහස්ව සාකච්ඡා කිරීමට සුදුසු බවටත් තීරණය කළ බව ඔබතුමන්ලා වෙත මෙයින් දැනුම් දෙනවා.

එම දැනුම් දීමෙන් අනතුරුව අපි කථා කරමින් ආපු යෝජනාව සම්බන්ධව අදහස් දැක්වීමට නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමායට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා. එතුමිය සභා ගර්භයේ නැහැ. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් වෙන් වී තිබෙනවා.

[ අ.භා. 12.24 ]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අපි කනගාටු වෙනවා උතුරේ මහ ඇමැතිතුමා සී.වී. විග්නේෂ්වරන්

මැතිතුමා මේ විටින් විට කරන ජාතිවාදී ප්‍රකාශයන් පිළිබඳව. මොකද, අපි දන්නවා, මේ රටේ අවුරුදු 30 ක් පමණ යුද්ධයක් තිබුණා. මේ යුද්ධයෙන් සිංහලද, දෙමළද, මුස්ලිම්ද, බර්ගර්ද කියලා නැහැ. අපි ජාතීන් හැටියට සියලු දෙනාම මේ යුද්ධයෙන් බැට කෑවා. යුද්ධයෙන් පුදුම දුකක් වින්දේ. ඉතින් ඒ වාගේ තිබුණු රටක්. අපට මතකයි ගිය කාල සීමාවේදී අපේ රජය සමයේ මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ඒ රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් මේ යුද්ධය අවසන් කරලා, රටේ සාමය ඇති කළා. මේ සාමය ඇති වුණාට පස්සේ සියලුම දෙනා, සියලුම ජාතීන් ලාංකිකයන් හැටියට අද බොහොම සාමයෙන් ජීවත් වනකොට අපි කනාගටු වෙනවා, අපේ උතුරේ මහ ඇමැතිතුමා පිළිබඳව. සී.වී. විග්නේෂ්වරන් මැතිතුමා පිළිබඳව. මේ වාගේ ජාතිවාදී ප්‍රකාශයන් කරලා මේ රට නැවත එදා තිබුණු යුද්ධ සමයේ කාලයට ගෙන යෑමට කටයුතු කිරීම පිළිබඳව. මේක අපි දකින්නේ තමිල්නාඩුවේ ජයලලිතා මහ ඇමැතිතුමියලා, කරුණානිධිලා, මේ වාගේ අය කරන දේශපාලනය හා සමාන දේශපාලනයක් තමයි විග්නේෂ්වරන් මහ ඇමැතිතුමා කරන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලිවම අපි දන්නවා, සී.වී. විග්නේෂ්වරන් මහත්මයා ඉපදුණේ, හැදුණේ වැඩුනේ, ඒ වාගේම අධ්‍යාපනය ලැබුවේ මේ සියල්ල කළේ කොළඹ ප්‍රදේශයේ. මම හිතන්නේ අවුරුදු 70 කට ආසන්න කාලයක් කොළඹ ප්‍රදේශයේ ජීවත් වුණේ. එතුමා මේ මහ ඇමැතිකමට තමයි උතුරු ප්‍රදේශයට යන්නේ. මේ උතුරු ප්‍රදේශයේ ඉපදුණු කෙනෙක්, උතුරු ප්‍රදේශයේ පයගහපු කෙනෙක්, මේ මහ ඇමැතිකමේ හිටියා නම් මේ වාගේ ප්‍රකාශ කරන්නේ නැහැ. ඇයි? ප්‍රදේශයේ අය තමයි දන්නේ. මේ යුද්ධයේ වැඩි පුරම අමිහිරි අත්දැකීම් තිබෙන්නේ ඒ ප්‍රදේශයේ අයට. ද්‍රවිඩ වේවා, සිංහල වේවා, මුස්ලිම් වේවා ඒ අයට. අද ඒ අය අතරින් කෙනෙක් මෙතැන මහ ඇමැති වුණා නම් නැවත යුද්ධයකට අත වනන්නේ නැහැ. මේ විග්නේෂ්වරන් මහත්මා කරන දේවල්වලින් වෙන්නේ නැවත යුද්ධයකට අත වැනීමක්. අපි විග්නේෂවරන් මහත්මයාගෙන් අහන්න කැමැතියි උදාහරණයකට ගත්තාම බස්නාහිර පළාතේ සිංහල අය ඉන්නවා. ද්‍රවිඩ අය ඉන්නවා. මුස්ලිම් අය ඉන්නවා. බර්ගර් ඉන්නවා. මේ වාගේ නොයෙකුත් ජාතීන් ඉන්නවා. මේ සියලු ජාතීන් ඉතාමත් සමගියෙන් ඉන්නවා. අද පළාත් සභාව හැටියට ගත්තාම පළාත් සභාවේ මන්ත්‍රීවරු ඉන්නවා එක එක ජාතීන්වලට අයිතිය. නමුත් අපි සියලු දෙනා සමගියෙන් කටයුතු කරනවා. වාද භේද තියෙන්න පුළුවන්. නමුත් ප්‍රතිපත්තිවල වෙනස්කම් තියෙන්න පුළුවන්. නමුත් ලාංකිකයන් හැටියට අපි සමගියෙන් ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දන්න තරමින් ද්‍රවිඩ ජනතාවගේ මුළු ජනගහනයෙන් 48% ක් උතුරු - නැගෙනහිර ප්‍රදේශයේ ජීවත් වෙන්නේ. හැබැයි සියලු පළාත්වල වැඩිපුර මේ 52% ක් ජීවත් වෙන්නේ අනෙකුත් ප්‍රදේශවල. ඒ අයට මොකක්ද මේ දෙන පණිඩිය. ඉතින් ඒ නිසා අපි විග්නේෂ්වරන් මහත්මයාගෙන් ඉල්ලා සිටිනවා මේ වාගේ ජාතිවාදී අදහස්, ජාතිවාදී ප්‍රකාශ කරන්න එපා. මොකද, එතුමාට බලයේ ඉන්න උවමනාවට, එතුමා කවදාවත් මේ වාගේ තනතුරු දරලා නැහැ. එතුමාට කවදාවත් ද්‍රවිඩ ජාතිකයෙක් කියලා අසාධාරණයක් වෙලත් නැහැ. මේ රටේ නිදහස් අධ්‍යාපනය ලැබුවා. තිබෙන උසස්ම තනතුර හෙබෙව්වා. මේ උසස්ම තනතුර හොබවලා විශ්‍රාම ගිහිල්ලා තමයි අද මේ මහ ඇමැතිකමට යන්නේ. ඉතින් එතැනට ගියාට පස්සේ අත්දැකීම් නැහැ. මේක කරගෙන යන්න බැරි වනකොට බැලුවා, මේ ප්‍රදේශයේ අවුරුදු 30 ක් විතරම මේ දරුවන්ට ගොඩක් වෙලාවට අධ්‍යාපනය ලබන්න වුණේ නැහැ. වැඩි පිරිසකට ඒ අධ්‍යාපනය ලබන්න බැරිකමත් එක්ක මෙතුමා බැලුවා අධ්‍යාපනය නොලබපු ගොඩක් අය ඉන්න කොට මේ ප්‍රකාශවලින් තමයි නැවත එයාගේ බලය තියාගන්න පුළුවන් කියලා.

ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මේ විග්නේෂ්වරන් මැතිතුමාට. මේ වාගේ ප්‍රකාශ කරලා නැවත නැවතත් රට ගිනි ගොඩකට ඇදලා දාන්න එපා. නැවත නැවත ද්‍රවිඩ ජනතාව මේ තත්ත්වයට ඇදලා දාන්න එපා. අපි සියලු දෙනා බොහොම සමගියෙන් ඉන්නේ. ඒ නිසා අපි මහ ඇමැතිතුමාට කියනවා, මේ ප්‍රකාශ වහාම ඉල්ලා අස්කර ගන්න. ඉල්ලා අස්කරගෙන කටයුතු කරන්න කියලා. ඒකත් එක්කම අපි ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් කියනවා මේ විධියේ ප්‍රකාශ කරනවා නම්, මේ රටේ ජාතිවාදය අවුස්සන්න ප්‍රකාශ කරනවා නම් මේ වාගේ අයව මහ ඇමැතිකම්වල තියාගන්න එපා. වහාම මහ ඇමැතිකම්වලින් අයින් කරන්න. අයින් කරලා නීත්‍යානුකූලව ඒ දෙන්න ඕනෑ දඬුවම් දෙන්න. නැත්නම් මේවා දිගින් දිගට ගියොත් එහෙම නැවත යුද්ධයකට යනවා. යුද්ධයකට ගිහිල්ලා විශාල ප්‍රශ්නයකට රට මුහුණ දෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පළාත් සභාවක්

[ගරු ලලිත් එල්ලාවල ]

හැටියට මේ විටින් විට කරන්නා වූ ප්‍රකාශයන් පිළිබඳව, ජාතිය ඇවිස්සීමේ ප්‍රකාශයන් පිළිබඳව අපේ කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. කනගාටුව ප්‍රකාශ කරමින් අපි මෙහෙම දෙයක් දකිනවා. අපට එක වෙලාවකට හිතෙනවා මෙහෙම ප්‍රකාශ කරන්නේ, විග්නේෂ්වරන් මහත්මයා විතරක් නොවෙයි වෙන්න පුළුවන්. මේ විධියට මස් රාත්තලම ඉල්ලලා තව ටිකක් කල් යනකොට සමහර දෙමළ අන්තවාදී නායකයන් කියන්න පුළුවන් මේ ප්‍රශ්නය විසඳන්නේ මෙහෙම නොවෙයි. අපි මේ මස් රාත්තලම නොවෙයි, මේකෙන් භාගයක් අරගෙන මේක විසඳමු කියලා. ඒ තැනට එන්නට ඉඩ තිබෙනවා. මට සැකයක් තිබෙනවා මෙතැනට එන්නදෝ මේක කරන්නේ කියලා. මේ වාගේ මහා ජාතිවාදී කථා කියලා මේ මස් රාත්තලම ඉල්ලලා අවසානයේ ඒ තැනට එන්න තමයි මේ සූදානම් වෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ඒ තැනට එන්න සූදානම් වෙන්න එපා. නැවත රට යුද්ධයකට ඇද දමන්න එපා. මේ යුද්ධයෙන් අවුරුදු 30 ක් තිස්සේ සියලු ජාතීන් පීඩාවට පත් වුණා.

අපි මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. අපේ රජයේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, එදා හිටපු ඒ රණවිරුවන්ටත් අපේ ගෞරවනීය ප්‍රණාමය, ස්තුතිය පුද කරනවා. අද රට ඒ තත්ත්වයෙන් බේරා ගැනීම පිළිබඳව. නැවත ඒ තැනට ඇද දමන්න එපැයි කියන එක අපි විග්නේෂ්වරන් මැතිතුමාට මතක් කරමින්, පැහැදිලිවම ඒ කරන්නා වූ ජාතිවාදී ප්‍රකාශයන් පිළිබඳව අපේ කනගාටුව, අප්‍රසාදය පළ කරනවා කියන එක මතක් කරන්න කැමැතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

[ අ.භා. 12.30 ]

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දින කිහිපයකට පෙර උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කරන ලද මේ ප්‍රකාශය සම්බන්ධයෙන් එයට විරෝධතාවය පළ කිරීමේ මේ යෝජනාවේදී මා තරමක වෙනස් අදහසක් දරන්නේ. විශේෂයෙන්ම මේ අපි සාකච්ඡාවට බඳුන් කරන ප්‍රකාශයට අනතුරුව ජනාධිපතිවරයාත්, ඒ වාගේම ආණ්ඩුකාරවරයාත් ඉදිරිපිටදී විග්නේෂ්වරන් ප්‍රධාන අමාත්‍යවරයා තමන්ගේ ප්‍රකාශය සිංහලට පරිවර්තනය කරලා සිංහලෙන් මේ කථාව පැහැදිලි කිරීමක් කරනවා. ඔහු එහිදී කිසියම් වචනයක් පාවිච්චි කරනවා. මම බැගෑපත්ව ඉල්ලා සිටිනවා කියලා. ඔහු ඉල්ලීමක් කරනවා, තමන්ගේ ප්‍රකාශය වැරැදි ලෙස අර්ථ කථනය කරන්නට එපාය කියලා. මේ කාරණාවේදී මම සියයට සියයක්ම ප්‍රධාන අමාත්‍ය විග්නේෂ්වරන් මහතාගේ අදහසට එකඟ වන්නේ නැහැ. මක් නිසාද, සමහර දේශපාලඥයින් විශේෂයෙන්ම විවිධ ජනවාර්ගික පදනම් නියෝජනය කරන දේශපාලන නායකයින් අපේ රටේ විවිධ ප්‍රදේශවලට ගියාම දිව දෙකකින් කථා කරන්නේ.

අපි දන්නවා අපේ සමහර දේශපාලන පක්ෂ නායකයින් කොළඹදී සිංහල භාෂාවෙන් හරි, ඉංග්‍රීසි භාෂාවෙන් හරි කරන ප්‍රකාශ නොවෙයි එරාවුර්වලට ගියාම, මඩකලපුවට ගියාම, අකුරනට ගියාම කරන්නේ. ඔවුන් වෙනත්ම ප්‍රකාශයක් දමිළ බසින් කරනවා. දමිළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු කොළඹදී පාර්ලිමේන්තුවේදී කරන ප්‍රකාශයන් නොවෙයි තමන් නියෝජනය කරන ඡන්ද කොට්ඨාශවලට ගියාම ඒ ජනතාව ඉදිරියේදී කරන්නේ. මෙතැනදී බොහොම පැහැදිලි වන කාරණය තමයි අවසානාත්මක වශයෙන් තමන්ගේ දේශපාලන උවමනා එපාකම් වෙනුවෙන් මේ දේශපාලන නායකයින් අඩුවැඩි වශයෙන් ජාතිවාදය උපයෝගී කර ගන්නවා කියන එක. අද මේ රටේ ප්‍රධානතම දේශපාලන පක්ෂ සියල්ලම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ගේ දේශපාලන ගමන් මග යන්නට ජාතිවාදය පාවිච්චි කරනවා. මම ඉතාම කනගාටු වෙනවා. අද මේ මොහොත වනකොට මෙතැන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් නොමැතිවීම පිළිබඳව. ඔවුන් කිව්වා, සංහිඳියාව ගැන කථා කරන මෙවන් අවස්ථාවක මේ යෝජනාව ගෙනාපු එක වැරැදියි කියලා. වැරදි නම් වැරැදියි කියන එක සාකච්ඡා කරන්නට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට කොන්දක් තිබෙන්නට ඕනෑ. අද එක්සත් ජාතික පක්ෂය කටයුතු කරන්නෙත් ජාතිවාදය කියලා කිසියම් පිරිසකට ඇඟිල්ල දික් කරලා අනෙක් පැත්තෙන් ඔවුන් ජාතිවාදය පදනම් කරගත්තු ඡන්ද පදනමක් කරා ගමන් කරන ගමන් මගක යන්නේ. මේ රටේ මැතිවරණ ක්‍රමය අධ්‍යයනය කරන ඕනෑම දරුවෙකුට තේරෙනවා, මේ රටේ ජනගහනයේ ප්‍රතිශතය අනුව සුළු ජාතික ඡන්ද නොමැතිව බහුතර රජයක් පිහිටුවන්නට බැරි බව. එහෙම නම් සුළු ජාතික ඡන්ද ටික ඉලක්ක කරගෙන

තමන් ජාතිවාදී නැහැයි කියලා ජාතිවාදී පදනමක ඉඳලා දේශපාලනය කරන දේශපාලන පක්ෂ අද අපේ රටේ තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට අද දවසේ ඔවුන් මේ ගත්තු තීරණයත් එක්ක මම සෘජුව ඇඟිල්ල දික් කරලා කියනවා, ඔවුන් කරන්නේ එවැනි දේශපාලනයක්. තමන් ජාතිවාදී නැහැයි කියලා, සංහිඳියාවකට යා යුතුයි කියලා ඔවුන් කරන්නේ ජාතිවාදී දේශපාලනයක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අද අපි දන්නවා. අපේ රටේ විපක්ෂ නායකවරයා ද්‍රවිඩ ජාතික සන්ධානය නියෝජනය කරන්නේ. නමුත් පසුගිය අගෝස්තු 25 වැනිදා කැනඩාවේ ඉහළම අධිකරණය, ෆෙඩරල් අධිකරණය නඩු තීන්දුවක් ලබා දෙනවා, ද්‍රවිඩ ජාතික සන්ධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු සම්බන්ධයෙන්. මේ අධිකරණ තීන්දුව අවශ්‍ය නම් මට සභාගත කරන්නට වුණත් පුළුවනි. ඔටාවාවල ෆෙඩරල් අධිකරණය මේ තීන්දුව ලබා දීලා කියනවා. මේ තීන්දුව ප්‍රකාශයට පත් කරන්න හේතු වෙන්නේ, සීනියන් විජේරත්නම් නැමැති - ULF, TNA ආදී වශයෙන් ද්‍රවිඩ ජාතික සන්ධානයේ නොයෙකුත් පක්ෂ නියෝජනය කරමින් අවසානයේ ආර්. සම්බන්දන් මහතාගේ මැතිවරණ ව්‍යාපාරයට සක්‍රියව දායක වුණු සීනියන් මහතා කැනඩාවට ගිහිල්ලා දේශපාලන රැකවරණය ඉල්ලනවා. මුලින් ඒක ප්‍රතික්ෂේප වෙනවා. ඔහු ඇපීල් කරනවා. ඇපීල් එකත් ප්‍රතික්ෂේප වෙනවා. ඔහු ෆෙඩරල් අධිකරණයට ගිහිල්ලා ඇපීල් කරනවා. ෆෙඩරල් අධිකරණය පසුගිය අගෝස්තු 25 වැනිදා තීන්දුවක් දෙනවා. දීලා කියනවා, ද්‍රවිඩ ජාතික සන්ධානය කියන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානයට සෘජුව සහ වක්‍රව උදව් කරන ලද සංවිධානයක්. ඒක නිසා ඔවුනුත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ කොටසක්. ඒ අනුව ඔවුනුත් ත්‍රස්තවාදී සංවිධානයක්. මේ කියන සීනියන් නැමැති පුද්ගලයා ඒ සංවිධානයේ ආර්. සම්බන්දන් මහතා සමග සක්‍රීයව දේශපාලනය කළා. ඒ අනුව මොහුත් ත්‍රස්තවාදියෙක්. ඒ නිසා මොහුට මේ පුරවැසිභාවය, දේශපාලන රැකවරණය දිය යුතු නැහැයි කියලා. මේ ඊයේ පෙරේදා අගෝස්තු 25 වැනිදා ඔටාවා නුවර ෆෙඩරල් අධිකරණය තීරණය කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක පිටිපස්සේ තිබෙන ගැඹුරු අර්ථය හිතලා බලන්න. අපේ රටේ විපක්ෂ නායකවරයා ත්‍රස්තවාදියෙක් කියලා කැනඩාවේ ප්‍රධානතම අධිකරණය තීරණය කරනවා. මේවා මාධ්‍යවලින් සාකච්ඡා කරන්නේ නැහැ. නමුත් මේක තමයි ඇත්ත සත්‍යය. එතකොට මෙවැනි වාතාවරණයක් තුළ අපි සංහිඳියාවට යන්නේ කොහොමද? ජනතා නියෝජිතයින් විධියට මේ සභාවේ සියලුම මන්ත්‍රීවරු මේ ගැන හිතා බලන්න ඕනෑ. අපට බැහැ සම්බන්දන් මහත්තයා ත්‍රස්තවාදියෙක් කියලා එතුමාගේ අදහස් හෝ එතුමා මේ රටේ විපක්ෂය නියෝජනය කිරීම ප්‍රතික්ෂේප කරන්නට. ප්‍රජාතන්ත්‍රවාදීව එතුමාට ඒ අවස්ථාව ලැබිලා තිබෙනවා. එහෙම නම් අපි ඉන්නේ ඉතාමත් බැරෑරුම් ලෙස මේ සිද්ධිය, මේ වාතාවරණය සලකා බැලිය යුතු අවස්ථාවක.

අපි දන්නවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නොයෙකුත් අවස්ථාවල, නොයෙකුත් කාරණා සිද්ධ කරනවා, තමන්ගේ සංහිඳියාවේ සංකල්පය දමිළ ජනතාව කෙරෙහි පතුරුවා හරින්නට. තමන්ව මරන්න ආපු එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදියාව ඔහු නිදහස් කරනවා. ඔහු ත්‍රස්තවාදී සැකකරුවන් නිදහස් කරනවා. මේ කිරීම හරහා ඔහු බලාපොරොත්තු වෙනවා ඇති යම් ආකාරයකට සංහිඳියාවක් වර්ධනය කරන්නට. නමුත් ජනාධිපතිවරයාට තනිවම කරන්න පුළුවන් කාරණාවක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය, එහෙම නැත්නම් අනෙකුත් දේශපාලන පක්ෂ තවත් පිරිසකට ජාතිවාදී කියලා අත දික් කරද්දී, ඒ හරහා ඔවුන් බලාපොරොත්තු වෙනවා තමන්ගේ මනාප ඡන්ද ප්‍රමාණය වැඩි කර ගන්න. මෙතැන අපේ ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා නැහැ. එතුමා හිටියා නම් මම පෙන්වලා දෙනවා. තනිකර ජාතිවාදී පදනම පදනම් කරගෙන වෙනත් දිස්ත්‍රික්කයක ඉඳලා ඇවිල්ලා පසුගිය මැතිවරණයේදී එතුමන්ලාගේ මනාප ටික අරගෙන, එතුමා අදත් පළාත් සභාවේ ඉඳිද්දී පාර්ලිමේන්තුවට ගිය මන්ත්‍රීවරු එතුමා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්නවා. තනිකර ජාතිවාදී පදනමින් කළුතර ඉඳලා ඇවිල්ලා මේ අය ඡන්ද ටික ලබා ගන්නේ. හැබැයි මේ ජාතිවාදී පදනම එපාය කියන පිරිසම තමයි ජාතිවාදය වර්ධනය කරලා ඡන්ද ලබා ගන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දකුණේ ජනතාවටත් ප්‍රශ්න තිබෙනවා. සිංහල ජනතාවටත් ප්‍රශ්න තිබෙනවා. ඒ අයගේ සහෝදරවරු තමයි අද අඬු කඩාගෙන පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට වෙලා ඉන්නේ. ඒ අයගේ පවුල්වල අය යුද්ධයට ගිහිල්ලා මැරිලා. ඒ අය බෝම්බ පහරවල් කාලා, ඒ අත්දැකීම් විඳලා තිබෙනවා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා දැන් මොහොතකට කලින් කිව්වා

[ගරු සුසාර දිනාල් ]

රණවිරුවෝ විඳපු වේදනාව, දුක, කම්කටොළු පිළිබඳව. ඒ අයටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම තමයි උතුරේ ජනතාවටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ මිනිස්සුන්ට ඔප්පු තිබෙනවා. ඒ මිනිස්සු පාරම්පරිකව ඉඩම් භුක්ති විඳලා තිබෙනවා. හැබැයි අද ඒ මිනිස්සුන්ට ඒ ඉඩම්වලට යන්න විධියක් නැහැ. ඒ ජනතාවටත් ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නම් ඒ ප්‍රශ්න දෙක එක වේදිකාවකට ගෙනැල්ලා සාකච්ඡා කරන්න, මම අහනවා මේ යහපාලන රජය මේ වනකොට අරගෙන තිබෙන පියවර කුමක්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිසිඳු පියවරක් අරගෙන නැහැ. කාට හරි ඇඟිල්ල දික් කරලා ජාතිවාදී කියලා කෑගහනවා මිසක, මේ වාර්ගික ප්‍රශ්නය විසඳන්න රජය කිසිම සක්‍රිය වැඩ පිළිවෙළක්, කිසිම වේදිකාවක් තනලා නැහැ. උතුරේ ජනතාවගේ තිබෙන ප්‍රශ්න, ඔවුන් තුළ විශ්වසනීයත්වයක් ඇති කිරීම මෙන්ම දකුණේ ජනතාව තුළ වර්ධනය වෙමින් පවතින සැකය දුරු කරන්න කිසිඳු ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් කරලා නැහැ. දකුණේ ජනතාව බයේ ඉන්නවා බුද්ධි අංශ සාමාජිකයින් අත්අඩංගුවට ගන්නවා කියලා. දකුණේ අය බයේ ඉන්නවා ආරක්ෂක නිලධාරීන් පෝරකයට ගෙනියනවා කියලා. ඔවුන්ගේ ඒ බය සැක තුරන් කරන්නට ඕනෑ. ඒ වාගේම තමයි උතුරේ ජනතාවට තමන්ගේ මූලික අයිතිවාසිකම් ටික ආරක්ෂා කරලා දෙන්න වැඩ පිළිවෙළක් කරන්න ඕනෑ. අන්න එහෙම නම් මේ පළාත් සභාව විධියට අපටත් වගකීමක් තිබෙනවා.

අපි පළාත් සභා මන්ත්‍රීවරුන් විධියට අපේ මහ ඇමැතිතුමාට පුළුවනි විග්නේෂ්වරන් මහ ඇමැතිතුමාට කථා කරලා කියන්න, අපි එකතු වෙලා සංහිඳියාවේ සාකච්ඡාවක් ආරම්භ කරමු කියලා. අපෙත් බස්නාහිර පළාතේ ඕනෑතරම් සුළු ජාතීන් ඉන්නවා. ඒ අය අපේ පළාත් සභාවේ ඡන්ද පදනම උදෙසා අති විශාල කාර්ය භාරයක් සිද්ධ කරනවා. එහෙම නම් අපි මේ සාකච්ඡාව කොතැනකින් හරි ආරම්භ කළ යුතුයි. මේ ආකාරයට උතුරේ මහ ඇමැතිවරයා මෙවැනි ප්‍රකාශ කරන්නේ ඇයි? මේ මහ ඇමැතිවරයා මෙවැනි ප්‍රකාශ කරන්නේ තනිකරම තමන්ගේ ඡන්ද පදනම වෙනුවෙන්. තනිකරම තමන්ගේ ඡන්ද පදනම වෙනුවෙන් තමයි මේ ආකාරයේ ප්‍රකාශ කරන්නේ. ඔහුට අවශ්‍යයි ඔහුගේ නායකත්වය පිළිගන්නා පිරිසක් උතුරේ හදාගන්න. එහෙම නම් උතුරේ මිනිස්සුන්ගේ ජාතිවාදය ඇවිස්සීම තමයි ඔහුගේ පරමාර්ථය. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දකුණේ අයත් කරන්නේ ඒක. මේ ප්‍රශ්නයෙන් ලිස්සලා යනවා. අද එක්සත් ජාතික පක්ෂය ලිස්සලා ගියා වාගේ. මම සතුටු වෙනවා අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේකට මුලින්ම විරෝධතාවය පළ කළත්, අවම වශයෙන් මේ විවාදය තුළ, එහෙම නැත්නම් මේ කථාව තුළ රැඳී සිටීම පිළිබඳව. ඒ පක්ෂයේ අදහස කිසියම් අවස්ථාවක අපට දැනගන්නට ලැබේවි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ තත්ත්වය ගැඹුරින් සලකා බැලිය යුතුය. පසුගිය අවුරුදු හැට හැත්තෑවක කාලය මුළුල්ලේම මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දේශපාලනය කළේ ජාතිවාදය අවුස්සලා. අද සියලුම දේශපාලන පක්ෂ දේශපාලනය කරන්න යන්නේ, ජාතිවාදය අවුස්සලා. ජාතිවාදීන් නොවෙයි කියලා පෙන්වන සමහර ඇමැතිවරු තමයි අද මේ රටේ දරුණුම ජාතිවාදීන්.

මම බොහොම ඍජුව ඒක මේ සභාවේ කියනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක් පැත්තකින් අපි සිංහල ජනතාව පිළිබඳව දකුණේ ජනතාව තුළ විශ්වාසනීයත්වය වර්ධනය කරන අතරතුරේම අනික් පැත්තෙන් අපි උතුරේ ජනතාව තුළ, පවුල් තුළ තිබෙන්නා වූ සැක, බිය, සංකා දුරු කිරීමට වැඩ කරන්න ඕනෑ. මේ යෝජනාවට අපි එකඟයි. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට මම හිස නමා ආචාර කරනවා. මොකද, මොන දේශපාලඥයෙක් ජාතිවාදී යෝජනාවන් ගෙනාවත්, මොන දේශපාලඥයෙක් ජාතිවාදී ප්‍රකාශයන් කළත් ඒක වැරදියි. ඕනෑම සභාවක් ඇතුළේ ඒ වෙනුවෙන් පෙනී සිටින්නට අපි පෙළගැසී සිටිනවා. හැබැයි, අපි එකක් මතක තබා ගත යුතුයි. තමන් ජාතිවාදීන් නොවෙයි කියන ඊනියා සංහිඳියාවාදීන් තමයි මේ රටේ සිටින දරුණුතම ජාතිවාදීන්. අන්න ඒක නිසා ඔවුන්ගෙන් ජනතාව ආරක්ෂා කළ යුතුයි. මම මේ කථාව ඇතුළේ මේ ගරු සභාවට යෝජනා කරනවා, හැකි නම් අපේ පළාත් සභාව මේ සංහිඳියාවේ සාකච්ඡාව ආරම්භ කරමු. අපි ප්‍රඥප්තියක් ගෙන එමු. උතුරේ මිනිස්සුන්ගේ ප්‍රශ්න දකුණේ මිනිස්සුන්ට ගෙන එමු. බස්නාහිර පළාතට ගෙන එමු. බස්නාහිර පළාතේ සිංහල මිනිස්සුන්ගේ තිබෙන ප්‍රශ්න, මුස්ලිම් මිනිස්සුන්ගේ තිබෙන ප්‍රශ්න අපි උතුරේ මිනිස්සුත් එක්ක සාකච්ඡා කරමු. අවසානයේ මේ සැකය තුරන් කරමු. අවසානාත්මක වශයෙන් මේ ආකාරයට ජාතිවාදී ප්‍රකාශ කරන සියලු දේශපාලඥයන්ව ශ්‍රී ලාංකික දේශපාලනයෙන් අතු ගා දමමු. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.43 ]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ගෙන ඒමේදී, රීති අත්හිටුවීමේ කාරණයේදී අපේ පැත්තෙන් විරුද්ධත්වය ප්‍රකාශ කළේ, ඇත්තටම අපි මේ සභාවේ වැඩ කටයුතු කරන්නේ සභා කාර්ය පටිපාටි රීති අනුව. ඒ අනුව අපි දන්නවා, මීට කලින් මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා මේ සභාවේ සාකච්ඡා කළා නම්, අඩුම ගණනේ මාස හයක් ඒ සඳහා ඉඩකඩ තිබෙන්න ඕනෑ නැවත එවැනි ආකාරයේ යෝජනාවක් ගේන්න. ඒ පැත්තෙන් තමයි අපි ඒක මතු කළේ. ඊළඟ එක තමයි, මේ යෝජනාව ගෙනැල්ලා අපි මේ මොකක්ද කරන්නේ? ජාතිවාදීයෙකුගේ මේ ජාතිවාදී ප්‍රකාශවලට අපි වටිනාකමක් දෙනවා. තවදුරටත් ප්‍රචාරයක් දෙනවා. අපිත් සාකච්ඡා කරනවා. බොහොම පැහැදිලිවම විග්නේෂ්වරන් මහත්තයා ඔප්පු කරලා තිබෙනවා, උතුරේ ජනතාවටත්, උතුරේ දෙමළ ජනතාවටත් මේ රටටත් තමන් අසාර්ථක දේශපාලඥයෙක් කියලා. තමන් අසාර්ථකයි කියලා ඔහු ඔප්පු කරලා ඉවරයි. අඩුම ගණනේ තමන්ට පළාතට ලැබෙන, ජනතාවට සේවය කරන්න ලැබෙන ඒ ප්‍රතිපාදන ටික පවා උතුරේ ජනතාව වෙනුවෙන් වැය කරන්න තමන් අසමත්, අසාර්ථක මිනිහෙක් කියලා ඔප්පු කරලා ඉවරයි.

ඒ නිසා විග්නේෂ්වරන් මහත්තයා අසාර්ථක දේශපාලඥයෙක්. එතුමාම ඒක දන්නවා. දැන් අපි මේ එවැනි අසාර්ථක වන මිනිහෙකුට මේ බස්නාහිර පළාත් සභාවේ වෙලාව වෙන් කර ගෙන, ඒ අසාර්ථක මිනිහෙකුගේ අසාර්ථක ප්‍රකාශයක් සම්බන්ධව අපි මේ සාකච්ඡා කරනවා. දැන් අපි මෙතැනින් නැගිටලා ගියාට පස්සේ, විග්නේෂ්වරන් මහත්තයා හෙටත් තව මේ වාගේ ජාතිවාදී ප්‍රකාශයක් කරයි. දැන් අපට තිබෙන්නේ, ඊළඟ සභාවේදීත් රීති අත්හිටුවන්නයි. අත්හිටුවලා ගෙනැල්ලා තව ටිකක් කථා කරන්න තිබෙන්නේ. ඇත්තටම යෝජනා යටතේ එතුමාගේ මේ ප්‍රකාශය සම්බන්ධව, මේ ජාතිවාදය සම්බන්ධව අපට අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. ඒ ගියවර ගෙනාපු යෝජනාවේදී කථා කරන්න ඕනෑ ටික මේ මම ම කථා කළා. ඒක අමුතු දෙයක් නැහැ. ඒ නිසා තමයි මේ යෝජනාව සාකච්ඡා කරන එකට අපි එකඟ නැත්තේ. හැබැයි අපට හිතෙනවා, මේක මේ විධියට සාකච්ඡා කරන එක අර විග්නේෂ්වරන් මහත්තයා අරහෙන් මොකක් හරි බෝලයක් උස්සලා දුන්නාට පස්සේ මේකේ ඩැෂ් පහර ගහන්න බලාගෙන ඉන්න කට්ටියට නම් හරි සතුටක්. ඒක ඒ අයට හොඳයි. ඒගොල්ලෝ බලාගෙන ඉන්නේ මේ එකක් උස්සලා දීපන් ගොයියෝ මේ වෙලාවේ අපට ඩැෂ් පහර ගහන්න කියලා. ඉතින් ඒ නිසා අන්න ඒ අයට කිසියම් ආකාරයේ සතුටක් මේ හරහා ඇති වෙයි. එහෙම නැතිව නම් මේ බස්නාහිර පළාතේ ජනතාවට සත පහක වටිනාකමක් මේ යෝජනාවේ සාකච්ඡාව ඇතුළත නැහැ. මේවා ගණන් ගන්නේ නැහැ. ඇත්තටම මේ විග්නේෂ්වරන්ගේ ප්‍රකාශ ගණන් ගන්නේ නැහැ. ඒක විග්නේෂ්වරන් මහත්තයාත් දැන් දන්නවා.

විශේෂයෙන්ම මම මේ වාගේම රීති අත්හිටුවලා යෝජනාවක් ගෙනාවා. අපි ඇත්තටම කල්පනා කරලා බලන්න ඕනෑ, අපි මොනවාද මේ සභාවේ මේ කථා කරන්නේ කියලා. මට මතකයි, ගියවර තමුන්නාන්සේලාගේ පැත්තේ අර මන්ත්‍රීතුමෙක් ඇත්තටම එතුමාට දැණුනු හැඟීම් එක්ක, මම හිතන්නේ කථා කළා. අපි මොකක්ද මේ පළාත් සභාවට එන කොට හිතාගෙන හිටියේ. දැන් අපි ඇවිල්ලා මොකක්ද කරන්නේ කියලා කියන එක සම්බන්ධව. ඇත්තටම එතුමා ඉතාම හොඳ කථාවක් කරලා තිබුණා. මොන අදහසකින් හරි අපට දැණුනු ආකාරයට, අපට හැඟුණු ආකාරයට ඇත්තටම එතුමා පශ්චාත්තාප වෙනවා, මේ පළාත් සභාවට ඇවිල්ලා මුකුත් කර ගන්න බැරි වීම සම්බන්ධයෙන්. එතකොට මම සණස තැන්පත්කරුවන්ගේ - ඒ කියන්නේ බස්නාහිර පළාත් සභාව වගකියන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශයක් වග කියන්න ඕනෑ. ඒ වගකීම දරලා නැහැ. ඒ මිනිස්සු, ඒ සම්බන්ධව තමන්ට කියන්න ඕනෑ හැම තැනකටම කිව්වා. නමුත් තමන් වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න කෙනෙක් නැහැ. කවුරුවත් නැහැ. ඊට පස්සේ අපි මොකද කළේ? ඒ සම්බන්ධව සාකච්ඡා කරන්න - අඩුම ගණනේ මොකක්ද මේ වෙලා තිබෙන්නේ? කවුද මේවා හොරා කාලා තිබෙන්නේ? කොයිතරම් ජනතා මුදලක් හොරා කාලා තිබෙනවාද? බස්නාහිර පළාත් සභාව තමන්ගේ වගකීම ඉෂ්ට නොකිරීම නිසා මොන තරම් අපරාධයක්ද ඒ මිනිස්සුන්ට කරලා තිබෙන්නේ. ඒවා මේ පළාත් සභාවේ සාකච්ඡා කරන්න ඕනෑ නැද්ද? ඒවා සාකච්ඡා කරන්න නොවෙයිද මේ පළාත් සභාව තිබෙන්නේ. ඒක සාකච්ඡා කරන්න මෙතැනට ගෙනාවාට පස්සේ ඒක පරාජයට පත් කළා. අද නැගිටලා ගිය එක්සත් ජාතික පක්ෂයත් ඒ යෝජනාව ගේන එකට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. එතකොට මම ඇහුවා, ඔබතුමන්ලා

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

ඇයි එහෙම කළේ කියලා. කියන්න දන්නේ නැහැ. ඔන්න එක්සත් ජාතික පක්ෂයේ තත්ත්වය. ඔන්න එක්සත් ජාතික පක්ෂයේ හැටි. ඔන්න එක්සත් ජාතික පක්ෂයේ වැඩ. ඇත්තටම මම අවංකවම ඇහුවා. මොකුත්, දේශපාලනයක් නොවෙයි. මට නිකම් හිතවත්කමට වාගේ කියන්න කෝ ඇයි ඒකට විරුද්ධ වුණේ? කියන්න දන්නේ නැහැ. මොකක් වුණාද කියලා තේරෙන්නේ නැහැලු. ඔන්න ඕක තමයි තත්ත්වය. එතකොට අර ජනතාවගේ යමක් මේ පළාත් සභාවේ සාකච්ඡා කරන්න ඕනෑ තිබෙන දේ. කොපමණ දේවල් තිබෙනවාද? කොපමණ දේවල් තිබෙනවාද? කථා කරනවා නම්, සාකච්ඡා කරනවා නම්. මහ ඇමතිතුමා චණ්ඩියා වාගේ කිව්වා, අපට තිබෙනවා අපේ උපමාන පාදකවලින් 50% ක්. ඒවා මට ඕනෑ විධියට පාවිච්චි කරන්නේ. දැන් නෝ කතා නෝ සිනා. එනවා. යනවා. ස්වයං රැකියා උපකරණ දෙන්න හැකියාවක් නැහැ. ඒ ව්‍යාපෘති කෙරෙන්නේ නැහැ. තවමත් අර කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති ටික අනලා. ඒ ටික හරියාකාරව කෙරෙන්නේ නැහැ. අඩුම ගණනේ මේ පළාත් සභාවෙන් කරන්න තිබෙන දේවත්, අඩුම ගණනේ තමන්ට හම්බ වෙන ලක්ෂ පනහෙන් කරන්න තිබෙන ව්‍යාපෘති ටිකවත් හදලා මහජනතාවට මොකක් හරි කරන්න, ඒකවත් කරන්න ක්‍රමයක් නැහැ. ඒකවත් වෙන්නේ නැහැ. ඔන්න තත්ත්වය. ඉතින් ඒවා මේ පළාත් සභාවේ සාකච්ඡා කරන්න ඕනෑ නැද්ද? ඒවා කථා කරන්න ඕනෑ දේවල් නොවෙයිද?

අද පෞද්ගලික මන්ත්‍රී යෝජනා හැටියට තිබෙන අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ ඒ යෝජනා දෙකම ඇත්තටම මේ පළාත් සභාවේ කථා කරන්න ඕනෑ, සාකච්ඡා කරන්න ඕනෑ වැදගත් කාරණා. හැබැයි, ඒවා පස්සට දානවා. ඒවා අවැදගත්. ඒවා වැදගත් ඒවා නොවෙයි. මේවා තමයි වැදගත්. අන්න විග්නේෂ්වරන් මෙහෙම කියලා තිබෙනවා. මූ හෙට අනිද්දා අල්ලයි රට. මේ එල්.ටී.ටී.ඊ. එකක් දැන් නැහැ. එල්.ටී.ටී.ඊ. එක කියලා කථා කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ ඩයස් පෝරාව විතරයි. ඩයස්පෝරාව කියලා කියන්නේ, ඒගොල්ලෝ මේ ලංකාවට ඇවිල්ලා මේ කැල්ලක් අල්ලන්න - එහෙම එකක් නොවෙයි. ඒගොල්ලන්ගේ ජීවිකාව, ඒ රටවල්වල තිබෙන ඔය ඩයස්පෝරාව කියන ඔය එකතුව ඇතුළේ, වෙන මොකුත් ඒගොල්ලන්ට නැහැ. ඒ නිසා ඒගොල්ලොත් මොන මොනවා හරි එහේ ඉඳලා කරන්න ඕනෑ?

හැබැයි, දැන් මේක කාටද ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර වහල්කම යටතේ වහල් හිමියාගේ යටතේ අර දම්වැල දාගෙන හිටපු වහලාව එක මොහොතකදී නිදහස් කරනවා. වහල් හිමියෝ වහලාට නිදහස දෙනවා. මොකද, වහල් හිමි ක්‍රමයට විරුද්ධව වහල්ලු අරගල කරනවා. ඒ අරගලයේ ප්‍රතිඵලයක් හැටියට වහල් හිමියාට සිද්ධ වෙනවා වහලාට නිදහස දෙන්න. හැබැයි, නිදහස දුන්නාට වහලාට දැන් ඒක නිකම් අමුතුයි. දැන් දම්වැල ගැලෙව්වාට පස්සේ හරිම අමාරුයි වහලාට. ඊට පස්සේ මොකද වහලාට අර දම්වැල පේන්න හරි තිබෙන්න ඕනෑ. ඒකට හුරු වෙලා. දැන් ඒ වාගේ තමයි අපේ රටේ. මේ ජාතික ප්‍රශ්නය, මේ එල්.ටී.ටී.ඊ. ප්‍රශ්නය අවුරුදු ගණනක් තිබුණා. දැන් ඇත්තටම ඒක නැහැ. අර වහලාට වුණු දේ තමයි අපට වෙලා තිබෙන්නේ. ඒක පේන්න හරි තිබෙන්න ඕනෑ. ඒ ප්‍රශ්නය පේන්න හරි තිබෙන්න ඕනෑ. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. ඇත්තටම වහලාට සිද්ධ වුණු දේ තමයි අපේ රටේ මේ ජාතිවාදීන්ට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකයි ඇත්තටම මේ බලාගෙන යන කොට ප්‍රශ්නය. හැබැයි දැන් මට හිතෙනවා. මේක මොනවා වුණත්, මේ මහින්ද රාජපක්ෂ මහත්තයාට තේරුම් ගිහිල්ලා තිබෙනවාය කියලා මට හිතෙනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා - (බාධා කිරීම්) ඉන්න පොඩ්ඩක්. අද පත්තරේ බැලුවේ නැහැ නේද? අද පුස්තකාලය පැත්තේ ගියේ නැද්ද? මේ තිබෙන්නේ. අද දිණමින පත්තරේ තිබෙනවා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බොරු පත්තරේ නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේක බොරු පත්තරයක්ද? ඒ කාලේ හරි පත්තරයක්ද? මේ කවදා ඉඳලාද බොරු වුණේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ කාලෙත් බොරු. දැනුත් බොරු

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කොයි ආණ්ඩුව තිබුණත් බොරු ලියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේකේ තිබෙනවා, *"විග්නේෂ්වරන් ජාතිවාදියෙක් නොවෙයි. දේශපාලන සිරකරුවන් නිදහස් කළ යුතුයි. මහින්ද රාජපක්ෂ."*

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

කථාව කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කථාවත් කියන්නම්. දැන් මෙතුමා කියනවා කථාවත් කියන්නලු. ඒ කියන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයා එහෙම එකක් කියලා, කියලා ෂුවර් නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

තවම පොඩි එකා නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමා කිව්වේ කොටසයි. තව කොටසක් තිබෙනවා. ඒකයි ඔය කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

*"උතුරු පළාතේ මහ ඇමති සී.වී. විග්නේෂ්වරන් ජාතිවාදියෙකු යැයි තමා විශ්වාස නොකරන බවත්, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බවත් හිටපු ජනාධිපති කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහතා පවසයි. ඒ මහතා මේ බව කියා සිටියේ ඊයේ තිබුණු දෙමළ ජනමාධ්‍යවේදීන් හා පැවති මාධ්‍ය හමුවකට එක් වෙමිනි."*

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දේශපාලන සිරකරුවන් මීසක් ත්‍රස්තවාදීන් නොවෙයි නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දේශපාලන සිරකරුවෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කොහොම හරි දැන් විග්නේෂ්වරන් ජාතිවාදියෙක් නොවෙයි කියලා තිබෙනවා නේ? (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මේ ජාතිවාදීන් මේ හැම දේකටම අධිරාජ්‍යවාදය ගාවා ගන්නවා. ඒගොල්ලෝ කියනවා, නැහැ මෙහෙම නොවෙයි. දැන් සමහර වෙලාවට අපි මෙහෙම කියන කොට දැන් එල්.ටී.ටී.ඊ. සංවිධානයට නැවත වරක් ඇති වීම සඳහා කිසියම් ආකාරයේ තත්ත්වයක් අපේ රටේ නැහැ. එහෙම ඉඩකඩක් නැහැ. ඒ වාගේ පරිසරයක් නැහැයි කියලා කියන කොට ඕගොල්ලෝ කොහොමද කියන්නේ, මේවා පිටපස්සේ අධිරාජ්‍යවාදීන් ඉන්නවාය කියලා කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධිරාජ්‍යවාදීන්ට මෙහේ එල්.ටී.ටී.ඊ. යක් හදලා මේකේ නායකයින්ගෙන් කර ගන්න දේවල් නැහැ ඇත්තටම. එහෙම දෙයක් නැහැ. මොකද, අධිරාජ්‍යවාදීන්ට කිසි බාධකයක් අපේ රටේ නායකයින්ගෙන් නැහැ. අධිරාජ්‍යවාදීන්ට ඕනෑ නම් මේක මෙහෙම කරන්න ඕනෑය කියලා ඒ කියපු දේ අපේ රටේ නායකයින් කරනවා. කරලා තිබෙනවා. ඒ නිසා අධිරාජ්‍යවාදීන්ට අමුතුවෙන් මේකේ යම්කිසි දෙයක් උවමනාවෙන් අටවලා, මේකේ භේද භින්න කරන්න එහෙම උවමනාවක් නැහැ. අපි කියන්නේ නැහැ තිබුණු ප්‍රශ්නය - ඒ ප්‍රශ්නය තිබෙන කොට ඒක ඉන්දියාව කළමනාකරණය කරලා තමන්ගේ වාසියට යොදා ගත්ත අවස්ථා තිබෙනවා. ඒ ප්‍රශ්නය තිබෙද්දී ඇමරිකාව ඒක කළමනාකරණය කරලා තමන්ට ඕනෑ විධියට යොදා ගත් අවස්ථා තිබෙනවා. හැබැයි, ඒවා කිසි දෙයක් හැදුවේ,

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

මේ රටේ ප්‍රශ්න හැදුවේ අධිරාජ්‍යවාදීන් නොවෙයි. ඒවා මේ රටේ පාලකයින් හදාගත් ප්‍රශ්න. අධිරාජ්‍යවාදීන් ඇවිල්ලා මෙහේ ප්‍රශ්න හැදුවේ නැහැ, මෙහේ ප්‍රශ්නය පාලකයින් හදා ගත්තාට පස්සේ, ඒ හදා ගත්ත ප්‍රශ්නය හරහා අධිරාජ්‍යවාදීන් ඒක ප්‍රයෝජනයට ගත් අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. එහෙම නැතිව මෙහේ ඇවිල්ලා ප්‍රශ්න හදන්න අධිරාජ්‍යවාදීන්ට උවමනාවක් නැහැ. එහෙම අධිරාජ්‍යවාදයක් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා කවුරු හරි කියනවා නම් මේක අධිරාජ්‍යවාදය - අපි දන්නවා නේ? සමහර මාධ්‍ය සාකච්ඡාවලදී ඒකමයි කියන්නේ. එහෙම ප්‍රශ්නයක් නැහැ. ඉතින් ඒ නිසා අපි විශ්වාස කරනවා. කමක් නැහැ මේක සාකච්ඡාවට ආපු එක හොඳයි. දැන් බැරි වෙලාවත් මේ වාගේ එකක් සාකච්ඡාවට ඇවිල්ලා, දැන් අපි එහෙම යෝජනාවක් ගෙනැල්ලා, ඒක සාකච්ඡාවට ගත්තා නම් ඒ වෙලාවේ හිටියේ මේ ප්‍රමාණය නම්, තමුන්නාන්සේලාගේ පිටිපස්සේ සිටින ගරු මන්ත්‍රීවරුයෙක් නැගිටලා ගණපූරණය ප්‍රශ්න කරනවා. ඔන්න තමුන්නාන්සේලා තේරුම් ගන්න. තමුන්නාන්සේලා කරන වැඩේ. හැබැයි, අපි එහෙම කරන්නේ නැහැ. අපි එහෙම දේශපාලනයක් කරන්නේ නැහැ. අපටත් ඕනෑ මේවා සාකච්ඡා කරන්න.

එහෙම නම් තමුන්නාන්සේලා තේරුම් ගන්න හරි හෝ වැරදි හෝ මොනවා හරි දෙයක් ඒවා මේ සභාවල කථා කරන්න ඕනෑ. සාකච්ඡා කරන්න ඕනෑ. ඒක තමුන්නාන්සේලාත් කරන්න ඕනෑ. අපිත් කරන්න ඕනෑ. ඒ නිසා ඒ ජාතියේ, කොටින්ම සාමාන්‍ය විධියට කිව්වොත් ඒ ජාතියේ බලු වැඩ අපි කරන්නේ නැහැ. ඒ නිසා අපි අපේ පැත්තෙන් අදහස් ප්‍රකාශ කරනවා. අපි බලනවා, ඒක මේ සභාවේ නීති රීති හැටියට අරගෙන යන්න. එහෙම නැත්නම් තමුන්නාන්සේලා බහුතරය නේ පාවිච්චි කළේ. දැන් අද පාවිච්චි කළේ මොකක්ද? අද පාවිච්චි කළේ තමුන්නාන්සේලාගේ බහුතරය. අපි ඒකට හිස නමනවා. ජනතාව එවලා තිබෙන්නේ එහෙම බහුතරයක් නේ? ඒ නිසා ඒ බහුතරය මත තමුන්නාන්සේලා මේ සභාවේ තීරණය කළා, මේ සභාවේ මේක සාකච්ඡා කරන්න ඕනෑය කියලා. ඔව්. අපි පැනලා ගියේ නැහැ. අපි හිටියා. සාකච්ඡා කරමු. ඕගොල්ලොත් කියන්න. අපිත් කියන්න තිබෙන දෙයක් කියලා අපි මෙතැනින් පිට වෙලා යන්නම්. අන්න එහෙමයි දේශපාලනය කරන්න ඕනෑ. ඒ නිසා අපි කියනවා. ආපහු අපි මේ පැත්තෙන් යෝජනාවක් ගෙනැල්ලා ඒක සාකච්ඡා කරන කොට අර ජාතියේ බලු වැඩ කරන්න එපාය කියලයි කොටින්ම කියන්නේ.

ගරු නියෝජ්‍ය හාපතිතුමනි, මේ යෝජනාව ඉතාම පැහැදිලියි. ඇත්තටම අද උතුරට, උතුරේ ජනතාවට අද විග්නේෂ්වරන්ලාගේ මතවාදය ඕනෑ නැහැ. දෙමළ ජනතාවට ඒ මතවාදය අවශ්‍යම නැහැ. ඒ වාගේම අපි හොඳාකාරවම දන්නවා. සම්බන්දන් මහත්තයා ඇතුළු ටී.එන්.ඒ. එක දේශපාලනය දන්න කට්ටිය. ඇත්තටම විග්නේෂ්වරන්ට වෙලා තිබෙන්නේ, විග්නේෂ්වරන්ට දේශපාලනය තේරෙන්නේ නැහැ. දේශපාලනය දන්නේ නැහැ. එතුමා මෙහේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුකරුවෙකු හැටියට හිටියා. එහෙම තලයක හිටියේ. හැබැයි, වැඩේ තිබෙන්නේ එතුමාට දේශපාලනය තේරෙන්නේ නැහැ. අද උතුරේ දෙමළ නායකයෝ කියන එක තමයි, තමන් කර ගත් ලොකුම වැරැද්ද තමයි දේශපාලනය තේරෙන්නේ නැති මිනිහෙක් මහ ඇමති කරපු එක. අද ඒගොල්ලන්ට කරන්න දෙයක් නැහැ. ඒ නිසා එහෙම ප්‍රශ්නයක් මේකේ තිබෙන්නේ. දේශපාලනය තේරෙන හැම සියලුම දේශපාලන නායකයෙකුම අද ජාතික සමඟිය හදා ගන්න, විශේෂයෙන්ම සිංහල ජාතිකත්වයේ විශ්වාසය දිනා ගැනීම සඳහා කටයුතු කරනවා ඇරෙන්න, මේ ජාතියේ ජාතිවාදී තැන්වලට අදින්න ලැහැස්ති වෙන්නේ නැහැ. ඒ නිසා ඒගොල්ලන්ටත් මේකේ කර ගන්න දෙයක් නැතිව ඉන්නේ.

ඒ නිසා ඒගොල්ලන්ටත් උවමනා වෙලා තිබෙන්නේ, දැන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධව පාර්ලිමේන්තුවේ මේ වෙලාවේ සාකච්ඡා වෙනවා. ඒවායේ සියල්ලක්ම ඔය ජාතිවාදය නැවත වරක් ජාතික ප්‍රශ්නයක් මේ රටේ ඇති නොවන ආකාරයට කටයුතු කිරීම සඳහා සියල්ලන්ගේම ඒකමතිකකමක් තිබෙනවා. එකඟත්වයක් තිබෙනවා. ඒකට අනුව තමයි ඊළඟ ව්‍යවස්ථාව ගොඩ නැගෙන්නේ. ඒ ව්‍යවස්ථාව හැදෙන්නේ. එක එක්කෙනාට ඕනෑ විධියට මේක මර උගුලක්. මර උගුල් හදනවා පාර්ලිමේන්තුවේ. ව්‍යවස්ථා මර උගුලක් එන්නේ කියලා අර බිල්ලෙක් මැව්වාට, එහෙම බිල්ලෝ ආපහු එන්නේ නැහැ. අපි පැහැදිලිවම කියනවා, එහෙම බිල්ලෝ මතු වෙන්නේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම TNA එක අද තේරුම් අරගෙන තිබෙනවා, තමන්ට මේ රටේ හරියට තමන්ගේ කොටසේ තමන්ගේ ජාතිකත්වයට හරි සේවය කරන්න නම් ජාතික

සමඟිය ඉස්සරහාට අරගෙන කටයුතු කරන්න ඕනෑය කියලා. ඒ නිසා බලය බෙදීමක් සම්බන්ධව සාකච්ඡාවක් පාර්ලිමේන්තුවේ නැහැ. තමුන්නාන්සේලාගේ නියෝජිතයෝ ඉන්නවා. ඔය කවුරුවත් නියෝජිතයෝ නැති කෙනෙක් නැහැ. ඒගොල්ලන්ගෙන් අහන්න. හැබැයි, ඒ කමිටුවේ නියෝජිතයෝ හැටියට ඉන්න කිසිම මන්ත්‍රීවරයෙක් කටක් අරින්නේ නැහැ. කට අරින්නේ ඒකේ නැති අය. අවබෝධයක් තිබෙනවා. නමුත් බොරුවට කට අරින්නේ. තමන්ගේ පටු දේශපාලනය වෙනුවෙන් කටයුතු කරන්නේ. ඒ නිසා ඇත්තටම ජාතික සමඟිය ගොඩ නැගෙන පැත්තෙන් අපි කටයුතු කරනවා ඇරෙන්න, අපේ පැත්තෙන් අපි උඩගෙඩි දෙන්න නරකයි ජාතිවාදය තව අවුස්සන්න. ඒ නිසා අපට තිබෙන කනගාටුව තිබෙන්නේ මේ යෝජනාව හරහා - මේක මතු පිටින් පේන්නේ හරි නම් ජාතිවාදයට විරුද්ධව කටයුතු කරනවා කියලා. නැහැ. ඇත්තටම අපි ජාතිවාදයට උඩගෙඩි දීමක්, මේ යෝජනාව හරහා සිද්ධ වෙන්නේ. ඒක වැරදියි කියන එක අපේ පැත්තෙන් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.00 ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම පසුගිය කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රීවරු හැසිරුණු විධියයි, මේ කාලයේ හැසිරෙන විධියයි බැලුවාම නිකම් විටෙක හිතෙනවා අහසයි පොළොවයි වාගේද කියලා. කාලයක් එතුමන්ලා කියන ජාතිවාදය - මේ ජාතිවාදය නම්, මේ ප්‍රශ්න කථා කරන එක ජාතිවාදය නම්, එතුමන්ලා තරම් ඒ ජාතිවාදය වපුරවපු, ඒ ජාතිවාදී ලේ විලේ ලේ හැලුව කණ්ඩායමක් නැහැ. මේක ජාතිවාදය නම් - රට ගැන කථා කරන එක, රටට හානියක් වන කොට කථා කරන, එක රටේ යම් ප්‍රදේශයක් බෙදා ගෙන වෙන් වෙලා යන්න අදහස් ප්‍රකාශ කරන එක සම්බන්ධව මතවාද ඉදිරිපත් කිරීම ජාතිවාදය නම්, එය සියයට දෙතුන් සියයකින් ඉහළින්ම කටයුතු කරපු කණ්ඩායමක් තමයි ජනතා විමුක්ති පෙරමුණ. ඔවුන් ඉතිහාසයේ කටයුතු කළේ එහෙමයි. හැබැයි, මේ ආණ්ඩුව ආවාට පස්සේ මොනවා හරි කන්ට්‍රෝල් එකක්, පාලනයක් තිබෙන බව නම් පේනවා. නිකම් කවුරු හරි නූල් ඇදලා කටයුතු කරනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. එතුමන්ලාගේ හැසිරීමට. මොකද, එතුමන්ලා රටේ ඇති වන සමහර කාරණා ත්‍රස්තවාදය ගැන වෙන්න පුළුවන්. එහෙම නැත්නම් රාජ්‍ය සේවකයන්ගේ ගැටළු ගැන, මේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන කොට එදා තිබුණු ඒ දඟකාර, කැරළිකාර, පෙරළිකාර චරිතයන් අද නැහැ. අද බොහොම කීකරු මී පැටව් වාගේ තමයි සමහර විට හැසිරෙන්නේ. ඒ ගැන පොඩි කනගාටුවක් තිබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපිත් යන්නද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. ඔබතුමන්ලා ඉන්න. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතක් කරන්න ඕනෑ. මේ යෝජනාව අපි ගේන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි. මෙතුමා බොහොම පැහැදිලිව කිව්වා, අද එල්.ටී.ටී.ඊ. යක් නැහැ. ත්‍රස්තවාදයක් නැහැ කියලා. ඒ ගැන එතුමන්ලාට වඩා ආඩම්බරයෙන් අපට කියන්න පුළුවන්. මේක නැති කළේ කවුද? නැති කරන්න නායකත්වය දුන්නේ කවුද? ඒ සඳහා අවධානම භාර ගත්තේ කවුද? කියන එක ආපස්සට හැරිලා බැලුවාම එතුමන්ලාට පැහැදිලියි, ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියපු ආණ්ඩුවක් තමයි අද බලයේ ඉන්නේ. ඔබතුමන්ලා ප්‍රශ්නය අහන කොට, යන්නේ කොහේද මල්ලේ පොල් කියන එක්සත් ජාතික පක්ෂයේ අය තමයි වැඩි ප්‍රමාණයක් බලයේ ඉන්නේ. එහෙම කණ්ඩායමක් තුළ හිඳිමින් ඔවුන්ගේ සහයෝගයත් එක්ක ඉඳලා මෙතුමන්ලා මේ කියන ප්‍රකාශ ගැන අපට යම් ප්‍රශ්නයක් මතු වෙනවා. කෙසේ වෙතත් යුද්ධය අවසන් කිරීමේ මහා විශාල ගෞරවයක් මෙතුමන්ලාට නැති වෙන්න පුළුවන්. සමහර විට මෙතුමන්ලා තුළත් යම් වෙලාවකට ඇත්ත ඇති සැටියෙන් කථා කරන කොට, එළිපිට පෞද්ගලිකව මේ ඇත්ත කාරණාව පිළිගන්නවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා දුටුගැමුණු කුමාරයා වාගේ මේ රටේ මේ ත්‍රස්තවාදය අවසන් කරන්න නායකත්වය දුන්නේ නැත්නම්, මේ යුද්ධය අවසන් වෙන්නේ නැහැ. අද සම්බන්දන්ට හරි විග්නේෂ්වරන්ට හරි වෙන කාට හරි උතුරේ ගිහිල්ලා මේ විධියට බඩ පිනුම් ගහන්න, ප්‍රකාශ කරන්න, දකුණේ ඉඳලා ගිහිල්ලා එහේ දේශපාලනය කරන්න පුළුවන්කම ලැබුණේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය නැති කරලා නිදහස ඇති කරපු නිසා. ඒ දෙකම ඇති කළේ මහින්ද රාජපක්ෂ අපේ නායකතුමා කියන එක අපි

[ගරු ජගත් කුමාර ]

ආඩම්බරයෙන් එතුමන්ලාට කලින් කියන්න ඕනෑ. ඒක කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ නිසා තමයි අද ඔය කවුරුත් ඔය ප්‍රකාශ කරන්නේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක් දහස් නවසිය තිස් ගණන්වල ත්‍රස්තවාදය තිබුණේ නැහැ. එල්.ටී.ටී.ඊ. ය තිබුණේ නැහැ. හතළිස් ගණන්වල එල්.ටී.ටී.ඊ. ය තිබුණේ නැහැ. පනස් ගණන්වල තිබුණේ නැහැ. හැට ගණන්වල තිබුණේ නැහැ. හැබැයි, ඒ කාල පරිච්ඡේදයේත් දෙමළ ජනතාවගේ ස්වයං නිර්ණය අයිතිය ඉල්ලපු දෙමළ නායකයෝ හිටියා. පනහට පනහ අයිතිවාසිකම් ඉල්ලපු නායකයෝ හිටියා. සිංහල මිනිස්සුන්ගේ හම ගලවලා සෙරෙප්පු හදලා දාන්න ඕනෑය කියපු නායකයෝ හිටියා. ඒ හරහා ජාතිවාදය වපුරගෙන වපුරගෙන ඇවිල්ලා තමයි ත්‍රස්තාවදීන් විධියට එල්.ටී.ටී.ඊ. ප්‍රභාකරන් ආයුධ අතට ගත්තේ. එදා ගල් කැටයක්වත් විසි කළේ නැහැ. දෙමළ අය මතවාද විතරයි කළේ. හැබැයි, අද ඒ මතවාද ත්‍රස්තවාදයක් බවට පත් වෙලා, දශක තුනක් මේ රට ආපස්සට ගෙනිහිල්ලා ලේ ගංගා, මිනී කඳු, ජීවිත අවධානය සියල්ල ඇති කළාට පස්සේ තමයි අපට නිදහස් වට පිටාවක් හැදෙන්නේ. ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මිනිහා කණාමැදිරි එළියටත් හයයි කියනවා. ඒ නිසා එදා එවැනි ත්‍රස්තවාදයකින් බැට කාපු අය අපි. මේ මුළු රටම. සිංහල විතරක් නොවෙයි. මේ නිදහස භුක්ති විඳින්නේ සිංහල විතරක් නොවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් මේ සියලු ජාතීන් මේ නිදහස භුක්ති විඳිනවා. ඒ නිදහස ඇති කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් මේ ත්‍රස්තවාදය අවසන් කිරීම පිටුවහලක් වුණා. ඒ වාගේම ත්‍රස්තවාදය අවසන් කළාට පස්සේ ඒ ත්‍රස්තවාදය නැවත ඇති නොවෙන්න කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව ත්‍රස්තවාදයට උඩ ගෙඩි දෙන, කථා අහන පොඩි එකාට ඉස්කෝලේ ගියාම ත්‍රස්තවාදය ගැන, එහෙම නැත්නම් තමන්ගේ ත්‍රස්තවාදී දේශපාලනය ගැන හැඟීම් ඇති වන විධියට අධ්‍යාපන ඇමතිතුමා, මහ ඇමතිතුමා පාසලට ඇවිල්ලා කථා කරන දේ අහන්න ඉඩ දෙනවා නම් - පළාතේ ප්‍රධාන ඇමතිතුමා. නිකම් පුද්ගලයෙක් නොවෙයි. අද රටේ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක ප්‍රධානියෙක්. ලෝකය පිළිගත් ආයතනයක ප්‍රධානියෙක්. එවැනි ප්‍රධානියෙකුගේ මත කවුරුවත් ගණන් ගන්නේ නැහැයි කියලා සැහැල්ලුවෙන් අයින් කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ මත ලෝකය, සමාජය පිළිගන්නවා. අපි කියනවා, ගල් සීයක් ගහන කොට එකක් වදිනවාය කියලා. ඒවා දිනපතා කියලා කියලා, ඊට පස්සේ ඒවා සමාජය තුළ ස්ථාපිත වෙනවා. ඒ සමාජය තුළ ඒ මතවාදයට ඉඩක් විවර වෙනවා. ඒ මතවාදයට ඇති වෙන ඉඩ නැති කරන්න තමයි අපි කියන්නේ. අර නියපොත්තෙන් කඩන්න තිබෙන දේ පොරොවෙන් කපන්න ඉඩ තියන්නේ නැතිව, එතුමන්ලාගේ ඒ මත තව තවත් සමාජගත කරන්න ඉඩ නොතියා මේවා ඉවර කරන්න රජයට බලපෑමක් කරන්න. සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතීන්ගේ ඡන්දය ගත්ත කෙනා තමයි ජනාධිපතිවරයා කියන්නේ. ඒක මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේත් අනික් පක්ෂවලත් ඒ ඕනෑම කෙනෙක් ඒ තැන ඉන්නේ. එතකොට ඒ ඉන්න නායකයාට වගකීමක් තිබෙනවා, ඒ ඉන්න අගමැතිවරයාට වගකීමක් තිබෙනවා, ත්‍රස්තවාදය, ජාතිවාදය ව්‍යවස්ථාපිත ආයතනයක මහජන නියෝජිතයෙක් ඇති කරනවා නම් - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හය වැනි වගන්තියෙන් අපි කියනවා, ඒකීය රාජ්‍ය පිළිගන්නවාය කියලා. ඒක කඩන්නේ, බිඳින්නේ, වෙනස් කරන්නේ නැහැයි කියලා. යම් කෙනෙක් ඒ තැනට වැඩ කරනවා නම්, එයට ඉඩ නොදී කටයුතු කිරීමේ මහා විශාල වගකීමක් ජනාධිපතිවරයාට, අගමැතිවරයාට තිබෙනවා. ආණ්ඩුවට තිබෙනවා. හැබැයි, ආණ්ඩුව නෑසු කන්ව ඉන්නවා. ජනාධිපතිතුමා ඉස්සරහා විග්නේෂ්වරන් සිංහලෙන් මොනවාද කිව්වේ. දැන් දෙමළෙන් කියපු එක අපට තේරෙන්නේ නැහැ. ඇත්ත. හැබැයි, මනෝ ගනේෂන්ට තේරෙන්නේ නැති වෙන්න බැහැ නේ? මේක සම්බන්දන්ට තේරෙන්නේ නැති වෙන්න බැහැ නේ? දැන් ඒ දෙන්නත් මේ ප්‍රකාශය විවේචනය කළා නේ? ඒ දෙන්නත් ඒ ප්‍රකාශය විවේචනය කළා නේ? ඒ වාගේම තවත් එක්සත් ජාතික පක්ෂයේ අය විවේචනය කළා. සමහර ඇමතිවරු. ඒ ප්‍රකාශයේ ගැටළුවක් තිබෙනවා. නමුත් එතුමා කියනවා, එතුමාගේ දෙමළ භාෂාව අපි වැරදියට තේරුම් ගත්තා කියලා. ඒ කන්න ඕනෑ වුණාම කබරගොයා තලගොයා කර ගැනීමේ න්‍යාය.

අද වන කොට එතුමාට යම් පීඩනයක් එන්න ඇති. සමාජයේ මේ සංහිඳියාව තිබෙනවා. සංහිඳියාව ඇති කරන්න යනවා. ඒක ලැබෙන්න යනවා. ඔය යුද්ධයෙන් ගන්න හදපු දේ අපි නිකම් බන්දේසියක තියලා වර්තමාන ආණ්ඩුව බන්දේසියක තියලා, ඊළඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ යුද්ධයෙන් ගන්න ගිය දේ දෙනවා.

එවැනි තත්ත්වයක් තුළ ඇයි අපි කැරළි ගහන්නේ කියලා, හිතලා ඇති. ඒ නිසා එතුමා පස්සට පොඩි රිවස් ගියර් එකක් දැම්මා වෙන්න පුළුවන්. හැබැයි, ඒකෙත් එතුමා ජනාධිපති ඉස්සරහා කියනවා. පෞද්ගලික ඉඩම් අරගෙන ඒවාවල පෞද්ගලිකව පූජනීය ස්ථාන හදන්න බැහැ. ඒවාවල වෙන වෙන කටයුතු කරන්න බැහැ. ඒ වාගේ හමුදාව පොලීසිය අවසර අරන් කරන්න බැහැ. අපේ ආයතනවලින් අවසර ගන්න ඕනෑ. එහේ තිබෙන ආයතන වැඩි ප්‍රමාණයක් ඒ මහ ඇමතිතුමාට යටත්ව තිබෙන ආයතන. මේ ආයතනවලින් අවසර ගන්න කොටම ප්‍රශ්නයක් මතු වෙනවා. දැන් මහ ඇමතිතුමාගේ මතය, කිසිම පූජනීය ස්ථානයක්, විශේෂයෙන් බෞද්ධ සිද්ධස්ථාන, වෙහෙර විහාරස්ථාන හදන්න එපාය කියලා, සිංහල මිනිස්සුන්ට පදිංචි වෙන්න එපාය කියලා එතුමා කිව්වේ ඒක. ඒ ප්‍රකාශය තමයි එතුමන්ලාගේ බල ආයතන, නිල ආයතන තුළ ක්‍රියාත්මක වෙන්නේ. ප්‍රධාන ඇමතිවරයා විධියට. මෙහේ ප්‍රධාන ඇමතිවරයා කියන එක පළාත් පාලන ආයතන ප්‍රධානීන් පිළිගන්න ලැහැස්ති වෙලා ඉන්නවා නේ? ඒක ක්‍රියාත්මක කරන්න එපායැ. ඒ නිසා ඒක ක්‍රියාත්මක කරනවා නම් නිල වශයෙන් දෙන්නේ නැහැ, සිංහල මිනිස්සුන්ට පදිංචි වෙන්න. වෙහෙර විහාරස්ථාන හදන්න. ඒක හරියි කියලා තමයි ජනාධිපතිතුමා ඉස්සරහාත් කිව්වේ. ජනාධිපතිතුමා නිශ්ශබ්දව හිටියා. මම කියන්නේ, එතුමා ඒක හදා ගත්තේ නැහැ. එතුමා සිංහලෙනුත් අපට ඒ කියන්න ඕනෑ ටික කිව්වා. ඒ කියලා එතුමා කිව්වේ, මම කියපු දේ වැරැද්දක් නැහැ. මෙහෙම වෙන්න ඕනෑය කියලා. එතුමන්ලාට ඒ බලය තිබෙනවා කියලා. හැබැයි, එතුමන්ලාට මතකයි එතුමන්ලාට බඩ පිනුම් ගහන්න ඔය තැනට යන්න - එතුමා මේ දකුණේ ඉඳන් දෙමළ ජනතාව වෙනුවෙන් කිසි දෙයක් කළේ නැහැ නේ?

හැබැයි, මැතිවරණයක් තිබුණේ නැහැ නේ? එක්සත් ජාතික පක්ෂයේ ගිවිසුම් ගහලා හැදුවා වුණත්, ප්‍රභාකරන් එක්ක යන්න ඒ කාලේ වුණත් මැතිවරණයක් තිබුණේ නැහැ නේ? යුද්ධය අවසන් කරලා, මැතිවරණයක් තියලා ඒ අයට නිදහසේ ඒ ප්‍රදේශය පාලනය කරන්න වගකීම ලබා දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. එහෙම දීලා අපි කිව්වේ, ඒ රටේ යම් ප්‍රදේශයක යමක් කරන්න, පළාත් සභා බලතල ඇතුළේ යමක් කරන්න අවශ්‍ය වටපිටාව සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතීන්ට එකට ඉන්න ඕනෑ අවශ්‍ය වටපිටාව හදන්න ඕනෑය කියලා. හැබැයි, මහ ඇමතිතුමාට අපේ අර අනික් හිතවත් මන්ත්‍රීවරු කිව්වා වාගේම ඒ මහ ඇමතිතුමාට තමන්ගේ මහජන නියෝජිත ධුරයේ තත්ත්වය රැක ගන්න බැරි නිසා ඉදිරි මැතිවරණය එන කොට එතුමා එක පැත්තකින් පරාජිතයෙක් වෙනවා. ජනතාව අතර ප්‍රසාදය නැති වෙනවා. අනික් අතට සම්බන්දන් වැනි වයෝවෘද්ධ තත්ත්වයේ - ද්‍රවිඩ සන්ධානය ඇතුළේ ඊළඟ නායකත්වයට ඔහු මාන බලමින් ඉන්නවා. මෙවැනි කාරණා කිහිපයක් තුළ එතුමාට අවශ්‍ය වෙනවා, ජනතාව තුළ - දැන් සාමාන්‍යයෙන් ලෝකයේ ගොඩක් තැන්වල - අපි නොවෙයි. ජාතිවාදය අවුස්සලා තමයි යම් යම් අය බලයේ ඉඳලා තිබෙන්නේ. බලයට යන්නේ. ඒ වාගේම මේ අයත් බලය රැක ගැනීම සඳහා, නායකත්වය රැක ගැනීම සඳහා ද්‍රවිඩ ජනතාවගේ හැඟීම් කුපිත කරලා, ප්‍රභාකරන් කළෙත් ඒක. ඒකම තමයි විග්නේෂ්වරනුත් ඔය කරන්නේ. ප්‍රභාකරන් ආයුධ ගෙනැල්ලා, වෙනම පුහුණු වීම් දීලා කරපු දේ, අද ලේ කකියන, හැඟීම්බර වචන කියලා - අපි දෙන්නේ නැහැ ශ්‍රී ලංකාවේ අර අයට. මේ ප්‍රදේශය අපේ. අපි වෙනම පවත්වාගෙන යන්නේ. ඉතිරි කාල පරිච්ඡේදයේ අපි පොලීසි ගන්නවා. අපි ඉඩම් ගන්නවා. අපි උසාවි ගන්නවා. අපි මේ ප්‍රදේශය වෙනම පවත්වාගෙන යනවා කියන තැනට මුල පුරන්න තමයි කටයුතු කරන්නේ. ඒ නිසයි අපි ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්නේ. මේක නිකම් බොල් හඬක් විතරක් නොවෙයි. බොල් හඬට පිටිපස්සෙන් එනවා වෙඩි හඬක්. ඒ වෙඩි හඬට සූදානම් වෙන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි අපි මෙය පරාජය කළ යුත්තේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ කාරණාව පිළිබඳව වැඩි වැඩියෙන් කතා බහ කිරීම තුළ ජාතිවාදයක් අමුතුවෙන් ඇති වෙන්නේ නැහැ. අපි මිනිස්සුන්ට කියන්නේ නැහැ ද්‍රවිඩ ජනතාවට හිරිහැර කරන්නය කියලා. අපි කිව්වත්, අපේ මේ ශ්‍රී ලාංකික මිනිස්සු, සිංහල මිනිස්සු එහෙම ජාතිවාදය කර පින්නාගෙන යන්න ලැහැස්ති නැහැ. විශේෂයෙන් එහෙම ලේ රත් කරන්න පුළුවන් උතුරේ වාගේ ප්‍රදේශවල, විශේෂයෙන් දකුණු බද ප්‍රදේශ, අනික් ප්‍රදේශත් එක්ක වැඩිය මිශ්‍ර නොවන ජනතාව. මේ ප්‍රදේශවලට වැඩියෙන් මිශ්‍ර වුණොත් ඒ ජනතාවත් ලෙහෙසියෙන් ජාතිවාදයට බර කරන්න බැරි වෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා. අපේ කථාව හරහා මේ රටේ සහජීවනය, සංහිඳියාව ඇති කරන්න ඉඩක් හැදෙනවා. අර අවි අතට ගන්න අයව උඩගෙඩි දෙන අයව නවත්වන්න වැඩ පිළිවෙළක් හැදීම තුළ. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණේ වෙන්න පුළුවන්. අපේ අනික් පක්ෂවල අය වෙන්න

[ගරු ජගත් කුමාර ]

පුළුවන්. අපේ මේ යෝජනාව පිළිබඳව වැරදියට ගන්නේ නැතිව කරුණාකරලා, මීට වඩා බුද්ධිමත්ව, මීට වඩා සොයලා බලලා කටයුතු කරන්න. මේ යෝජනාව තුළ අපට ඕනෑකම තිබෙන්නේ, රටේ ජනතාව එකම අම්මා, තාත්තාගේ දරුවෝ විධියට එක ගමනක් යන්න. ඒ නිසා අපට උතුරට යන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. මට මතකයි. 2002 දී අපි ගියා අර ගිවිසුම හරහා. ප්‍රභාකරන්ගේ හා රනිල් වික්‍රමසිංහගේ ගිවිසුම. යන කොට අපේ වාහන පරීක්ෂා කළේ, එල්.ටී.ටී.ඊ. එක. අපි යනකොට ඒ ප්‍රදේශයේ ට්‍රැෆික් පොලිසිය හිටියා. ඒ එල්.ටී.ටී.ඊ. එක. ඒ වාගේම රේගු නිලධාරීන් වාගේ අපේ බඩු භාණ්ඩ චෙක් කරලා අපට බිල් ගෙව්වා, රේගු මුදල් ගන්නවා වාගේ. වෙනම රටකට යනවා වාගේ. අපි දැක්කේ වෙනම පොලිසි. වෙනම අධිකරණ. වෙනම බැංකු. වෙනම රටක් අපි දැක්කේ. සිංහලෙන් අපි හයියෙන් කථා කරන්න ඒ රටට බයේ ගියේ. ඒ රට අපේ නොවෙයි වාගේ තිබුණේ. ඒ රට අපේ කර ගත්තේ මහින්ද රාජපක්ෂ මහත්තයාට පින් සිද්ධ වෙන්නය කියන කාරණාව නැවත නැවත අපි තමුන්නාන්සේලාට කියනවා. එහෙම මේ රට එකතු කළේ, එදා දුටුගැමුණු කුමාරයා වාගේ එක්සේසත් කළේ මහින්ද රාජපක්ෂ.

ඒ නිසා අපි හිතන්නේ, මේ රටේ අන්තිම සිංහලයාත් ඉන්නකල් කිසි විටක මේ රට නැවත බෙදෙන්න දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතීන්ගේ අයිතීන් රකිනවා නම් ඒ බෞද්ධ අපි. බුදුහාමුදුරුවෝ තමයි සංහිඳියාව, සමඟිය ගැන කියලා තිබෙන්නේ. ඒ නිසා සියලු ජාතීන් ඒකරාශී කර ගෙන මේ ගමන යන්න ඕනෑ බව අපි තේරුම් අරගෙන ඉන්නවා. හැබැයි, ඒකට ජාතිවාදයෙන් වෙනම කලාප, පළාත්, ප්‍රාන්ත ආණ්ඩු හදා ගන්න යනවා නම් ඒකට ඉඩක් දෙන්න අපි සූදානම් නැහැයි කියන කාරණාවත් මතක් කරමින් මේ අවස්ථාව සලසා දීම පිළිබඳව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව ආණ්ඩුවට යවන්න. ජනාධිපතිතුමාට යවන්න. අගමැතිතුමාට යවන්න. පැහැදිලිවම මේ රට බෙදන්න මාන බලන මුල් පුරුක - මේකෙන් මේ වචනයෙන් බෙදෙන්නේ නැහැ. හැබැයි, ඒකට උඩගෙඩි දෙනවා. ඒ උඩගෙඩි දීම නවත්වන්න අවශ්‍ය පියවර ගන්නය කියලා ඉල්ලා සිටිමින්, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.15 ]

**ගරු සුනිල් වටගල**
**Hon. Sunil Watagala**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව සාකච්ඡා කිරීමේදී ඇත්තෙන්ම මුලින්ම කියන්න ඕනෑ. මෙම යෝජනාවට පක්ෂව 38 දෙනෙකු හිටියා. දැන් මේ ගරු සභාවේ රැඳී සිටින්නේ 15 කට ආසන්න ප්‍රමාණයක්. ඒක නොවෙයි සිද්ධිය. දැන් මේ යෝජනාවට විරුද්ධ වෙලා කට්ටියක් එළියට ගියා නේ? ඒකට සාපේක්ෂව දැන් මේකේ ඉන්න එපැයි මේක ශක්තිමත් කරන්න කට්ටිය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව සාකච්ඡාවට ගනිද්දී ඇත්තෙන්ම මම අර කලින් ප්‍රකාශ කළා වාගේම, මේ මන්ත්‍රීතුමා අහවල් ප්‍රකාශ කියලා ඒ ප්‍රකාශ කිහිපයක් මේ යෝජනාව තුළ උපුටා දැක්වූවා නම් හොඳයි. අපට මේ සාකච්ඡාව තවදුරටත් ශක්තිමත් කරන්න තිබුණා. කොහොම වුණත් මෙම ජාතිවාදී ප්‍රකාශයන් සම්බන්ධයෙන් ගත්තාට පස්සේ මට කිසියම් අතීත මතකයක් එනවා. මම පොදුවේ කියන්න ඕනෑ. මේ විග්නේෂ්වරන් කියන්නේ බංකොලොත් දේශපාලඥයෙක්. මේ බංකොලොත් දේශපාලඥයාට උත්තර බඳින්නයි දැන් අපි මේ හදන්නේ.

හැබැයි, ගරු සභාපතිතුමනි, මෙතුමා එක්තරා වෙලාවක ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටියා. එතකොට අභියාචනාධිකරණයේ ඉඳලා ශ්‍රේෂ්ඨාධිකරණයට පත් වුණු වෙලාවේ ඒ උත්සවයේදී කථාවක් කළා. ඒ උත්සවයේදී ඒ කථාව කරන වෙලාවේ අපේ රටේ නීතිපතිවරයා වශයෙන් හිටියේත් ද්‍රවිඩ ජාතිකයෙක්. කමල සබේෂන් මහත්තයා හිටියේ. එතකොට කමල සබේෂන් මහත්තයා හිටපු සභාවේ කිව්වා, මම දැන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙක්. කමල සබේෂන් මහත්තයා මේ රටේ නීතිපතිවරයා. අපි දෙන්නා එකතු වෙලා කියලා ලොකු ජාතිවාදී කථාවක් කළා. ඒ වෙලාවේ එතැන හිටපු පිරිස හරිම අසරණ තත්ත්වයට පත් වුණා. කමල සබේෂන් මහත්තයාගේ ඇත්තටම එහෙම තත්ත්වයක් තිබුණේ නැහැ. ඒ වෙලාවේ ඒ සභාවේදී කමල සබේෂන් මහත්තයා හරිම අපහසුතාවයකට පත් වුණා. එතකොට ඒ වෙලාවේ එතුමාගේ තිබෙන පරිණතකම අපි දැක්කා. හැබැයි, එහෙම දැකපු කෙනෙක්ව තමයි උතුරේ මහ ඇමතිවරයා බවට මේ පත් කරලා තිබෙන්නේ. දැන් එදා කමල සබේෂන් මහත්තයා පත් වුණු අපහසුතාවයම අද ද්‍රවිඩ ජාතික

සන්ධානය භුක්ති විඳිනවා. අද ද්‍රවිඩ ජාතික සන්ධානයත් ඉක්මවා ගිහිල්ලා, මේ බංකොලොත් දේශපාලඥයා දැන් ප්‍රකාශ කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක දෙයක් හරි පැහැදිලිවම කියන්නම්. උතුරේ ජනතාවගේ හඬ මේක නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි දේශපාලනය කරනවා. භූමියේ ඉන්න ඇත්ත ද්‍රවිඩ අම්මාගේ තාත්තාගේ හඬ මේක නොවෙයි. අභිලාෂයන් මේක නොවෙයි. මේ ද්‍රවිඩ ඩයස් පෝරාව පුස්සක්. ඒකට කරන්න පුළුවන් මහුලක් නැහැ. ඒකට කරන්න පුළුවන් දෙයක් නැහැ. දැන් ද්‍රවිඩ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය ඉවරයි. බිත්තියට හේත්තු වෙලා තිබෙන්නේ. ඒක ආයිත් නැගිටින්නේ නැහැ. හැබැයි, මෙහේ අනාථ රැළක් ඉන්නවා. දේශපාලනයෙන් අනාථ වෙලා ඒ අනාථ රැළට අවශ්‍යයි එක දෙයක්. මේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා නියම ප්‍රකාශයක් කිව්වා. *"පරාජිතයාගේ අවසන් තුරුම්පුව ජාතිවාදයයි."* අන්න අද දේශපාලනයෙන් බංකොලොත් වෙලා ඉන්න විග්නේෂ්වරන් මහත්තයාගේ අවසන් තුරුම්පුව වෙලා තිබෙන්නේත් ජාතිවාදය. අද මේ භූමියේත් අනාථ වෙලා ඉන්නවා දේශපාලනයෙන් පිරිසක්. ඒ අයට නැගිටින්න ඕනෑ, මේ ජාතිවාදය තුළින්. අන්න ඒ අනාථ රැළේ සටන් පාඨය වෙලා තිබෙන්නේ මේ ජාතිවාදය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම කනගාටුයි මේ තත්ත්වය. එතකොට අද මේ තත්ත්වය ගත්තාට පස්සේ අපි දන්නවා, උතුරේ එක්තරා කාලයක් තිබුණා - අපේ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාට උතුරේදී එළව එළවා ගැහුවා. එක්තරා කාලයක් තිබුණා එහේ දේශපාලනය කරන්න බැහැ. එක එක ඉන්ට්වලින්. අර ඉන්ට් එකෙන්, මේ ඉන්ට් එකෙන් ඇවිල්ලා පහර දෙනවා. 2009 ට පස්සේ දේශපාලනය කරන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. හැබැයි, 2009 ට පස්සේ දේශපාලනය කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එක්තරා කාලයක්. එතකොට දැන් තත්ත්වය ටිකක් වෙනස් වෙලා. හැබැයි, යම්කිසි ආකාරයක තත්ත්වයක් තිබෙනවා. හැබැයි, ඒ තත්ත්වය තුළ මෙන්න මේ වාගේ ජාතිවාදී ප්‍රකාශ. අපි දන්නවා, විවිධ ජාතිවාදී ප්‍රකාශ කළා. පන්සල්, පල්ලි, කෝවිල් හදන්න දෙන්නේ නැහැ. එවැනි ප්‍රකාශයන් ටිකක් තමයි පරිවර්තනයේ ගියේ. අපි දන්නේ නැහැ ඒ නිවේදනයේ ඒක අන්තර්ගත වුණාද කියලා. පෞද්ගලිකව මම දන්නේ නැහැ. හැබැයි, පරිවර්තනයන්වල ඔය වාගේ කෑලි ගියා. එතකොට එක දෙයක් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ මාධ්‍ය භාවිතාවේදී, මාධ්‍ය පරිහරණයේදීත් තරමක් ප්‍රවේසම් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම මහරගම පැවති එක්තරා අවමංගල උත්සවයකට ගියා. එතැන ටිකක් වෙලා ඉඳලා එක නිවසකට ගියා. මම හඳුනන නිවසක්. ඒගොල්ලෝ ගුරු යුවලක්. ඒ අය තදින් ප්‍රකාශ කර සිටියා, දැන් රට ඉවරයි නේද? ජාතිවාදයට ගිහිල්ලා නේද? දැන් ඔන්න අහවලා නැගිටිනවා නේද? කියලා. මම කිව්වා, පොඩ්ඩක් අරන් පෙන්වන්නකෝ එහෙම දෙයක් කිව්වාද කියලා. තිබෙනවාද කියලා. එහෙම කියනකොටම මම නිකම් විග්නේෂ්වරන් මහත්යාගේ පැත්තේ වාගේ පේනවා. ඕගොල්ලොත් මොනවාද මේ කථා කරන්නේ? මම කිව්වා, නැහැ. ඔය ප්‍රශ්නය සොයා ගන්නයි ඕනෑකම තිබෙන්නේ. කොහේද ඒක තිබෙන්නේ. ගන්න කිව්වා. ගන්න කියලා කිව්වාට - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක හැමෝටම ආදර්ශයක් වෙයි කියලා මම විශ්වාස කරනවා. ද්‍රවිඩ භාෂාවෙන් නිකුත් කරපු එළුග තමිල් උත්සවය නිමිත්තෙන් කරපු නිවේදනයක්. එතකොට ද්‍රවිඩ භාෂාවෙන් නිකුත් කරපු ඒ නිවේදනය පාදක කර ගෙන සිංහලෙන් කරපු ප්‍රකාශ ටිකක් තිබෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සිංහලෙන් කරපු ප්‍රකාශ අර කියන පරිවර්තනය නොවෙයි කියලා පේනවා. නිකම් කමෙන්ට් එකක් තිබෙන්නේ. මොකක් හරි තිබෙන එකක් නේ කිව්වේ. නැත්නම් විග්නේෂ්වරන් මහත්තයාත් ඊයේ පෙරෙයිදා පිළිගන්නේ නැහැ නේ? සමාව ඉල්ලන්නේ නැහැ නේ? මොකක් හරි කියලා තිබෙනවා නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ තිබෙන්නේ පරාජිතයාගේ දේශපාලනය. ඒ කියන්නේ, කථා කරන්න දෙයක් නැති වුණාට පස්සේ ඔහු කථා කරන දේ. එතකොට උතුරේ ආණ්ඩුකාරවරයා මොනවාද මේ කියන්නේ. දැන් එතුමා මේකට උත්තර බඳිනවා. ආණ්ඩුකාරවයා මේකට උත්තර බඳිමින් කියනවා, coming from a different cultural and language background he will not carry out his duties in a high handed manner by attacking a law into his hands to attack people. මිනිස්සුන්ට ගහලා මේ වැඩේ කරන්න බැහැ. එතකොට එතුමා යෝජනා කරන්නේ මොකක්ද? සංහිඳියාව. ඊට පස්සේ මොකක්ද කියන්නේ. When he was asked his views on Eluga Thamel demonstration held in Jaffna recently Governor Cooray said, reconciliation could not be

[ගරු සුනිල් වටගල ]

brought about to the contribution on a piece of legislation. Therefore, it should be promoted through friendship and creating awareness rather than fore. However they would not hesitate to action if there is an actual threat to national security. එතකොට national security එකට තර්ජනයක් තිබෙනවා නම්, ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධයෙන් පියවර ගත යුතුයි. Governor condemn කරනවා ඒ ප්‍රකාශයත්. මොකක් හරි තිබෙනවා නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ කියන්නේ. බස්නාහිර පළාත් සභාවේ මේ වාදය ගන්නේ ඇත්ත වශයෙන්ම බස්නාහිර පළාත් සභාවටම අයත් මගේ යෝජනා දෙකක් පස්සට දාලා. අපි මේ කාලය නාස්ති කරන්නේ. ගරු ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාත් අපිත් එහා පැත්තට ගිහිල්ලා පෞද්ගලිකව කථා කළා. මොකක්ද මේ වෙන්න යන්නේ කියලා. (බාධා කිරීම්) අපි දෙන්නා ගියා පුවත්පත්වල තිබෙන දේවල් ටිකක් කථා කරන්න. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීම්) පෞද්ගලිකව නිකම් හම්බ වුණා. මේ පත්තර සොයන්න ගියා. එතුමාත් පත්තර සොයා ගෙන ගියා. මමත් පත්තර හෙව්වා. ඉතින් පත්තර සොයන කොට මේ මහින්ද රාජපක්ෂ මහත්තයා කියපු ප්‍රකාශය හම්බ වුණා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමා ඔය යෝජනාවට එකතු වුණා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මේකේ කියන්න තිබෙන්නේ එක දෙයක්. අපි මේ වැදගත් ප්‍රශ්න පැත්තකට දාලා අවැදගත් දේවල් කරපින්නාගෙන මේ කථා කරනවා. ඒකෙන් තවදුරටත් මේ ජාතිවාදය පෝෂණය වන එකක් වෙන්නේ. ඒ නිසා එවැනි තත්ත්වයකට අපි ඉඩ තියන්න හොඳ නැහැ. මෙවැනි ප්‍රකාශයන් තිබෙනවා නම් අපි හෙලා දකිනවා. ඒ බංකොලොත් දේශපාලඥයාගේ තත්ත්වයට අපි වැටෙන්න ඕනෑ වෙන්නේ නැහැ. අපි මෙතැන ඇත්තටම යම්කිසි තත්ත්වයක් ඇති වුණා. මෙතැනින් එක්සත් ජාතික පක්ෂය ඉවත්ව ගියා. නමුත් අපි සංවාදයක් කළ යුතු නිසා මේකත් එක්ක යම්කිසි සංවාදයක නිරත වුණා. මෙතැනින් මේ වැඩේ ඉවරයි. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තූතියි අවස්ථාව ලබා දීම පිළිබඳව.

[ අ.භා. 01.25 ]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා බංකොලොත් දේශපාලඥයකු වන විග්නේෂ්වරන් මහත්තයා ගැන මේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව. ඒ වාගේම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේක කථා කරන්න ඕනෑ දෙයකුත් නොවෙයි. මේක ජාත්‍යන්තරය ඇද ගන්න ඕනෑ දෙයකුත් නොවෙයි. මේකට ජාත්‍යන්තරයේ සම්බන්ධයක් කොහෙත්ම නැහැ. ජාත්‍යන්තරය ගැන මේ රටට අවශ්‍යයත් නැහැ. මේ බංකොලොත් විග්නේෂ්වරන් ගැනයි කථා කරන්නේ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ ප්‍රශ්නයේ අතීතයට ගිහිල්ලා එන කොට මහා වංශය ලියපු මහානාම හාමුදුරුවෝ එළාර රජ්ජුරුවෝ ගැන ලියලා තිබෙනවා. දැහැමි පාලකයෙක්. වසර හතලිස් පහක් පාලනය කළා. එළාර රජ්ජුරුවන්ගේ හමුදාවේ සිංහල ජාතිකයන් පවා හිටියා කියලා. දෙමළ රජවරු හතර දෙනෙක් ගැන සඳහන් කරලා තිබෙනවා. එදා මහානාම හාමුදුරුවන්ට ජාතිවාදය තිබුණේ නැහැ. එදා අධිරාජ්‍යවාදීන් ලංකාවට ඇවිල්ලා ලංකාව පාලනය කරන කොට ලංකා ජාතික සභාව හදා ගත්තා. සිංහල, දෙමළ, මරක්කල අය එකතු වෙලා. 1919 දී. ඒකේ සභාපතිවරයා තමයි සර් පොන්නම්බලම් අරුනාචලම්. එතැන තිබුණේ නැහැ සිංහල බහු ජාතිය කියලා, මහ ජාතිය කියලා ජාතිවාදයක්. මේ සිංහල, දෙමළ අයගේ එකතුව අධිරාජ්‍යවාදීන්ට, සුද්දාට උහුලන්නේ නැතිව ගියා. සුද්දාගේ ක්‍රමය තමයි බෙදා වෙන් කර පාලනය කිරීම. සුද්දා මොකද කළේ? සුද්දා ගැටයක් ගැහුවා. කොළඹ තිබෙන ආසන ගණන අඩු කරලා, නීතියක් ගෙනාවා මාස 18 කට වැඩිය ඒ පළාතේ ඒ ආසනයේ ජීවත් වෙන්න ඕනෑ. එතකොට තමයි ඡන්දය ඉල්ලන්න පුළුවන් කියලා. එතකොට ආසන හතරට අඩු

කළාට පස්සේ පොන්නම්බලම් අරුනාචලම් මහත්තයායි, පොන්නම්බලම් රාමනාදන් මහත්තයායි දෙන්නෙක් ඉන්නවා. සිංහල නායකයොත් ඉන්නවා. එතකොට එහෙම දෙන්න වෙන්නේ නැහැ. සිංහල නායකයෝ ඔක්කොම අයින් කරන්නත් බැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය ඇති කළා. අන්තිමේ 1921 දී යාපනයේදී හදා ගත්තා, ලංකා ද්‍රවිඩ මහජන සභාව. මෙන්න සිංහල, දෙමළ භේදය ඇති කරපු තැන. මෙහෙම තමයි ඇති කළේ. ඔබතුමා කියනවා නම්, ජාත්‍යන්තර උවමනාව නැහැයි කියලා. එදා ජාත්‍යන්තරය ඒ දේ කළා. එදා ඉඳන් තමයි අද දක්වා මේක ආවේ.

1915 දී සිංහල මරක්කල කෝලාහල වෙලාවේ සුද්දාට ඕනෑ වුණා, සිංහල නායකයන්ව ඝාතනය කරන්න. මර්දනය කරන්න. ඒ වෙලාවේ සිංහල නායකයෝ අල්ලලා හිරේ දාන කොට පොන්නම්බලම් අරුනාචලම් මහත්තයායි, පොන්නම්බලම් රාමනාදන් මහත්තයා තමයි ඒ සිංහල නායකයන්ව බේරා ගත්තේ. එදා එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මේක ඇති කළේ සුද්දා. මේ උතුරේ යුධ තත්ත්වය ඇති කළේත්, මේ උතුරේ ප්‍රශ්න ඇති කළේත් සුද්දා. සුද්දාට ඕනෑ විධියට තමයි අදත් අපේ නායකයොයි, එහේ නායකයොයි රඟන්නේ. විග්නේෂ්වරන් මහත්තයා සමහර වෙලාවට මෝඩ දේශපාලඥයෙක් වෙන්න ඇති. හැබැයි, සම්බන්දන් මහත්තයා ඔබතුමා කිව්වා, හොඳ දේශපාලඥයෙක් කියලා. බුද්ධිමත් දේශපාලඥයෙක් කියලා. හරියටම හරි. විග්නේෂ්වරන් මහත්තයා ලව්වා තමයි මේක ගේන්නේ. ගෙනැල්ලා එළියට දානවා. දාලා බලනවා ඉබ්බාව. කොක්ක දානවා. තමන්ට අවශ්‍ය කථාව මේගොල්ලන්ට කියන්න බැරි නිසා ඒගොල්ලන් ලව්වා කියවලා වැඩේ කරගන්න - අර ගොබෙල්ස් න්‍යාය කියනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සිය දහස් වාරයක් බොරුවක් හරි කියන කොට ඒ බොරුව ඇත්ත කියලා පිළිගන්න පෙළඹෙනවා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා තුවක්කුවෙන් කර ගන්න බැරි වුණු දේ අද පෑනෙන් කර ගන්න යනවා. දැන් ඒගොල්ලෝ කියනවා, සංහිඳියාව කියලා. සංහිඳියාව නම් හමුදා කැම්ප් අයින් කරන්න කියනවා. එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගුවන් හමුදාව තිබෙන්නේ ගුවනේද? නාවුක හමුදාව තිබෙන්නේ මහ මුහුද මැද්දේද? හාර කෝටියක් චීනයේ ජනගහනය ඉන්නවා. හමුදාව ඉන්නවා. ඒ හමුදාව ඉන්නේ චීනයේ නොවෙයිද? අපේ හමුදා කඳවුරු තිබෙන්නේ මේ පළාත්වල කොහේද? මහ මුහුදේද? එහෙම නම් ඒ පළාතේ සිංහල ජනතාව, ද්‍රවිඩ ජනතාව කියන්න එපැයි අයින් කරන්නය කියලා. ලෝකයේ එකම අග නගරය තමයි මහ ජාතිය අඩුවෙන් ජීවත් වන, කොළඹ. ප්‍රශ්න තිබෙනවාද? දෙමළ කාටවත් කෝවිල් යන්න ප්‍රශ්නයක් තිබෙනවාද? මුස්ලිම් කාටවත් පල්ලි යන්න ප්‍රශ්නයක් තිබෙනවාද? සංහිඳියාව මෙහේ තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යාපනයේ කාට හරි කෝවිල් යන්න ප්‍රශ්නයක් තිබෙනවාද? යාපනයේ උසාවියේ නඩු සිංහලෙන් අහලා, දෙමළට පරිවර්තනය කරනවාද? නැහැ. මේ ජාතිවාදීන්ට, අධිරාජ්‍යවාදීන්ට උවමනාව තිබෙනවා, මෙය කඩා වෙන් කර, බෙදා වෙන් කරන්න කැල්ලක් කඩන්න. ඒකට කාලයකදී දෙමළ නායකයෝ භාවිතා කළා. ඊළඟට එල්.ටී.ටී.ඊ. ය භාවිතා කළා. දැන් ඔබතුමා කියන්න වාගේ ත්‍රස්තවාදය, එල්.ටී.ටී.ඊ. ය බිත්තියට හේත්තු වෙලා තිබෙන්නේ. ආයිත් නැගිටින්න බැහැ. නමුත් ඒ ගහලා ගන්න බැරි දේ ලියලා අරන් දෙන්න තමයි අද මෙපමණ නායකයෝ දඟලන්නේ. දැන් බලන්න කෝ? ඊයේ මම දැක්කා සිරියාවේ ඉස්පිරිතාලයට බෝම්බ දාලා. තවමත් බෝම්බ එනවා. ඒ ගැන කථා කරන්නේ නැහැ. මේ යුද්ධය අවසන් කරපු මහින්ද රාජපක්ෂව, ගෝඨාභය රාජපක්ෂව, රණවිරුවන්ව හිරේ දානවා. විග්නේෂ්වරන් කියනවා, ඔක්කොම නිදහස් කරන්නය කියලා. සමාව දෙන්නය කියලා. එතකොට අපේ බුද්ධි අංශයේ අය එක එකා ඝාතනය කරනවා. සංහිඳියාව මේකද? ඒකද යහපාලනය?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩිදුර කථා කරන්නේ නැහැ. දොන් ජුවන් ධර්මපාල. කෝට්ටේ රාජධානියේ හිටපු රජ කෙනෙක්. හැබැයි, අනුරාධපුර යුගය ගත්තාම වසර 2000 ක් වෙනවා. තවමත් ගල් කණු, බුදු පිළිම තිබෙනවා. යුද්ධය කරලා විනාශ කළත්. පොළොන්නරුව ගත්තාමත් යුද්ධය කළත් තවමත් ඒ ගල් බැම්, ගල් කණු, බුදු පිළිම තිබෙනවා. හැබැයි, අවුරුදු 300 යි 350 යි කෝට්ටේ රාජධානිය අවසන් වෙලා. කෝට්ටේ රාජධානියේ ගලක්වත් නැහැ. මොකද, සුද්දා දන්නවා ඉතිහාසය ඉවත් කළාම වර්තමානයකුත් නැහැ. අනාගතයකුත් නැහැ. දොන් ජුවන් ධර්මපාලව රජ පුටුවේ තියා ගෙන තමයි සුද්දා ඔක්කොම ගල් කණු ටික ගැලෙව්වේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යහපාලන ආණ්ඩුව ඒ පුටුවේ තියා ගෙන ජාත්‍යන්තරයට ඕනෑ දේ ජාත්‍යන්තරය කර ගන්නවා. ඒ නිසා අපි මේ මාතෘකාව ගෙනාවේ, මේ මාතෘකාව පිටිපස්සේ, මේ මාතෘකාවේ

[ගරු ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා ]

ඉන්නෙත් විග්නේෂ්වරන් නොවෙයි. එතුමා රූකඩයක් තමයි. එතුමා මේ කථාව ගෙනාවා විතරයි. එතුමා ලවා කියවා ගත්තා විතරයි. නමුත් මේ පිටිපස්සේ යම් පිරිසක් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමා නැහැයි කිව්වාට ජාත්‍යන්තරය ඉන්නවා. එතුමන්ලාත් වග කියන්න ඕනෑ මේවාට. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලයේ තමයි උතුරු පළාත් සභාව ඇති කළේ. හැබැයි, ඒ කාලේ ඔය විග්නේෂ්වරන්ලා කට ඉස්සුවේ නැහැ. දොන් ජුවන් ධර්මපාල ආවාට පස්සේ කෑ ගහනවා. එදා හමුදා කඳවුරු අයින් කරන්න කිව්වෙත් නැහැ. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්තයා උතුරට කරලා තිබෙන තරම් දකුණට කරලා නැහැ. ඔබතුමන්ලා යාපනයේ ගිහිල්ලා බලන්න. මේ කොළඹ වාගේම යුද්ධය අවසන් වෙලා වසර එකහාමාරක් දෙකක් ඇතුළත A 9 පාර හැදුවා. කිලෝ මීටර් දෙසිය ගණනක්. කිලෝ මීටර් දෙසිය ගණනක් කෝච්චි පාර දැම්මා. අපේ ගමේ මීටර් සීයක් දාගන්න බැරි කාලේ. ඒවා හැදුවේ නැහැයි කියන්න බැහැ. ඒ නිසා ඒ දෙමළ ජනතාවට සාධාරණය කළා. අද දොන් ජුවන් ධර්මපාලලා සිටිද්දී ඒගොල්ලෝ ජාත්‍යන්තර ඉලක්කයන් හදනවා. හොඳට මතක තියා ගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිංහලේ තමයි ලංකාවේ පළමුවැනි නම. මේ ලංකාවට හොඳ ඉතිහාසයක් තිබෙනවා. බලංගොඩ මානවයා, හෝමෝ සේපියන්, අවුරුදු තිස් පන්දාහකට වැඩි කොටසක් ජීවත් වෙලා තිබෙනවා ලංකාවේ. මේ ලංකාව ඉතිහාසයක් තිබෙන රටක්. සිංහලේ කියන්නේ ලංකාවේ පළමු නම. සිංහලේ කියන්නේ සිව් හෙළය කියන එක. නමුත් ඒ සිව් හෙළය කවදාවත් දෙමළ මිනිස්සු එක්ක රණ්ඩු සරුවල් කළේ නැහැ. ජාතික ප්‍රශ්නයක් තිබුණේ නැහැ. රජකමට ප්‍රශ්න තිබුණා. එළාර රජ්ජුරුවෝ එහේ පාලනය කළා. මෙහේ රජ්ජුරුවෝ මෙහේ පාලනය කළා. රජකමට ජාතිවාද ප්‍රශ්න තිබුණේ නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබුණා නම්, අද අපේ ගෙවල්වල, අපේ ගමේ බිමේ ඉඩම් වෙන්දේසි කරන කොට දෙමළ අය එනවා. මුස්ලිම් අය එනවා. කවුද සොයන්නේ? කවුද බලන්නේ? කවුද ගහන්නේ? හැබැයි, මේ සිංහල අපට යාපනයේ බිම් අඟලක් ගන්න බැහැ. යාපනයේ ඉඩම් කෑල්ලක් ගන්න බැහැ. අපේ ගම්වල කෝවිල් ගහනවා. අන්න බලන්න පෑලියගොඩ පාලම පනින කොට මහා විශාල කෝවිලක් හදනවා. නුවර පාරට පනින කොට. උද්ඝෝෂණය කරන්නේ කවුද? එපා කියන්නේ කවුද? එහෙම එපා කියන්නේ නැහැ. උද්ඝෝෂණය කරන්නේ නැහැ. එහෙම සිංහලයෝ නැහැ. හැබැයි, යාපනයේ පුංචි බුදු ගෙයක් තිබුණාම ඒක අයින් කරන්න කියනවා. කොහේද සංහිඳියාව? සංහිඳියාව මෙහේ තියෙනවා. නැත්තේ එහේ. ඒගොල්ලොයි මේ සංහිඳියාව පටන් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඔය කෑ ගහන දෙමළ නායකයෝ. දෙමළ ජනතාවට තමයි මහින්ද රාජපක්ෂ මහත්තයා වැඩිම සේවය කරලා තිබෙන්නේ. යුද්ධය තිබෙන කාලයේ ඒ දරුවන්ට ඉස්කෝලේ යන්න නැහැ. අවුරුදු දහ හතර, පහළොව වෙද්දී එල්.ටී.ටී.ඊ. යෙන් උස්සාගෙන යනවා. කැලේ හැංගිලා ඉන්නවා. අද එහෙම තත්ත්වයක් නැහැ. අද ඒ දරුවෝ ඉගෙන ගන්නවා. අද කොළඹ එනවා. ඉස්සර කොළඹ එන්න දෙමළ ජනතාවට දවස් තුනක් විතර යනවා. කොහේ හරි ජැටියකට ගිහිල්ලා නැවකට නැගලා එහෙන් කොළඹට එන්න ඕනෑ. අද කෝච්චියට නැග්ගාම කොළඹට එන්න යන්නේ පැය දොළහයි. ඒ තත්ත්වය තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හිතලා බලන්න. එදා අපට මතකයි ප්‍රවෘත්තිවලදී හමුදා කඳවුරකට පහර දීලා. කොටින්ගෙන් පහයි. හමුදාවෙන් දෙකයි. හතක් අටක් දවසකට මැරිලා. එතකොට හත අට ගණනේ දවසකට - දැන් යුද්ධය නතර වෙලා අවුරුදු හයක් වෙනවා. යුද්ධය මේ දක්වා තිබුණා නම් දවසකට පහ දහය නොවෙයි. අවුරුදු හයකට දින කීයක් තිබෙනවාද? මේ වෙද්දී මේ රටේ ශ්‍රී ලාංකිකයෝ කී දාහක් මැරිලාද? කී දාහක් අනාථ වෙලාද? බෝම්බ කීයක් ගිහිල්ලාද? ආර්ථිකය කොපමණ වැටිලාද? මේ යහපාලන ආණ්ඩුවට ආර්ථිකය ගොඩ ගන්න බැරි වුණාට, යුද්ධයක් නැති රටක, ත්‍රස්තවාදය නැති රටක යහපාලනයට ආර්ථිකය ගොඩ ගන්න බැරි වුණාට මහින්ද රාජපක්ෂ පළි නැහැ. ඒ නිසා මේකේ තිබෙන්නේ අද ඔබතුමන්ලාගේ නායකයා කවුද? අනුර කුමාර දිසානායක. රතු අලි පැටියා. අද පත්තරේ කියලා තිබෙනවා මම දැක්කා, මේ ආණ්ඩුව මාරුවෙන් මාරුව විකුණනවා කියලා. ඇයි මේ? කර ගන්න බැහැ. විකුණලා වෙන කෙනෙකුට කියනවා, උඹ කරගෙන පලයන්. අපට බද්දක් ගෙවපන්. ඕගොල්ලොත් මේ යහපාලනයට කඩේ ගියා. වගකියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉවර කරන්නම්. මේ ලංකාව මේ තත්ත්වයට වැටෙන්න පළමුවැනිම පක්ෂය තමයි ජනතා විමුක්ති පෙරමුණ. සද්ද නැතිව අහගෙන ඉඳලා මට ඊට පස්සේ උත්තර දෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කවුද විග්නේෂ්වරන්ද ඕක කිව්වේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. විග්නේෂ්වරන් කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මාතෘකාවට අදාළව කථා කරලා අවසන් කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බුදු හාමුදුරුවෝ බුදු වෙන්නත් පස් මහ බැලුම් බැලුවාලු. දීපය, දේශය, කුලය, ජාතිය, මව. 1970 පත් වුණු ආණ්ඩුවට 1971 ගහනවා. ආවා විතරයි. අනේ සිරිමාවෝ මැතිනිය අවම බලය පාවිච්චි කරලා, මර්දනය කරලා, විජේවීර මහත්තයාව රිමාන්ඩ් කළා. 1982 ජනාධිපතිවරණයේදී විජේවීරලා, ගමනායකලා, පියසිරි ගුණරත්නලා ඔක්කොම මැරුවේ නැහැ. සමූල ඝාතනය කළේ නැහැ. හිරේ දාලා පසුව ජනාධිපතිවරණයට ඉල්ලුවා. ඊළඟට ඒ වෙලාවේ තිබුණු කල්ලි ටික විනාශ කළා. ඒකේදී වුණු දේවල් එක්ක තමයි ජේ.ආර්. ජයවර්ධන මහත්තයා 5/6 ක බලයක් ගත්තේ. ඒ 5/6 බලයත් එක්ක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මනාප ක්‍රමය, ජනාධිපති ක්‍රමය, ජනමත විචාරණ මේ රටට හොඳ නැහැයි කියන ඔක්කොම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හඳුන්වලා දුන්නේ. ඒ තරම් අසීමිත බලයක් එක්සත් ජාතික පක්ෂයට 77 දී ලබා ගත්තේ මේ ජේවීපී එක හින්දා. (බාධා කිරීමක්) ආයිත් ජේ.ආර්. ජයවර්ධන මහත්තයා රට හොඳට කර ගෙන ආවා. ඇත්ත කියන්න එපැයි. මම ඉන්නේ කටුනායක කිට්ටුව. වෙළඳ කලාප ඇති කරලා හොඳට කරගෙන ආවා. කරගෙන එන කොට 89 කැරැල්ලක් ගෙනැල්ලා - ඉස්කෝලේ යන කාලේ උස්සගෙන ගිහිල්ලා මේ මගෙත් නියපොතු ගැලෙව්වා. මම ජේ.වී.පී. කියලා. මම නම් ජීවිතේට ජේ.වී.පී. වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආයෙත් ආර්ථිකය වට්ටවලා දැම්මා. සමහර විට ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට ඒ කාලේ යුද්ධය අවසන් කරන්න තිබුණා. ඒ යුද්ධය අවසන් කරන්නේ කොහොමද? මේ කාලකන්ණි මෙහේ යුද්ධ කරනවා නේ? ජේ.වී.පී. එක. ඒ නිසා මෙහෙත් යුද්ධය ඉවර කරන්නත් ඕනෑ. එහේ යුද්ධය ඉවර කරන්නත් ඕනෑ. සමහර විට මේ ජේවීපී කියන කට්ටිය එහෙම කැරැල්ලක් ඇති නොකළා නම් ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට එදා යුද්ධය අවසන් කරන්න තිබුණා. එහෙම නම් මේ රටට වැඩියෙන්ම හානිය කළේ, ජනතා විමුක්ති පෙරමුණ. එල්.ටී.ටී.ඊ. ය නොවෙයි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔය කඩේ ගිය ජනතා විමුක්ති පෙරමුණට මම මතක් කරනවා. ඔබතුමන්ලා හිතන්නේ නැති වුණාට මේ පස්සේ ඉන්නේ විග්නේෂ්වරන් නොවෙයි ඊට වඩා ඔබ්බෙන් ගිය ජාත්‍යන්තර උවමනාව මේ ඉෂ්ට වෙන්නේ. ඒ නිසා බස්නාහිර පළාත් සභාව වශයෙන් අපි මේකට විරෝධය -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

2005?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි මොකක්ද වුණේ? මම දන්නේ නැහැ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව වශයෙන් මධ්‍යම රජයට මේ යහපාලන ආණ්ඩුවට යෝජනා කරලා යවන්න අපි මේකට විරුද්ධයි කියලා. 2005 ද? මහින්ද මහත්තයා ගේන්නද? උදව් කළා. අපි පිළිගන්නවා. ස්තුතිවන්ත වෙනවා. හැබැයි ඉතින් උදව් කරලා කකුලෙන් ඇද්දා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උත්තරය දෙන්නම් ඒකට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගෙදරට ගෙනැල්ලා කෙනෙකුට කන්න දෙනවා. කන්න දෙන්නේ මරන්න බලාගෙන. කන්න දෙන එක ප්‍රශ්නයක් නැහැ නේ? මරලා දැම්මා නේ? වැඩේ කර ගත්තා නේ? වැඩේ ඉවරයි. මොකද කියන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේගොල්ලෝ කියනවා සල්ලි ගත්තා කියලා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මොකක්ද මාතෘකාව කියලා දන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නැහැ. මාතෘකාවේ ටික කිව්වා නේ? අහන ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මාතෘකාව ජේ.වී.පී ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ කාලේ යහපාලනයට කඬේ ගියා. දැන් විග්නේෂ්වරන්ට කඬේ යනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ විරුද්ධත්වය මධ්‍යම රජයට යවන්න, ඒ විග්නේෂ්වරන් මහත්තයා කරපු ප්‍රකාශය අපි හෙළා දකිනවාය කියලා. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.39 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව සාකච්ඡා වන අතරවාරයේ විවිධ දේ හෙළිදරව් වීම් සිදු වුණා. විශේෂයෙන්ම අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාගේ ඉතිහාසය පිළිබඳ දැනුම. මහා විශාල දැනුම අපට පැහැදිලි කර ගන්න අවස්ථාව ලැබුණා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන පරිවර්තනය ගැන අපට පැහැදිලි වුණා. අපි ඉතාම සතුටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ අද ඉන්න දේශපාලන ස්ථාවරත්වය ගැන. අපි ප්‍රාර්ථනා කරනවා, මේ දේශපාලන ස්ථාවරය දිර්ඝ කාලීනව වෙනස් කර ගන්නේ නැතිව ඉස්සරහාට ගෙනියන්න කියලා. මොකද, මම එහෙම කියන්නේ ඒක හිටපු ගමන් වෙනස් වන හින්දා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම කියන්නේ, 1982 ජනාධිපති මැතිවරණය තියපු වෙලාවේ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා පොදු අපේක්ෂකයා වුණාම, වමේ සන්ධානයේ විජය කුමාරතුංග මහත්තයා ගියා විජේවීර මහත්තයාව හමු වෙන්න. ගිහිල්ලා කිව්වා, පොදු අපේක්ෂකයාට සහයෝගය දෙන්නය කියලා. එතුමා කිව්වා, කල්පනා කරලා කියන්නම් කියලා. එතුමා හැන්දෑවේ කථා කරලා කිව්වේ, පක්ෂයේ සහෝදරවරු අකමැතියි. මම ඡන්දයට ඉදිරිපත් වෙනවාය කියලා. හැබැයි, 1982 දී එතුමාට රට පුරාම ගිහිල්ලා ඡන්දය ගන්න උවමනාවක් තිබුණා. එතුමා ඡන්දය ඉල්ලන්න යාපනයට ගියා. යාපනයේ රැස්වීමේ කථා කරන කොට - මේ සභාවේ ඉන්න හැමෝටම You tube එක හරහා මේක දකින්න පුළුවන්. මම මීට කලිනුත් මේ සභාවේ කිව්වා. යාපනයේ රැස්වීමේ විජේවීර මහත්තයා කථා කරන කොට සිවිල් දෙමළ වැසියෙක් ගල් පහරක් ගැහුවා විජේවීර මහත්තයාගේ මුහුණට. ඒ මහත්තයාගේ මුහුණෙන් ලේ වැක්කෙරෙන කොට, ලේ පෙරෙන කොට, ලේ පෙරෙන මුහුණ අත ගගා එතුමා කිව්වා, "*මේ ගල් පහර මම පිළිගනිමි. දෙමළ ජාතියේ ස්වයං නිර්ණය අයිතිය මම අනුමත කරමි*" කියලා කිව්වා. හැබැයි, 1989 වන කොට මේක හාත්පසින් වෙනස් කළා. 100% ක් අනික් පැත්තට ගියා. දෙමළ ජාතියේ ස්වයං නිර්ණය අයිතිය නොවෙයි. මේ කොළඹ ජීවත් වන දෙමළ මිනිහෙකුටවත් ඉන්න දුන්නේ නැහැ. එහෙම තැනට රට පත් කළා. අද නැවත ආපහු අනික් පැත්තට ගිහිල්ලා නැවත වතාවක් කියනවා. දෙමළ ජාතියේ ස්වයං නිර්ණය අයිතිය වෙනුවෙන් අපි පෙනී ඉන්නවා වාගේ කථාවක් තමයි කියන්නේ. ජාතිවාදය ප්‍රතික්ෂේප කරනවාය කියලා කියනවා. අපි ඒ ගැන බොහොම සතුටු වෙනවා. ඉතින් අපි අපේ ඉල්ලීම, මේ අදහස නැවත වතාවක් ආයිත් වෙනස් කරන්න එපාය කියලා. එහෙම වුණොත් දකුණ පැත්තෙන් රටේ ඇති වන සංහිඳියාවට බලපාන ප්‍රධානම කාරණය නිරවුල් වුණා බවට පත් වෙනවා. දැන් තිබෙන්නේ උතුරේ ප්‍රශ්නය. අපි විශ්වාස කරනවා. ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, දේශපාලන අඳබාලයෙක්ය. දේශපාලන හිස් ගොඩක්ය. දේශපාලනය තේරෙන්නේ නැති කෙනෙක්ය විග්නේෂ්වරන් කියලා. අපි නම් එහෙම පිළිගන්නේ නැහැ. විග්නේෂ්වරන් හොඳට දේශපාලනය තේරෙන එක්කෙනෙක්. විග්නේෂ්වරන් තමන්ගේ වගකීම නිවැරදිව ඉෂ්ට කරන කෙනෙක්. ඔහුට භාර දුන් වගකීම හරියටම ඉෂ්ට කරනවා. මම මීට කලිනුත් කිව්වා. විග්නේෂ්වරන් ඉපදුණේ කොළඹ. විග්නේෂ්වරන් ඉස්කෝලේ ගියේ කොළඹ. විග්නේෂ්වරන් හැදුනේ වැඩුනේ කොළඹ. ඔහු සියලු සමාජ අත්දැකීම් ගත්තේ කොළඹින්. ඡන්දයෙන් පස්සේ තමයි යාපනයට ගිහිල්ලා දාන්නේ. මහ ඇමතිවරයා කරන්නේ. ඔහුව හඳුනන්නේ නැතිවද දෙමළ ජාතික සන්ධානය ඔහු මහ ඇමති බවට පත් කරන්නේ. ඔහුව ඉතාම හොඳින් හඳුනනවා. ඔහුගේ දේශපාලන වගකීම ඔහුට තේරුම් බේරුම් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ඔහුව ගිහින් දාන්නේ. අද අපි යුද්ධය දිනලා තිබෙනවා. හැබැයි, සාමය දිනුවාද කියන ප්‍රශ්නය මේ රටේ මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේ සාමය ඇති කරන්න නායකයෝ ගණනාවක් උත්සාහ ගත්තා. ඒ උත්සාහයේම

මේ රටේ අද ඉන්න නායකයෝත් යනවා ඇති. හැබැයි, ඒ උත්සාහය ඉස්සරහාට ගියොත් තමන්ගේ දේශපාලන උවමනාව ඉෂ්ට කර ගන්න බැරි බව දන්න නිසා තමයි විග්නේෂ්වරන්ව පාවිච්චි කරන්නේ, මේ රට අස්ථාවර කරන්න. ඒ නිසා මේවා මේ රට අස්ථාවර කිරීමේ දේශපාලන ප්‍රකාශ. ඒකේ යම් යම් සත්‍යතාවයන් තිබෙනවා. එතුමා සිංහල භාෂාවෙන් කිව්වා. රටේ ජනාධිපතිතුමා ඉන්න තැනම මේ රටේ නීතියක් තිබෙනවා. හමුදාව පාවිච්චි කරලා, සිවිල් වැසියන්ගේ ඉඩම්වල බලහත්කාරය පාවිච්චි කරලා පන්සලක් හදනවා නම්, වෙන එකක් හදනවා නම් ඒක වැරදියි කියලා. ඒක රට පුරාම වැරදියි. අපි අද මෙතැන ඉඳගෙනත් කියනවා. හමුදාව හරි කවුරු හරි පාවිච්චි කරලා රටේ කොයි කොණක හරි ආගමික සිද්ධස්ථානයක් බලහත්කාරයෙන් හදනවා නම්, ඒක වැරැද්දක්. ඒක කරන්න පුළුවන්කමක් නැහැ. ඒක උතුරේත් නතර වෙන්න ඕනෑ. ඒක දකුණේත් නතර වෙන්න ඕනෑ. හැබැයි, මේ හැම දෙයක්ම සිද්ධ වෙන්නේ හමුදාව පාවිච්චි කරන එක, හමුදාව පාවිච්චි කරලා කරන වැඩේ මහා විශාල විදියට පෙන්වන එක. මේක තමයි ජාතිවාදීන්ගේ උවමනාව. හැබැයි, මේ ජාතිවාදී උවමනාව ඉෂ්ට කර ගන්න ඒ අයට තිබෙන අවස්ථාවට පාවිච්චි කරන්නේ විග්නේෂ්වරන්ව. දකුණ අවුස්සන්න තමයි මේ ප්‍රකාශය කරන්නේ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඉතාම හොඳින් කිව්වා. අපි මේ ගන්න යෝජනාව, මේ කථා කරන එකත් ඊට ඉඩකඩ සැලසීමක් කියලා. සමහර විට ඒක වෙන්න පුළුවන්. මේ කථා කරන හැම වෙලාවේම ඒ වාසිය උතුරට යන්න පුළුවන්. ඒ වාසිය විග්නේෂ්වරන්ට යන්න පුළුවන්. ඒ වාසිය ඩයස් පෝරාවට යන්න පුළුවන්. ඩයස් පෝරාව හිස් එකක් නොවෙයි. ඒක ලෝකය පුරාම ඉතාමත්ම ශක්තිමත්ව ක්‍රියාත්මක වෙනවා. ඒ අය ඒ අයගේ දේශපාලන උවමනාව වෙනුවෙන් ලෝකය පුරා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒකේ එක පියවරක් තමයි විග්නේෂ්වරන්.

ඒ නිසා අපි මේ වෙලාවේ බොහොම නිරවුල්ව, පැහැදිලිව දකුණේ අපේ දේශපාලන තීන්දු තීරණ ගත්තේ නැත්නම් උතුරට මහා විශාල වාසි අත් වෙනවා. උතුරේ ජනතාවට වෙන්ව යන්න පුළුවන් පරිසරයක් හදලා දෙන්න මේ නායකයෝ කටයුතු කරනවා. ඒ නිසා මේ රට එකට තිබෙන්න ඕනෑ. එකට තිබෙන ගමන් ප්‍රාදේශීක ස්වාධීනත්වයන් ආරක්ෂා වෙන්නම ඕනෑ. ඒක තමයි සන්ධීය ආණ්ඩු ක්‍රමයක මූලධර්මය. ඒ මූලධර්මය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් කියන්න ඕනෑ. මේ රටේ ව්‍යවස්ථාවක් හදන්න ඕනෑය කියලා. කවුරුහරි කියනවා නම් අලුතෙන් ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ නැහැයි කියලා, ඒක තරම් ජාතිවාදී ප්‍රකාශයක් නැහැයි කියන විශ්වාසයේ තමයි අපි ඉන්නේ. ව්‍යවස්ථාවක් අලුතෙන් හැදෙන්න ඕනෑ. මේ රටේ සියලු සහෝදර ජාතීන්ට එකට ජීවත් වෙන්න පුළුවන් ව්‍යවස්ථාවක් හදලා, ව්‍යවස්ථාමය වශයෙන් මේ රටේ ජාතීන් ගැටෙන එක නතර කළේ නැත්නම් හැමදාමත් යුද්ධය මේ රටේ ඇති වේවි. ඒ නිසා ඒක නතර කරන්න අපි සියලු දෙනාගේ වගකීම. ඒ වෙනුවෙන් තිබෙනවා. ඒ වෙනුවෙන් දේශපාලන කථිකාවතක් යනවා. ඒකේ මේ පක්ෂ ඔක්කොම නියෝජනය වෙනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වේ ඒක. හැබැයි, ඒක ක්‍රියාත්මක වන කොට ඒක අසාර්ථක කරන්න දරන උත්සාහයන් හෙළා දකින එකත් මේ සභාවල්වල වෙන්න ඕනෑ. සමහර අයට ඒක කර ගන්න බැහැ. ඒක තමයි යූ.එන්.පී. එකට අද සිද්ධ වුණේ. මොකද, යූ.එන්.පී. එක විශ්වාස කරනවා, මේ ප්‍රකාශ තමන් ජනතාව මත පටවන විශාල බදු බර, ජනතාව මත පටවන විශාල පීඩාකාරී දේවල් කර ගෙන යන්න මේ ප්‍රකාශ හේතු පාදක වෙනවාය කියලා. රට අස්ථාවර වන කොට ඒ අයට ලෙහෙසියි තමන්ගේ ක්‍රියාමාර්ග ඉස්සරහාට ගෙනියන්න. අද මේ රටේ බදු පැනවීමේ ක්‍රියාමාර්ගයක් ඉස්සරහාට යනවා. ඕනෑම රටක බද්දක් පනවද්දී, විශේෂයෙන්ම ලංකාවේ. ඒ බද්ද පනවන එක රටේ රාජ්‍ය නායකයා දැන ගන්න ඕනෑ. රටේ රාජ්‍ය නායකයා ඒ බද්ද පනවන බව දැන ගන්නේ, කැබිනට් මණ්ඩලයට ඒ බද්ද පනවන බවට, පනත ගෙනාවාට පස්සේ. හැබැයි, කැබිනට් එකට යන්නේ නැතිව පනත පාර්ලිමේන්තුවට එනවා. රටේ රාජ්‍ය නායකයාට කියන්නේ නැතිව පනත පාර්ලිමේන්තුවට ගේනවා. පාර්ලිමේන්තුවේ මේක සම්මත වුණාට පස්සේ ඒකට ලස්සන සීනි බෝලත් තවරලා තිබෙනවා. අද කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් යෝජනා ඇතිව තමයි අලුත් වැට් සංශෝධන පනත ගේන්නේ කියලා. ඒ නිසා ශ්‍රී ලංකා අයගේත් එකඟතාවය තිබෙනවයා කියලා රටට කියන්න උත්සාහ කරනවා.

රටේ මිනිස්සුන්ගේ සාක්කුවට පොකට් එකට විදින්න, සාක්කුවට පොකට් එකට විදලා රට කරන්න වාසි සහගත තත්ත්වයක්, මේ ඇති වන තත්ත්වයන් උඩ රට ඇතුළේ මතු වෙනවා. ඒකට උදව් කරන්න ඕනෑ නිසා තමයි යූ.එන්.පී. එක නැගිටලා ගියේ. ඒ නිසා මේ සියල්ලට අපි විරුද්ධයි.

[ගරු මහේෂ් අල්මේදා]

රටේ මිනිස්සුන්ට හිරිහැර කරන එක, රටේ මිනිස්සු ජාතීන් විධියට බෙදන එක, රටේ මිනිස්සු ජාතීන් විධියට එකට අවුලවන එක, මේ සියල්ල නතර වුණොත් තමයි මේ රටට සාමකාමීව ඉස්සරහාට යන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා විග්නේෂ්වරන් හුදෙකලා චරිතයක් නොවෙයි. විග්නේෂ්වරන්ගේ දේශපාලන ක්‍රියාමාර්ග, හුදෙකලා දේශපාලන ක්‍රියාමාර්ග නොවෙයි. ඒ නිසා මේවා නිවැරදිව තේරුම් අරන්, දකුණ නිවැරදිව හැසිරුණොත් තමයි මේ රටේ සංහිඳියාව ක්‍රියාත්මක වෙන්නේ. ඒ වෙනුවෙන් කටයුතු කරන්න බල කරන යෝජනාවක් තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා කවුරු හරි ජාතිවාදියෙක් ප්‍රකාශ කරනවා නම් - අපට මතකයි, උතුරු පළාත් සභාව හදන කොට එදා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව ඇතුළේ හිටපු ජාතිවාදී ඇමතිවරු කිව්වා, පළාත් සභාවක් හදන්න එපාය කියලා. උතුරේ මිනිස්සු ඉඩම් බලතල ඉල්ලයි. උතුරේ මිනිස්සු පොලිස් බලතල ඉල්ලයි. උතුර වෙනම කඩලා යයි. උතුර වෙනම රටක් වෙයි. ඒ නිසා මේක දෙන්න එපාය කියලා කිව්වා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්තයාට කොන්දක් තිබුණා, ප්‍රජාතාන්ත්‍රිකයෙකු විධියට උතුරේ මිනිස්සුන්ට තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කර ගැනීමේ අයිතිය දෙන්න. ඒකට තමයි උතුරු පළාත් සභාව ඇති වුණේ. අවාසනාවට උතුරේ මිනිහෙක් නොවෙයි උතුරු පළාත් සභාවේ මහ ඇමති වුණේ. ඩයස් පෝරාවට, දෙමළ ජාතික සන්ධානයට උවමනා කරන මනුස්සයාව අද උතුරේ මහ ඇමති කරලා තිබෙනවා. ඔහු, ඔහුගේ න්‍යාය පත්‍රය නැත්නම් ඩයස් පෝරාවේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කර ගෙන ඉන්නවා. මේක පරාජය කරන්න අපි කටයුතු කළ යුතුයි කියන කාරණාව තමයි මේ යෝජනාව ඇතුළේ තිබෙන්නේ. ඒ නිසා මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව අපි මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 01.49 ]

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. උතුරේ මහ ඇමති සී. විග්නේෂ්වරන් මැතිතුමා කරන ලද ජාතිවාදී ප්‍රකාශයන් සම්බන්ධයෙන් විරෝධතාවය දක්වන්න බස්නාහිර පළාත් සභාවක් විධියට යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වන අතරේ විශේෂයෙන්ම අපි විශ්වාස කරනවා මේ සම්බන්ධයෙන් අදහසක් දක්වන්න දකුණේ අපට යුතුකමක් තිබෙනවාය කියලා. ඒ වෙන කිසිවක් නිසා නොවෙයි. මට ඊයේ පෙරෙයිදා දවසක මූණ ගැසුණා. විශේෂයෙන්ම මම ජීවත් වන ප්‍රදේශය සුළු ජාතිකයින් ජීවත් වන ප්‍රදේශයක්. මම සිංහලයෙක් වුණාට මගේ අම්මාත් සුළු ජාතික කාන්තාවක්. ප්‍රනාන්දුපුල්ලේ කෙනෙක්. මගේ පියාගේ මවත් සුළු ජාතික කාන්තාවක්. හැබැයි, අපේ ප්‍රදේශවල එහෙම සංහිඳියාව පිළිබඳව ගැටළුවක් නැහැ. හැබැයි, ඊයේ පෙරෙයිදා ඒ සුළු ජාතික මගේ මිතුරෙක් මගෙන් අහනවා, මේ විග්නේෂ්වරන් කියන දේවල් සම්බන්ධයෙන් ඇයි සිංහල කවුරුවත් පළාත් සභාවේ කථා කරන්නේ නැත්තේ කියලා. ඇයි පාර්ලිමේන්තුවේ කථා කරන්නේ නැත්තේ කියලා අපෙන් ප්‍රශ්න කරනවා. ඒ සුළු ජාතික අයට පවා, ඒ දෙමළ ජාතික අයට පවා දැනිලා තිබෙනවා, මේ විග්නේෂ්වරන් එන්නේ මේ රට දෙකඩ කරලා වෙනත් අරමුණු ඉෂ්ට කර ගැනීමේ පටු පරමාර්ථයක් ඇතිවයි කියන එක. ඒ නිසා ඒකට විරුද්ධව මේ සුළු ජාතිකයෝ අද කථා කරන කාලයක සිංහල අපට කථා කරන්න බැරි නම්, දකුණේ අපට කථා කරන්න බැරි නම්, ඒක කථා කරන කොට ඒක වැරදියි කියලා කියනවා නම්, ඒ තරම් තවත් ජාතිවාදීන් නැහැයි කියලයි මම විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම අපි දන්නවා, වසර 30 ක කාලයක් තිස්සේ පැවතුණු ඒ යුද්ධයත් එක්ක රට වසර ගණනකින් පස්සට ගියා. රටේ ආර්ථිකය වසර ගණනකින් පස්සට ගියා. තරුණ ජීවිත, වැඩිහිටි ජීවිත විශාල සංඛ්‍යාවක් අපට අහිමි වුණා. හැබැයි, මේ යුධ ජයග්‍රහණයෙන් පස්සේ යුද්ධය අවසන් වුණාට සැබෑ සාමය ඇති වුණාද කියන එක පිළිබඳව අපි කවුරුත් මධ්‍යස්ථව කල්පනා කරන්න ඕනැය කියලා මම විශ්වාස කරනවා. මේක මගේ පුද්ගලික මතය. ඒ නිසා ඒ යුද්ධයෙන් පස්සේ උතුරේ දෙමළ ජනයා, දකුණේ සිංහල ජනයා, ඒ වාගේම වෙනත් ජාතීන් අතර සංහිඳියාවක් ඇති කර ගන්න මේ ව්‍යවස්ථාවෙන් තිබෙන ඉඩකඩ මොකක්ද කියන එක පිළිබඳව අපි නැවත සොයා බලන්නට ඕනෑ. විශේෂයෙන්ම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැහැදිලි බලය බෙදීමක් ලැබිලා තිබෙනවා, සියලුම ජාතීන්ට අවශ්‍ය වන පරිදි ඒගොල්ලන්ගේ දේශපාලන කටයුතු කර ගෙන යන්න. ඒගොල්ලන්ගේ අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගන්න පුළුවන් ව්‍යවස්ථාවක් 13 වන ව්‍යවස්ථාව ඇතුළේ වට

පිටාවක් තිබෙනවාය කියලා අපි විශ්වාස කරනවා. යම්කිසි බලය බෙදීමක්, යම්කිසි අයිතිවාසිකමක් මේ අයට ලැබිය යුතුයි. හැබැයි, ඒ ලැබිය යුත්තේ. අපි දන්නවා ලෙඩෙකුට බෙහෙත් දෙන කොට අපි යම්කිසි මාත්‍රාවකට අනුව තමයි බෙහෙත් දෙන්නේ. නියමිත මාත්‍රාවට. ඒ වාගේම තමයි බලය බෙදීම සම්බන්ධයෙන් කථා කරන කොටත් යම්කිසි මාත්‍රාවක් ඇතුළේ ඉඳගෙන තමයි ඒ බලය බෙදීම ගැන කථා කරන්න ඕනෑ. ඒ නිසා මාත්‍රාව ඉක්මවා ගියොත් ලෙඩා මැරෙනවා. ඒ නිසා බලය බෙදීමේදීත් ඒ නියමිත මාත්‍රාව ඉක්මවා ගියොත් ඒක තවත් ප්‍රශ්නයකට මුල පුරනවා.

ඒ නිසා අපි විශ්වාස කරනවා, පළාත් සභා ක්‍රමය තුළ 13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ තිබෙන මේ බලය ඉතාමත්ම ප්‍රමාණවත් රටේ සංහිඳියාව තුළ ජීවත් වෙන්න. ඒක ඉතාම ප්‍රමාණවත්. නමුත් අද වන කොට කථා බහට ලක් වෙනවා අලුත් ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන්. මේ ව්‍යවස්ථාව පිටිපස්සේ මොකක්ද තිබෙන්නේ? මේ ව්‍යවස්ථාව පිටිපස්සේ තිබෙන්නේ ඉස්සරහාට කියනවා, ජනතාවට කියනවා, මේ ව්‍යවස්ථාව තුළ මැතිවරණ ක්‍රමය වෙනස් කරනවාය කියලා. විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවාය කියලා. හැබැයි, මේ ව්‍යවස්ථාව පිටිපස්සේ එන්නේ ෆෙඩරල් ක්‍රමයකට රට ගෙනියන, උතුරේ වෙනම රාජ්‍යයක් ඇති කරන්න වටපිටාව හැදෙන වෙනත් ව්‍යවස්ථාවක්. ඒ නිසා ඒකට ඉඩ දෙන්න අපි කාටවත් පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ වෙනුවෙන් අද විශේෂ යෝජනාවක් සාකච්ඡා වන දවසක අදහසක් පළකරන්න යුතුකමක් තිබෙනවාය කියලා කල්පනා කළා.

ඒ වාගේම තමයි දැන් සංහිඳියාව ගැන කථා කරනවා. සංහිඳියාව ගැන කථා කරන කොට අපේ අර අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ දකුණේ පැහැදිලි සංහිඳියාවක් තිබෙනවා. දකුණේ අපි සියලු දෙනා බොහොම සහයෝගයෙන්, සහයෝගීතාවයෙන් ජීවත් වෙනවා. හැබැයි, අපි උතුරට ගිහිල්ලා මේ දකුණේ ජීවත් වෙනවා වාගේ - දකුණේ සිංහල අපි, දෙමළ අපි සහයෝගයෙන් ජීවත් වෙනවා වාගේ උතුරට ගියාමත් සිංහල සහ දමිල ජනතාවට ඒ සහයෝගයෙන් ජීවත් වෙන්න පුළුවන් වට පිටාවක් තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා තමයි දකුණේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ උතුරු විශ්ව විද්‍යාලයේදී සිංහල උඩරට නැටුම් නටන කොට එළව එළවා පහර දුන්නේ. ලේ පෙරෙනකල් පහර දුන්නේ. හැබැයි, අපේ රටේ නායකයෝ කිසිම කෙනෙක් ඒ ගැන කථා කරන්න - වගකිවයුතු නායකයෝ කිසිම කෙනෙක් ඒ ගැන කථා කළේ නැහැ. සංහිඳියාව කියලා ඒ ශිෂ්‍යයෝ රෝහලේ ඉන්න කොටම ඒ පහර දීපු ශිෂ්‍යන්ට ඇප ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. අපට දැන ගන්න ලැබුණා කොළඹට ගෙනැල්ලා කෑම වේලකුත් ලැබුණාය කියලා. ඒක තමයි තත්ත්වය. ඒ නිසා මේ තුළින් සංහිඳියාව ඇති කරන්නට බැහැයි කියන එක අපි මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. ඒ වාගේම තමයි විශේෂයෙන්ම මේ මාතෘකාවන් පිළිබඳව සාකච්ඡා කරමින් එන කොට අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා පත්තර වාර්තාවක් සභාවට ඉදිරිපත් කළා. මට විශේෂයෙන්ම අවස්ථාව අවශ්‍ය වුණේ, ඒ සම්බන්ධයෙන් අදහසක් දක්වන්න. ඊයේ දිනයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා දෙමළ මාධ්‍යවේදීන් එක්ක කරපු ඒ මාධ්‍ය සාකච්ඡාවේදී එතුමා පැහැදිලිවම කියනවා, විග්නේෂ්වරන් ජාතිවාදියෙක් නොවෙයි කියලා. ඒක පුවත්පත්වල විවිධ විධියට පළ වුණා. මේ මගේ අතේ තිබෙන්නේ BBC පුවත් සේවය වාර්තා කරන ලද ඒ පුවත් සේවයේ වෙබ් අඩවිය වාර්තා කරන ලද ප්‍රවෘත්තිය. මේකේ මෙහෙම කියනවා.

*"උතුරු පළාතේ මහ ඇමති සී.වී. විග්නේෂ්වරන් ජාතිවාදියෙක් යැයි තමා විශ්වාස නොකරන බව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පවසයි."*

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කියපු එක ඇත්ත.

*"මම දන්නවා, මහ ඇමතිතුමා නම් ජාතිවාදියෙක් කියලා මම හිතන්නේ නැහැ. ඔහු කරන්නේ දේශපාලනය. ඒ ටික කිව්වේ නැහැ. ඔහු කරන්නේ දේශපාලනය. ඔහු ළමයින්ට රස්සාවක් දීලා තිබෙනවාද? ඒවාට උත්තර නැහැ. ඉතින් මිනිස්සුන්ට ප්‍රශ්න අමතක කරවන්න ජාතිවාදය හරි මොනවා හරි අටවාගෙන."*

මේ ජනාධිපතිතුමා පැහැදිලිව කියනවා. එතුමා කියන්නේ වෙනත් කථාවක්. අර අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සී.වී. විග්නේෂ්වරන් මැතිතුමා උතුරේ ඉපදුනු කෙනෙක් නොවෙයි. එතුමා උතුරේ ඉගෙන ගත් කෙනෙක් නොවෙයි. උතුරේ ජීවත් වුණු කෙනෙක් නොවෙයි. දකුණේ ජීවත් වුණු කෙනෙක්. කොළඹ හැදී වැඩුණු කෙනෙක්. ඒ නිසා ජනාධිපතිතුමා දන්න සී.වී. විග්නේෂ්වරන් ජාතිවාදියෙක් නොවෙයි. හැබැයි, සී.වී. විග්නේෂ්වරන් ජාතිවාදීයෙකු බවට පත් වෙන්නේ

[ගරු රජිත හපුආරච්චිගේ]

දෙමළ ඩයස් පෝරාවට අවශ්‍යතාවය ඉෂ්ට කරන්න උතුරු පළාත් සභාවේ මහ ඇමතිවරයා වුණාට පස්සේ. ඒක තමයි මේ මහින්ද රාජපක්ෂ මැතිතුමා බොහොම පැහැදිලිව කියලා තිබෙන්නේ. ඒ නිසා ඒ ප්‍රකාශය විකෘති කිරීම සම්බන්ධයෙන් මගේ විරෝධතාවය පළ කරන්නට තමයි මම ඔබතුමාගෙන් කාලය ඉල්ලා සිටියේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.56 ]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත්ම කාලීන වැදගත්කමකින් යුතු යෝජනාවක්. බස්නාහිර පළාත තුළ ගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව එතුමාට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාල පරිච්ඡේදය ගැන කථා කරන කොට දේශපාලනයෙන් මම ඉතා ඈතටම යන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මේ රටේ ජනාධිපති වුණු කාලයේ ඉඳලා මේ උතුරු - නැගෙනහිර තිබුණු ප්‍රශ්නය විසඳන්න බොහොම මහන්සි ගත්තා. විශාල කැප වීමක් කළා. අවසානයේ එතුමියගේ ජීවිතයෙන් කොටසකුත් අහිමි වුණා. ඊට පස්සේ මේ රටේ 2005 මැතිවරණය වෙලාවේ ජනාධිපති අපේක්ෂකයා හැටියට මහින්ද රාජපක්ෂ මහත්තයා ඉදිරිපත් වුණු වෙලාවේ එතුමා එදා ජනාධිපති මැතිවරණයේදී එක් ලක්ෂ ගණනකින් ඡන්දය ජයග්‍රහණය කරලා මේ රටේ ජනාධිපති පදවියට පත් වුණා. එතුමා උතුරු - නැගෙනහිර ප්‍රශ්නය විසඳීමට කටයුතු කරපු නිසා අපට පුළුවන්කමක් ලැබුණා - අපි සඳහන් කළ යුතුයි. මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්නය නිරාකරණය කරලා සාමදානව අපට එකට ජීවත් විය හැකි පරිසරයක් මේ රට තුළ ඇති කළා මහින්ද රාජපක්ෂ මැතිතුමා. මේ රටේ අපි හැම කෙනෙකුම පක්ෂ පාට භේදයකින් තොරව කවුරුත් එතුමාට ඒ ගැන ස්තුතිවන්ත වුණා. අපි දන්නවා එතුමා 2010 මැතිවරණය වෙන කොට මේ රටේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු විශාල පිරිසක් එතුමාට සහයෝගය දුන්නා. මේ රටේ ජනතාව වැඩි වශයෙන් සහයෝගය දීලා වැඩි ඡන්ද ප්‍රමාණයකින් එතුමා දෙවැනි වතාවටත් මේ රටේ ජනාධිපති පදවියට පත් වුණා. අපි යුද්ධය ජයග්‍රහණය කළා. යුද්ධය අපි ජයග්‍රහණය කළාම අපි හැම දෙනාම බොහොම සතුටු වුණා. යුද්ධයේ ජයග්‍රහණයෙන් පසු අපි මේ රට තුළ සාමකාමී පරිසරයක් ගොඩ නැඟීමට, මේ රටේ සහජීවනයක් ඇති කිරීමට වර්තමාන ජනාධිපතිතුමාට විශාල වශයෙන් කටයුතු කරන්න සිද්ධ වුණා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කිසි විටෙකවත් මේ යුද්ධය ජයග්‍රහණය කරපු හිටපු ජනාධිපතිතුමාව අමතක කළේ නැහැ. මම දැකලා තිබෙනවා. ඕනෑම තැනකදී එතුමාගේ කථාවේදී සම්මේලනයේදී පවා හැම අවස්ථාවකදීම මේ උතුරේ යුද්ධය අවසාන කරන්න එතුමා විශාල කැප වීමක් කළාය කියලා කිව්වා. ඉන් පසුව මේ රට තුළ ඇති වෙලා තිබෙන ගැටළුව පිළිබඳව අපේ රට තුළ ජාතික සංහිඳියාවක් ඇති කරන්නට, රට තුළ පමණක් නොවෙයි මුළු ලෝකය පුරාම ඉතාම වැදගත් යුතුකම් රාශියක් අපේ වර්තමාන ජනාධිපතිතුමා ඉෂ්ට කරමින් පවතිනවාය කියන එක සඳහන් කරන්නට ඕනෑ. අපි දන්නවා. පසුගිය කාලය තුළත් පසුගිය ආණ්ඩුව උතුරට විශාල වැඩ කොටසක් කළා. ඒ වාගේම තමයි වර්තමාන ආණ්ඩුවත් හැම වෙලාවේම බැලුවොත්, සති දෙකකට සැරයක් බැලුවොත් හැමදාම උතුරේ සංවර්ධනය සඳහා එක්කෝ අගමැතිතුමා ගිහිල්ලා. නැත්නම් ජනාධිපතිතුමා ගිහිල්ලා.

උදාහරණයක් වශයෙන් ගත්තොත් පසුගිය දවස්වල පැවති අපේ ජාතික ක්‍රීඩා උත්සවය. ජාතික ක්‍රීඩා උත්සවය පවා පවත්වන්න සංවිධානය කරලා තිබුණේ යාපනයේ. ඉතාමත්ම සාර්ථකව අපි මුලදී කිව්වා, විග්නේෂ්වරන් මැතිතුමා මේ උත්සවයට සහභාගී වෙන්නේ නැහැයි කියලා. නමුත් අවසාන උත්සවයට එතුමා සහභාගී වුණා. එතුමා කථාවක් කළා. මම නැවත වතාවක් මේක පුන පුනා කථා කරන්න යන්නේ නැහැ. අපි එදා මේ කරපු ප්‍රකාශය මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා පමණක් නොවෙයි. මේ රටේ සෑම පක්ෂයකම හිටපු - මම විශේෂයෙන් සඳහන් කළොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් අපේ නිමල් සිරිපාල මැතිතුමා ජ්‍යෙෂ්ට උප සභාපතිවරයා හැටියට ප්‍රකාශයක් නිකුත් කළා. මේක වැරදි ප්‍රකාශයක්. ඒක ඉල්ලා අස් කර ගත යුතුයි. මේ රටේ හැම කෙනෙකුම පොදුවේ බැලුවොත් හැම පක්ෂයක්ම, හැම දෙනෙකුම මේ ප්‍රකාශය හෙළා දැකලා කටයුතු කළා. අපිත් අවංකවම මේ ප්‍රකාශයට විරුද්ධව එකට හිටගත්තා. ඒ නිසා පසුගිය කණ්ඩායම් රැස්වීමේ තීන්දු තීරණයක් අරගෙන මෙරිල්

පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවා. නමුත් අද උදේ අපි දකින කොට, අද උදේ පුවත්පත්වලින් ඊයේ රාත්‍රියේ රූපවාහිනී නාලිකාවලින් බලන කොට ඊයේ තිබුණු ජාතික උත්සවයේදී එතුමා කරපු කථාව දෙමළෙන් කථා කරලා, පසුව විනාඩි පහක් පමණ සිංහලෙන් කථා කරලා එතුමා කථා කරපු දේ විකෘති කරලා වැරදි ආකාරයට ප්‍රචාරය කරලා සිංහල ජාතිය අතර මේ ප්‍රශ්නය යැවීම පිළිබඳව එතුමා කනගාටු වුණා. එතුමා කනගාටු වෙලා එතුමා මෙහෙම දෙයක් කළේ නැහැයි කියනවා නම්, අපි එතැන හිට ගන්න සිද්ධ වෙනවා. අපි දන්නවා. යම් යම් පුවත්පත්වලින් වැරදි දේවල් ප්‍රකාශ වෙනවා. සමහර පත්තර ගෙනැල්ලා අපි පෙන්වනවා. අද මේ පත්තරේ පමණක් නොවෙයි. දෙමළ පත්තරවලත්. මට දෙමළ තේරෙන්නේ නැති වුණාට මම කිහිප දෙනෙකුගෙන්ම අහලා බැලුවා. සෑම දෙමළ පත්තරයකම තිබෙන්නේ විග්නේෂ්වරන් ජාතිවාදියෙක් නොවෙයි කියලා මහින්ද රාජපක්ෂ මැතිතුමා කියනවා. එතුමා තවදුරටත් ප්‍රකාශ කරනවා, තමන්ගේ පුතා හිර ගෙදර ඉන්දැද්දී මේ සිරකරුවෝත් එක්ක බොහොම සමඟියෙන් සාකච්ඡා කරලා ඉන්දැද්දී නිදහස් වෙලා ගෙදර ආවාම තාත්තාට කියලා තිබෙන්නේ මොකක්ද? ඇයි තාත්තේ මේ දේශපාලන දෙමළ සිරකරුවන් නිදහස් කරන්නේ නැත්තේ මොකද කියලා. ඒ තැන අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්නවා. මේක අපට පක්ෂයක් පාටක් නොවෙයි. අපි කථා කරන්න ඕනෑ. මේ රට තුළ අපි සියලු දෙනාටම එකට ජීවත් විය හැකි පරිසරයක් ගොඩ නගා ගන්නවා. සමහර අවස්ථාවල සමහර වාසියට පුවත්පත්, සමහර කියන අයට වැරදි වෙන්න පුළුවන්. සමහර පුවත්පත් එක් එක් කාලවලදී දිනමිණ පත්තරේ කිව්වාම ආණ්ඩුවේ පත්තරයක්. අපි දන්නවා. රූපවාහිනී නාලිකාව කිව්වොත් ආණ්ඩුවේ. ITN ආයතනය කිව්වොත් ආණ්ඩුවේ දෙයක්. අපි ඒ News එක භාර ගන්නේ නැද්ද? අද හැම පත්තරේකම තිබුණා. එතුමාගේ කථාව -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කලකදී වහ කලකදී රහ වෙනවාලු.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ නිසා මම කියන්නේ ඇත්තෙන්ම මේ ප්‍රශ්නය ගැන දිගින් දිගටම මම කථා කරන්න යන්නේ නැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අවස්ථානුකූලව ඒක ගෙන ආ යුතු යෝජනාවක්. අද මම කනගාටු වෙනවා. ඇත්තෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු මේ යෝජනාවට කථා කරන්න මෙතැන හිටියා. අපේ මතය ප්‍රකාශ කළ යුතුයි. තමන්ගේ වැඩි ඡන්දවලින් අපි මේක පරාජය කරලා, ඒ අය මෙතැනින් නැගිටලා යන එක නොවෙයි මේකේ වැඩේ. ඒ අයට මේ යෝජනා පිළිබඳව අදහස් දක්වන්න තිබුණා. ඒ අයට අපට වඩා මේ පිළිබඳව අදහස් දක්වන්න තිබුණු වෙලාවේ මම කනගාටු වෙනවා, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මෙතැන නැති එක පිළිබඳව. මම කල්පනා කළා මෙතැන අද කවුරු නැති වුණත්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම හිතන්නේ මේ ඇමතිවරු කවුරුත් මෙතැන නොසිටියා වුණත් මේ යෝජනාව පිළිබඳව අදහසක් ප්‍රකාශ කළ යුතුයි කියලා මම හිටියා. ඒ නිසා අපට මෙහෙම සාමූහිකත්වයක් තිබෙන්න ඕනෑ. අද මේ යෝජනාවේදී කවුරුවත් කියන්නේ නැහැ ගණපූරණය නැහැයි කියලා. සමහර අවස්ථාවල වැදගත් යෝජනාවලදී - පසුගිය කාල සීමාව අරගෙන බැලුවොත් ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මම හිතන්නේ වාර අටකට දහයකට වඩා ගණපූරණය නැහැ. අවුරුද්දෙන් භාගයක්ම රැස්වීම්වල ගණපූරණය නැතිව අහක ගිහිල්ලා තිබෙනවා. මේක මහා බරපතළ ප්‍රශ්නයක් වෙලා. මේ වාගේ සාමූහික වැදගත් යෝජනාවක් ආපු වෙලාවක විපක්ෂය වෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්. අදහස් ප්‍රකාශ කරලා, මේ පළාත් සභාව තුළ රැඳී සිටීම පිළිබඳව මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අමාත්‍යවරයෙක් හැටියට. යෝජනාවට පක්ෂව සිටියා 38 දෙනෙකු. යෝජනාවට විපක්ෂව 30 දෙනෙකු හිටියා. නමුත් අද මෙතැන සහභාගී වෙන්නේ කී දෙනාද? ඒ නිසා මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. රට තුළ මෙවැනි පරිසරයක් ඇති නොවන ආකාරයට රජය නිරන්තරයෙන්ම, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මේ කටයුතු සිද්ධ කර ගෙන යනවා. ඒ නිසා ජාතික සංහිඳියාවක් ඇති කිරීම සඳහා ඉදිරියේදී මෙවැනි ප්‍රකාශන එතුමාගේ මුවින් නැවත වතාවක් කළා හෝ නොකළා. නැවත වතාවක් මෙවැනි ප්‍රකාශ එතුමාගේ මුවින් පිට වෙන්නේ නැති වෙයි කියලා මම විශ්වාස කරනවා. එහෙම වුණොත් අපට නැවත වතාවක් යෝජනාවක් ගෙනැල්ලා තව පැය කිහිපයක් මෙතැන රස්තියාදු වෙන්න සිද්ධ වෙනවා. එතුමා භාර ගත්තා මගේ අතින් මේක සිද්ධ වුණේ නැහැයි කියලා. ඒ නිසා මම මීට වඩා දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා]

සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. වැදගත්, කාලීන යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව. ඒ නිසා අපි සියලුම දෙනා එකතු වෙලා ජාතික සංහිඳියාවකින් යුතුව මේ රට තුළ ජීවත් වීමේ අයිතිය ලබා දීම අප සැමගේ යුතුකමක් කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාව සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කළා. ගරු ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ අවසන් කරන්න සිටියත් තවත් ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් අවස්ථාව ඉල්ලා සිටිනවා. නමුත් දීර්ඝ වෙලාවක් දෙන්න පුළුවන්කමක් නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා මේ සම්බන්ධව ඉතාමත් කෙටි වෙලාවක් අරගෙන තමන්ගේ කථාව අවසන් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ අනුව අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ අ.භා. 02.06 ]

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම වැදගත් යෝජනාවක් අද මේ සභාවට ඉදිරිපත් කළා. මේ යෝජනාව අද හැමකෙනෙක් අතරම මෙතරම් කථා වෙන්නේ, විශේෂයෙන්ම මේ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදීන් විසින් තිස් වසරකට අධික කාලයක් මේ රටේ විරෝධාර රණවිරුවන් 33,000 ක් විතර ඝාතනය කරලා, ඒ වාගේම 28,000 කට වැඩි පිරිසක් ආබාධිත තත්ත්වයට පත් කරලා, විශේෂයෙන්ම අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ ලේකම්තුමාගේ නායකත්වයෙන් ත්‍රිවිධ හමුදාපතිවරුන් විසින් මේ යුද්ධය නිම කරලා සාමකාමී වාතාවරණයක් හැදුවා. උතුරේ මහ ඇමැතිතුමා පත් වීමෙන් පසුව උතුරේ මහ ඇමැතිතුමාගේ පළමුවැනිම යෝජනාව තිබුණේ, ජෙනරාල් චන්ද්‍රසිරි, එවකට හිටපු ආණ්ඩුකාරතුමා ඒ තනතුරෙන් පහ කරන්න කියලා. නමුත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, ඒ රජයත් සංවර්ධන කටයුතු ඉතාමත්ම සාර්ථකව කෙරුවා. මේ විග්නේෂවරන්ගේ කිසිදු යෝජනාවකට ඒ අය හොඳයි කිව්වේ නැහැ. මොකද, හේතුව ත්‍රස්තවාදයක් ඉවර වෙලා ජාතියක් ගොඩ නැඟීමේදී පක්ෂ අතර තිබෙන්නා වූ සම්බන්ධතාවයන් ගොඩ නැඟීමට රජය ගත්තා වූ පිළියම්වලට සම්පූර්ණ විරුද්ධත්වයෙන් තමයි විග්නේෂ්වරන් මහ ඇමැතිතුමා එදා ඉඳලා කටයුතු කළේ. ඒ නිසා විශේෂයෙන්ම 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේ, මේ රටේ හුඟ දෙනෙක් බලාපොරොත්තු වුණා විශාල පරිවර්තනයක් ඇති වෙයි කියලා. හැබැයි ඒ පරිවර්තනය ඇති වුණා. ඒ පරිවර්තනයේ ප්‍රතිඵල තමයි උතුරේ මහ ඇමැතිතුමාගේ ප්‍රකාශයන්. දෙමළ ඩයස් පෝරාව මේ රට හාම්බාන් කරන හැටි. ඒ නිසා අපි රණවිරුවෝ හැටියට විශේෂයෙන්ම කනගාටු වෙනවා. මේ වාගේ තත්ත්වයක් මේ රටේ නැවත වරක් ඇති වුණොත් මේ රණවිරුවන්ට, මේ රටට මුහුණ දෙන්න සිදු වන තත්ත්වය මොකක්ද කියන එක. ඒ වාගේම අද කෝටි සිරකරුවන් දහස් ගණනක් මේ රටේ ඉන්නවා. මේ හැම දේකටම අද මේ රජය වග කියන්න ඕනෑ. එක් පැත්තකින් අද දෙමළ ජනතාව, දැන් උතුරේ ඉන්න මහ ඇමැතිවරයා ඒ වාගේම සම්බන්දන්, සුමන්දිරන් ආදී කට්ටිය කියන්නේ මේ කට්ටිය නිදහස් කරන්න කියලා.

විශේෂයෙන්ම පසුගිය පුවත්පතක තිබුණා යුධ අපරාධ කළ කොටි 50 ක් බ්‍රිතාන්‍යයේ හුරතල් වෙනවා කියලා. මේ වාගේ ප්‍රකාශයන් සිද්ධ වෙන්නේ ඇත්ත වශයෙන්ම දෙමළ ඩයස් පෝරාවට අනුව. ඒ නිසා 2015 ජනවාරි 08 වැනිදා බහුතරයකගෙන් දිනාගත්තු මේ රජය නොහිතපු දෙයක්, ලෝක ප්‍රජාව අද මේ රජයට කරනවා. අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විශේෂයෙන්ම අග්‍රාමාත්‍යවරයා රට රටවල්වලට යනවා. නොයෙකුත් ප්‍රකාශ කරනවා. ඒ ප්‍රකාශ අපේ රටවලට ඉතාමත්ම හොඳ සංහිඳියාවක් ඇති වෙයි කියලා හුඟ දෙනෙක්ගේ අදහස තිබෙනවා. හැබැයි ඊට වැඩිය වෙනස් අර්ථයක් තමයි, යුරෝපා රටවල්, වෙනත් ධනවත් රටවල් අපෙන් බලාපොරොත්තු වුණේ. ඒක අද සිද්ධ වෙමින් යනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ විග්නේෂ්වරන් මහ ඇමැතිවරයාගේ මේ ප්‍රකාශය. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා හිටිය කාලේ අර වර්ධරාජා පෙරුමාල් කරපු දේට - ප්‍රේමදාස ජනාධිපතිතුමා පැය 24 ක් ඇතුළත ඔහුව ඉවත් කළා. ඊට වැඩිය භයානක දෙයක් තමයි අද විග්නේෂ්වරන් කරගෙන යන්නේ. එහෙම නම් මේ රජය, ජනාධිපතිතුමා, අගමැතිතුමාගේ අවධානයට අපි යොමු කරනවා. විශේෂයෙන්ම අපි රණවිරුවෝ හැටියට, මේ රට බේරා ගත්තු රණවිරුවෝ හැටියට මේ රටේ අද ජීවත් වන රණවිරුවෝ හැටියට අපි ඉල්ලා සිටිනවා

මේ විග්නේෂ්වරන්ගේ ප්‍රකාශයට සැබෑ තීන්දුවක් ගත යුතුයි. ඒක තමයි සංහිදියාව. නැත්නම් වෙන්නේ මීටත් වැඩිය ප්‍රකාශ කරන්න පුළුවන්. දැන් බලන්න නැවතත් මේ රටේ ජාතිවාදී කෝලාහල ඇති වන මූලාරම්භය ඇති වුණා. මම ඒවා අනුමත කරන්නේ නැහැ. මේ රටේ බහුතර ජනතාව ඒවා අනුමත කරන්නේ නැහැ. පසුගිය දිනක ස්වාමීන් වහන්සේලා පිරිසක් වව්නියාවට ගිහිල්ලා පටන් ගත්තා මේ ප්‍රශ්නය. ඒ එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල, අසූ එකේ මුල් වකවානුවල සිදු වුණෙත් ඒකයි. එහි ප්‍රතිඵලය තමයි දෙමළ තරුණයෝ, දෙමළ ජනතාව තුවක්කු අතට ගත්තු එක.

ඒ නිසා විශේෂයෙන්ම මේ ප්‍රකාශ සමහරු හැල්ලුවට ලක් කරනවා. සමහරු කියනවා, ඒවා ගණන් ගන්නේ නැහැයි කියලා. මට මතකයි පී. හැරිසන් මැතිතුමා ළඟදී ප්‍රකාශයක් කෙරුවා. මේවා බොරු ප්‍රකාශ. අපේ ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් කවදාවත් මේවා අනුමත කරන්නේ නැහැ. අපි මේවා වෙන්න ඉඩ දෙන්නේ නැහැයි කියලා. එහෙම කියලා මේ අය දකුණට වෙලා සුර සැප විඳිමින් ඉන්නවා. හැබැයි කෝලාහල ඇති වුණාම දුක් විඳින්න වෙන්නේ මේ රටේ අහිංසක ජනතාවට. ඒ නිසා විශේෂයෙන්ම මේ සම්බන්ධව මම හුඟක්ම ස්තුතිවන්ත වෙනවා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට. සිංහලයෙක් වුණත් එතුමා බෞද්ධයෙක් වෙන්න පුළුවන්, කතෝලිකයෙක් වෙන්න පුළුවන්. මේ රටේ පුරවැසියෙක්. මේ රටේ අතීතයේ සිදුවීම් එතුමා හොඳාකාරවම දන්නවා. ඒ නිසා එතුමා වගකීමෙන් ගෙනාපු යෝජනාවට එක්සත් ජාතික පක්ෂය අද මේ පළාත් සභාවේවත් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ නායකයා 2002 මේ රට අරගෙන කරපු දේවල් අපි දන්නවා. පාර්ලිමේන්තුවටත් නොකියා ප්‍රභාකරන් එක්ක ගිවිසුම් අත්සන් කෙරුවා. ඒවා මේ රටේ ජනතාව දන්නවා. කෙසේ වෙතත් දැනට පළාත් සභාවක් හැටියට අපටත් වගකීමක් තිබෙනවා. මේ පළාත් සභා නවයෙන්ම හොඳම පළාත් සභාව, වැඩිපුර මන්ත්‍රීවරුන් සිටින පළාත් සභාව හැටියට අපට මේ යෝජනාවට විරුද්ධ වෙන්න. රජයට කරුණු ඉදිරිපත් කරන්න. ඒ නිසා මම විශේෂයෙන්ම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා මට අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම මම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව කුණු කූඩයට දාන්නේ නැතුව, විවාදයට ලක් කරලා පැත්තකට දාන්නේ නැතුව මධ්‍යම රජයට මේ සම්බන්ධව විරෝධය පළ කරලා ගත යුතු දැඩි තීරණ ගන්න ඔවුන්ව පොළඹවන හැටියට ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 02.11 ]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් සතුටු වෙනවා. අපි උප්පත්තියෙන්ම සිංහලකමත්, බෞද්ධකමත් රකින්න ඉපදුණු මිනිස්සු. ඒ නිසා මේ රටේ සිංහල ජාතිය ගැන අපට වගකීමක් තිබෙනවා. අපේ ආගම ගැන අපට හැඟීමක් තිබෙනවා. හැබැයි අපි ඒ සියල්ල අමතක කරලා තිබෙන්නේ, මේ රටේ තිබෙන ජනවාර්ගික පදනම මත. අපේ එහෙම ගැටුම්කාරී තත්ත්වයන් ඇති වෙන්නේ නැහැ. හැබැයි තව කෙනෙකුට කියන්න පුළුවන් නම්, මේ රටේ දෙමළ ජාතිය වෙනුවෙන් පෙනී ඉන්න පුළුවන් නම් අපටත් කොන්දක් තියෙන්න ඕනෑ සිංහල ජාතිය වෙනුවෙන්, අපේ ආගම වෙනුවෙන් පෙනී ඉන්න. ඒ නිසා කවුරු කෙනෙක් එහෙම පෙනී ඉන්න උත්සාහ කරනවා නම් අපටත් ඒ තැනට යන්න පුළුවන්කම තිබෙනවා.

ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන රටක් වශයෙන්, බහුජාති, බහු ආගම්, බහු භාෂා කථා කරන රටක් වශයෙන් අපි කැමැතියි එකමුතු වෙලා කටයුතු කරන්න. විග්නේෂ්වරන් මහත්තයා වෙන්න පුළුවන්, මේ මම වෙන්න පුළුවන් අපි හැම කෙනාම මේ දේශපාලන ක්ෂේත්‍රයට එන්නේ ජනතාවගේ ඡන්දයෙන්. ජනතා ඡන්දයෙන් ඇවිල්ලා මේ රටේ අතිගරු ජනාධිපතිතුමා ළඟ එහෙම නැත්නම් මේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ළඟ අපි දිවුරුමක් දෙනවා. ඒ තමයි කුමන අවස්ථාවකදීවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවටත්, ශ්‍රී ලංකා දේශය තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීම කෙළින් හෝ අන්‍යායාකාරයෙන් කවදාවත් කටයුතු නොකරන බවටත්. එහෙම නම් අපි හැම කෙනාටම වගකීමක් තිබෙනවා. මේ රට බෙදන්න, මේ රට වෙනම රාජ්‍යයක් බවට පත් කරන්න කොතැනදීවත් රහසින්වත් කටයුතු කරන්න බැහැයි කියන එකට අපි ප්‍රතිඥා දීලා තිබෙනවා. එහෙම නම් මේ රටේ රාජ්‍ය නායකයින්, ඒ අයට තීන්දු කරන්න පුළුවන්. මේ විග්නේෂ්වරන්ගේ ප්‍රකාශයත් එක්ක මේ රටට තමන් දුන්නු ප්‍රතිඥාවට පරිබාහිරව කටයුතු කරනවා නම්, ඒ අනුව කටයුතු කරන්න. ඒ නිසා මම විශ්වාස කරනවා මේවා පිළිබඳව - මේ යහපාලන ආණ්ඩුව පත් වෙලා දැන් වසර 1 ½ ක් 2 ක් ගත වෙනවා. මේ කාලය තුළ මේ ආණ්ඩුව තරම් වාසනාවන්ත

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

ආණ්ඩුවක් මම දන්න තරමින් දන්නේ නැහැ. සුමානයකට වතාවක් විතර කුමන හෝ ප්‍රසිද්ධ සිද්ධියක් සමාජගත වෙනවා. ඒ සිද්ධිය මිනී මැරුමක් වෙන්න පුළුවන්. ඒ සිද්ධිය ජනාවාර්ගික ගැටළුවක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මුදල්, භාණ්ඩාගාර සිද්ධියක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මන්ත්‍රීවරුන්ගේ සිද්ධියක් වෙන්න පුළුවන්. කුමක් හෝ සිද්ධියක් සමාජගත වෙලා සුමාන දෙක තුනක් ඒ සිද්ධිය මතුපිටම කථා කරමින් ඉඳලා අවසානයේ අර්ථයක් නැතුව මේවා ගෙවිලා යනවා. ඒ නිසා මේ වාගේ ප්‍රකාශ සම්බන්ධයෙන් අපට වගකීමක් තිබෙනවා. මේ රටේ සිංහල, බෞද්ධයෝ වශයෙන් මේවා නොකර. එක්කෝ නියගය එයි. මොකක් හරි දෙයක් ඇවිල්ලා මේ රටේ ජනතාව පෙළෙන ප්‍රශ්න අමතක වෙලා යනවා.

ඒ නිසා මම හිතනවා අපට මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඒ වාගේම තමයි දෙමළ ජනතාව අතර තිබෙන ප්‍රශ්නයත්. මගේ දැනුමේ හැටියට මේ ප්‍රශ්නයටත් වග කියන්න ඕනෑ ආණ්ඩුව. ආණ්ඩුව වග කියන්න ඕනෑ කියලා මම කියන්නේ. මේ විකෘති පාර්ලිමේන්තු ක්‍රමය තුළ දෙමළ ජනතාව සම්බන්ධ වෙලා තිබෙන සම්බන්දන් කියන මහත්තයා තමයි මේ රටේ විපක්ෂ නායකයා කරන්නේ. විපක්ෂයට ඒකාබද්ධ කණ්ඩායමක් ඉන්නවා. තවත් පක්ෂ තිබෙනවා. ඒ පක්ෂ සියල්ල නොසලකා හැරලා මේ රටේ දෙමළ සන්ධානයට විපක්ෂ නායකකම දුන්නාට පස්සේ, මේ විග්නේෂ්වරන් කියන මහ ඇමැතිවරයා කලබල වෙනවා. ඔහු කලබල වෙලා ඔවුන් අතර තරගයක් තිබෙනවා. මේ සම්බන්දන්ලා මොන විධියට ඔවුන් එක්ක කටයුතු කරනවාද? මේ විපක්ෂ නායකකමත් අරගෙන මොන විධියටද ඔවුන් හැසිරෙන්නේ? මේ හැසිරීමට පරිබාහිරව මහ ඇමැතිවරයා හැටියට මම කොහොමද කටයුතු කරන්නට ඕනෑ. ඒ නිසා ඔහු නායකත්වය කරා යන්න ගන්න උත්සාහය තමයි මේ. ජනතාව කුපිත කරගෙන, වීදි බස්සාගෙන, ජාතික මාමකත්වයත් අරගෙන තමන්ගේ භාෂාව සහ ජාතිකත්වය ඉදිරියට අරගෙන යන මේ සම්බන්දන්, විශේෂයෙන් සහ විකෘති පාර්ලිමේන්තු ක්‍රමය තුළ ඔහු ගොඩ නැඟෙනවා මේ රටේ ජාතිවාදය කරා යන්න. ඒ නිසා අපි නොදන්නවාට මේවාට අපි හැම කෙනෙක්ම වග කියන්න ඕනෑ. ඒ නිසා මේ වගකීමෙන් තොරව රාජකාරී කිරීම තුළ තමයි මට දැනෙන විධියට කටයුතු වෙන්නේ. ඒ නිසා අපි දන්නවා මේ රටේ 1971 සමගි පෙරමුණු ආණ්ඩුව පෙරළලා. පෙරලලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපි ආසන 08 කට පත් වුණු දවසේ මේ රටේ විපක්ෂ නායක වුණේ, අමිර්තලිංගම් කියන දෙමළ මන්ත්‍රීතුමා. එතකොට මේ විපක්ෂ නායකකම නොවන්නට අපේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ රටේ දෙමළ පක්ෂයක්, මේ රටේ පාර්ලිමේන්තුවේ විපක්ෂය නොවෙන පරිදි මනාප ඡන්ද ක්‍රමය ඇති කරලා, විපක්ෂය නිරන්තරයෙන්ම බහුජාතීන් නියෝජනය කරන්න හැකි ආකාරයට ගොඩ නැඟුවත් අවසානයේ මේ රටේ බලාපොරොත්තු නැති වෙලාවක සම්බන්දන් නැවත මේ රටේ විපක්ෂ නායක වුණාට පස්සේ තමයි මේ වාගේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

දීර්ඝ වෙලාවක් ගන්නේ නැහැ. කථා කරන්න කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. 83 කළු ජූලිය ඇති වුණේ කොහොමද? ඒ වාගේම සංවර්ධන සහා ඡන්ද කාලේ මොකද වුණේ? මේ රටේ දෙමළ ජාතීන් අතර තිබෙන විශ්වාසය පළුදු වුණේ කොහොමද? ඒ වාගේම මේ යුද්ධය හමාර වුණාට පස්සේ මිනිස්සු අතර තිබෙන මේ සංහිඳියාව ගොඩ නැඟෙන්න තිබෙන බාධා මොනවාද? මේ වාගේ කරුණු කාරණා තිබෙනවා. නැවතත් මට කියන්න සිද්ධ වෙන්නේ අපි උප්පත්තියෙන්ම සිංහල ජාතියත්, බෞද්ධ ආගමත් රැකගන්න ඉන්නේ. එය පදනම් කරගෙන ඉපදිලා ඉන්නේ, මේ ජාතියත්, ආගමත් දිවි හිමියෙන් ආරක්ෂා කරන්න කටයුතු කරන බලාපොරොත්තුවෙන්. යම්කිසි කෙනෙක් ඒ ආකාරයෙන් කටයුතු කරන්න බලාපොරාත්තු වෙනවා නම්, සිංහල ජාතිය වෙනුවෙනුත්, ආගම වෙනුවෙනුත් දිවි පුදා කටයුතු කරන්න වුණත් අපි කටයුතු කරනවා. නමුත රටක් වශයෙන් සංහිඳියාව අවශ්‍ය නම්, එකමුතුකම අවශ්‍ය නම්, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවා නම් අපි ඒ තැනට ඉතාමත්ම නිහතමානීව කටයුතු කරන්න කැමැතියි. ඒ නිසා බස්නාහිර පළාත් සභාව වශයෙන් වඩාත් වගකීමෙන් කටයුතු කරන බව ඔබතුමාට දැනුම් දෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මට නම් හොඳටම බඩගිනියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධයෙන් අපි මොකක් හරි තීන්දුවක් අර ගනිමු. ලේකම්තුමාගේ අවධානය යොමු කරනවා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට ඉතාමත් කෙටියෙන් තමන්ගේ කථාව අවසන් කරන්න කියලා ඉල්ලනවා.

[ අ.භා. 02.18 ]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති අත්හිටුවීමේ යෝජනාවක් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම වැදගත් යෝජනාවක් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනැත් තිබෙනවා. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු, මේකට අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. මේකට විරුද්ධව, යූ.ඇන්.පී. එකේ මන්ත්‍රීවරු, ඒ වාගේම සරත් ෆොන්සේකා මැතිතුමාගේ පිළේ ඉන්න මන්ත්‍රීවරු ටික නැඟිටලා ගියා. හැබැයි, මෙතැන මහා විශාල ලෙස සංහිඳියාව ගැන කථා කරන, මේවාට උඩගෙඩි දෙන පසුගිය කාලයේ ජාතිවාදය වපුරපු අර බේරුවල මුස්ලිම් - සිංහල කෝලාහලය යන කොට මේ පළාත් සභාවට සීඩී තැටි ගෙනැල්ලා බෙදලා, මෙතැන ඉඳගෙන මුස්ලිම් ජාතියට විරුද්ධව කථා කරපු හෙළ උරුමයේ නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමයි, එහා පැත්තෙන් ඉන්න නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියයි මෙතැනින් නැඟිටලා මම හිතන්නේ අර කට්ටියත් එක්ක ගියා. මෙන්න සංහිඳියාව. මේක සංහිඳියාවද? මේවාට මහා ජාතිවාදය ඇදලා කථා කරලා අද මම හිතන්නේ, මේ විග්නේෂ්වරන් කියන මහ ඇමැතිවරයා අර උතුරුකරයේ ඉඳගෙන දෙමළ අය වෙනුවෙන් නැඟිටියව් කියන කොට සිංහලයන් වන අපටත් කැක්කුමක් තිබෙනවා. මේ ඉන්න මුස්ලිම් ජාතියටත් කැක්කුමක් තිබෙනවා. එහෙමනම් කොයි වෙලේ හරි සිංහලයනුත් නැඟිටින්න කියලා මේ මුස්ලිම්වරුත් නැඟිටින්න කියලා නායකයෝ කෑ ගහලා කිව්වොත් මොකද වෙන්නේ? මෙතැන සංහිඳියාවක් ඉතුරු වෙයිද? ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ බුදුරජාණන් වහන්සේ පමණක් නොවෙයි. සියලු ආගම්වල නායකයන් මේ සංහිඳියාවට අත දුන්නා. ඒකට අවශ්‍ය කරන ශක්තිය දුන්නා. හැබැයි, විග්නේෂ්වරන් කියන මහ ඇමැතිවරයාට ඕනෑ ඕනෑ විධියට නටන්න මේ රටේ ඉන්න නායකයන් ඉඩ දෙනවා නම්, කියන කියන වෙලාවට ඔක්කොම කියන්න ඇරලා සමාව ඉල්ලනවා නම් මම හිතන්නේ මේක සංහිඳියාවට අවශ්‍ය කරන ශක්තියක් නොවෙයි. ඒ නිසා මහා බැරෑරුම් කථාවක් තමයි මෙතුමා කිව්වේ. හැමදාම මොකක් හරි කියනවා. එක්කෝ කොහේ හරි කඩාගෙන පනිනවා. ඒක කරලා ඉවර වෙලා සමාව ඉල්ලනවා.

අපි නැවත වතාවක් මේ යහපාලන ආණ්ඩුවෙන් ඉල්ලන්නේ සංහිඳියාව කථා කරන මේ අපි දකුණේ ඉන්න මිනිස්සුන්ව නැගිට්ටවන්න හදනවා නම්, අපි අවශ්‍යතාවය - අපි කියනවා. ඊයේ පෙරෙයිදා වන කොට අපි ජීවත්වන ප්‍රදේශවල සුළු ජාතිය වන දෙමළ ජාතිය හයසියයක්, හත්සියයක් පමණ ඉන්නවා. ඒ පළමුවැනිදා, දෙවැනිදා දවසේ අපේ අලුත්ගම නගරයේ තිබෙන හොඳම හින්දු කෝවිල. ඒක කරන්න දෙන්නේ නැතිව පසුගිය කාලයේ ඒවාට සමහර කොටසක් ලෙඩ ඇදගෙන හිටියා. මේ කථා කරන මම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙලා ඉන්න කාලයේ සිට අද වනතුරුත් ඒ උත්සවය අතිසාර්ථක කරන්න දෙවැනිදා දවසේ දෙමළ ජාතියට අවශ්‍ය කරන උපරිම ශක්තිය දීලා, අද ඒ දෙමළ ජාතියට අවශ්‍ය කරන ශක්තිය ලබා දීලා පෙරහැර ඉතාමත් අලංකාර පෙරහැරක් බවට අපි නිර්මාණය කරන්න දුන්නා. එහෙමනම් අපි ජාතිවාදී නොවෙයි. අපි ආගම්වාදී නොවෙයි. අපි කුලවාදී නොවෙයි. අපි මේවාට නැහැ. අපි ඔක්කොම එක තැන ඉඳගෙන දේශපාලන පන්නරය ලබාගෙන ඒ අවශ්‍ය කරන ශක්තිය මේ හැමදෙනාම ජනතාවට ලබා දුන්නා. හැබැයි, සමහර කොටසක් ඉඳගෙන, මම හිතන්නේ මේ වනකොට තිස් තුන් අවුරුදු යුද්ධය නිමා කරලා මේ රටට සංහිඳියාව අවශ්‍ය කරන උපරිම ප්‍රමාණයෙන් ලබා දීලා, නිදහස ලබා දීලා මේ යුද්ධය නිමා කරලා දෙමළ ඩයස් පෝරාව කියන මහා ත්‍රස්තවාදය සහමුලින්ම සාතනය කරලා, බිත්තියට හේත්තු කරලා නොවෙයි. බිත්තිය අනික් පැත්තටම දාලා ඉවර කරලා දුන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාටයි. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු හිටපු හමුදාපතිතුමා ප්‍රධාන සියලුම රණවිරුවන්ටයි අපි අපේ ගෞරවය ප්‍රණාමය පුද කරන්න ඕනෑ. එහෙම ගෙනාපු රටට නැවත මේ වාගේ මහා විනාශකම් කරන්න මේ වචන ප්‍රකාශ කරන්න ශක්තිය මේගොල්ලන්ට දෙනවා නම් මම හිතන්නේ, මේක සංහිඳියාව නොවෙයි. මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලන්නේ මේ විග්නේෂ්වරන් කියන මහ ඇමැතිවරයා මේ විධියට තවත් හැසිරෙන්න ගත්තොත්

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

දකුණු පැත්තත් අපට නැඟිටින්න සිද්ධ වෙනවා. එහෙමනම් සිංහල ජාතියට පමණක් නොවෙයි. මේ ඉන්න මුස්ලිම් ජාතියට, දකුණේ ඉන්න අපේ දෙමළ ජාතියට නැඟිටින්න සිද්ධ වෙනවා. එහෙම වෙන්න ඉඩ නොතියා අපේ වර්තමාන ජනාධිපතිතුමාට, අගමැතිතුමාට මේවා දන්වලා ඇරලා ඔවුන්ට අවශ්‍ය කරන නිවැරදි දඬුවම, මෙවන් දේවල් නැවත ප්‍රකාශ නොකරන්න, නැත්නම් ඔහුව ඉවත් කරන්න කටයුතු කරන්නය කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව අපි හදවතින් ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. මේ වාගේ බංකොළොත් වුණු විග්නේෂ්වරන් කියන මේ දේශපාලඥයාට නැවත අර අහිංසක උතුරුකරයේ ඉන්න ඒ දෙමළ ජනතාවගේ ඡන්දවලින් නැවත මොහුව පත් නොකරන්නත් ඔවුන්ට මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

[ අ.භා. 02.24 ]

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව මුලින්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. මම මුලින්ම කියන්න ඕනෑ, ප්‍රධාන පක්ෂයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියටත් මුස්ලිම් ජාතිකයෙක් හැටියටත් අපි ජාතිවාදය තරයේම ප්‍රතික්ෂේප කරනවා. මොකද හේතුව දෙමළ ජාතිවාදය පමණක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිංහල ජාතිවාදය වාගේම මුස්ලිම් ජාතිවාදයත් මේ රට තුළ යම්කිසි මට්ටමක පසුගිය කාලය තුළ තිබුණා. ඒකට උදාහරණයක් හැටියට මට කියන්න පුළුවන්, විග්නේෂ්වරන් මහ ඇමැතිතුමා උතුරේ දෙමළ ජනතාව අතර ජාතිවාදය අවුස්සනවා වාගේම පසුගිය කාලය තුළ සිංහල බෞද්ධයන් අතර අර බොදුබල සේනාවේ ඒ ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ කණ්ඩායමක් විසින් ජාතිවාදය ඇවිස්සුවා. ඒ වාගේම තමුන්නාන්සේට මතක ඇති. එදා කොළඹ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති වෙලා ඉඳලා ඊට පස්සේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපති වෙලා ඉන්න කාලයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු වෙලා, ඊට පස්සේ ජාතිවාදය කියන, ඒ මුස්ලිම් ජාතීන් අතර ජාතිවාදය පතුරුවරන්න මධ්‍යම පළාතට ගිහිල්ලා පළාත් සභාවට ඡන්දය ඉල්ලලා ඡන්දය දිනපු කෙනෙකුත් ඉන්නවා. මම නම කියන්න කැමැති නැහැ. ඒ නිසා ඒ වාගේ ජාතිවාදීන් දැන් නොබෝ දිනකින් ඡන්දය ප්‍රකාශයට පත් කළොත් ඒ වාගේ ජාතිවාදීන් අපට දැකගන්න පුළුවන් වෙනවා. මොකද, මේ සමාජය තුළ ඔය වාගේ ජාතිවාදීන් කොටස්වලට බෙදී තිබෙන නිසයි මේ ජාතිවාදය අද ඇවිස්සිලා තිබෙන්නේ. ඒ නිසා මම කියන්නේ සිංහල වාගේම, මුස්ලිම් වාගේම, දමිළ වාගේම සියලු ජාතීන් -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

නොබෝ දිනකින් ඡන්දය තියන්නේ නැහැ.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

මොකද හේතුව, අපි දකුණේ එහෙම නැත්නම් නැගෙනහිර, උතුර නොවන බස්නාහිර එහෙම නැත්නම් දකුණේ ජීවත් වන මුස්ලිම් ජාතිකයෙක් විධියට අපි මේ පළාත් සභාව නියෝජනය කරන්නේ මුස්ලිම් ජනතාවගේ ඡන්දයෙන් විතරක් නොවෙයි. කතෝලික, බෞද්ධ, දමිළ, ඒ වාගේම මුස්ලිම් සියලුදෙනාගේම නියෝජිතයන් හැටියට තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි සහයෝගයෙන් සහජීවනයෙන් ජීවත්වන්න පුළුවන් පරිසරයක් තුළ තමයි අපි සියලු දෙනාම ජීවත් වෙන්නේ. ඒ නිසා අපට විශේෂයෙන්ම කථා කරන්න අයිතියක් තිබෙනවා. මොකද, අපි වෙනත් ජාතියක් නියෝජනය කෙරුවත් අපි සිංහල මිනිස්සුත් එක්ක ඉතා සුහදව අපේ ගම්වල කටයුතු කරනවා. ඒ නිසා එක පැත්තකින් උතුරේ මහ ඇමැතිවරයා උතුර වෙනම ඉල්ලන කොට ටික කාලයක් ගියාට පස්සේ නැගෙනහිර මුස්ලිම් ජනතාවත් ඉල්ලන්න පුළුවන්. එයාලටත් කොටසක් දෙන්නය කියලා. ඒ නිසා එහෙම වුණාම දකුණේ ජීවත්වන මුස්ලිම් ජනතාවට ඉතා විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා අපි මේකට පැහැදිලිවම විරුද්ධයි. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට 2004 දී ස්වභාව ධර්මයා විසින් යම්කිසි පණිවිඩයක් දුන්නා. මේ රටේ ජාතිවාදය නැති වෙන්න හොඳම අවස්ථාවක් තමයි 2004 අපට දුන්නේ. 2004 සුනාමි අවස්ථාවේදී උතුරේ මිනිස්සු මැරුණා. ඒ වාගේම නැගෙනහිර මිනිස්සු මැරුණා. ඒ වාගේම දකුණේ මිනිස්සු මැරුණා. සිංහලද මුස්ලිම්ද දමිළද කියලා බැලුවේ නැහැ. එදා අපි බැකෝ යන්ත්‍ර පාවිච්චි කරලා තොග පිටින් මරණ සහතික දීලා සිංහල මිනිහාවයි, මුස්ලිම් මිනිහාවයි, දෙමළ මිනිහාවයි එකට වැළලුවා. ඒ වාගේ ඉතිහාසයක් අපට තිබෙන කොට අපට සිද්ධ වෙනවා, මේ වාගේ ජාතිවාදී ප්‍රකාශ කිරීම

සම්පූර්ණයෙන්ම පිළිකුල් සහගතව ප්‍රතික්ෂේප කරලා මේ රටේ සියලු ජාතීන්ට, සියලු ආගම්වලට නිදහසේ ජීවත් වෙන්න වටපිටාවක් අපට ලබාදෙන්න ඕනෑය කියලා ඒ ඉහළ නායකයන්ට පණිවුඩය ලබා දෙමින් නැවත වතාවක් විග්නේෂ්වරන් ප්‍රධාන අමාත්‍යවරයා කළ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[ අ.භා. 02.27 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තූතිවන්ත වෙනවා. මම හිතන්නේ දෙමළ ජනතාව නොවෙයි අපටයි සමහර වෙලාවට අයිතිවාසිකම් නැති වෙන්නේ. රීති අත්හිටුවලා කථාව ගත්තේ බොහොම අමාරුවෙන්. දෙමළ ජනතාවට ඉස්සෙල්ලා අපේ අයිතිවාසිකම් දිනාගන්න වැඩ පිළිවෙළක් තමයි කළ යුත්තේ කියන එකයි මම දකින්නේ. මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අනික් කාරණාව අපි නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ආසනය ගත්තාම මම හිතන්නේ දෙමළ ජනතාව අට දාහක්, නව දාහක් පමණ ජීවත් වන ආසන. ඒ වාගේම මුස්ලිම් ජනතාව හාර පන්දාහක් ජීවත් වන ගම්මාන තිබෙනවා. මේ කාරණා වෙනුවෙන් අපි විනාඩියක්වත් පෙනී නොසිටියා නම්, අපට ඒ අය වෙනුවෙන් කථා කරන්න දෙයක් නැති වෙනවා. ඒ අය වෙනුවෙන් පෙනී නොසිටියා වෙනවා කියන එකයි මම දකින්නේ. මොකද, විශේෂයෙන් පසුගිය 2015 මැතිවරණයේ ජනවාරි මාසයේ තිබුණු ජනාධිපති මැතිවරණය තරම් ඉතිහාසයේ තිබුණු මැතිවරණ වලින් ජාතිවාදය පොළඹවලා, ජාතිවාදය ඉස්මතු කරලා ගිය මැතිවරණයක් මම හිතන්නේ අපට දකින්න නැහැ. මොකද, එදා ජාතිවාදයට තමයි සම්පූර්ණයෙන්ම එක පැත්තක් වුණේ. ඒ පැත්තට යොමු කරලා ඒ වෙනුවෙන් හඬක් නහලා ගිය මැතිවරණයක්. ඒ තුළින් ජයග්‍රහණය කරපු ආණ්ඩුවක් තමයි අද ඇත්තටම පවතින්නේ. හැබැයි, ඒවායේ ප්‍රතිඵල ඒවායේ ඵල විපාක තමයි අද උතුරේ මහ ඇමැතිතුමා වුණත් ගේන්නේ කියන එකයි මම දකින්නේ. මොකද, ඒවා ගේන කොට අපි කවුරුත් කිව්වා, මහින්ද රාජපක්ෂ මැතිතුමා දමිළ ජනතාව හම්බ වුණු වෙලාවේ කිව්වේ විගනේෂ්වරන් කියන්නේ ජාතිවාදයෙක් නොවෙයි කියන එක. ඇත්ත. වෙන්න ඇති. අපට මතකයි අපි අසූ ගණන්වල, ජූලි කලබල දවස්වල අපේ නගරයේ තිබුණු, ඔබතුමාත් නියෝජනය කරන නගරයේ තිබුණු දමිළ කඩෙන් ඉස්සෙල්ලා දවසේ ණයට බඩු ගෙනියපු මිනිහා තමයි පහුවෙනිදා ඇවිල්ලා කඩේ ගිණි තියලා විනාශ කළේ. ඊට ඉසේසල්ලා දවසේ, එහෙම නැත්නම් එදා උදේ බෙහෙත් ගත්ත දොස්තරගේ ගේ තමයි ගිණි තිබ්බේ. නමුත් අපි ඔවුන්ව හා ඒ මොහොත වනතුරු ඒ පැය ගණන වෙනතුරු හරිම ලෙංගතු බවින් එකට හිටියා. නමුත් කොහෙන් හරි ආපු බලවේග කොහෙන් හරි ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ නිසා රට ඒ තත්ත්වයට වැටුණා. අදත් ඒක තමයි වෙන්නේ.

මම හිතන්නේ මේ උතුරේ ඉන්න දමිළ ජනතාව තුළ ඒ අදහස නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ. වෙනත් අදහසක්. මොකද, අපි දකිනවා අපේ ගම්මානවල ඉන්න දෙමළ ජනතාව අපත් එක්ක ඉතා සුහදව ඔවුන් හරි නිදහසේ ඉන්නවා. 2009 ට ඉස්සෙල්ලා ඔවුන්ට උදේ පාන්දර ඔවුන්ගේ ලෙඩෙක් ඉන්නවා නම් උදේ පාන්දර ලෙඩා බලන්න පහට, හතරාමාරට පාරේ යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ අය Identity එක නොගෙන ගියොත්, ලෙඩා මැරුණත් ආයේ Identity එක අරගෙන එන්න ඕනෑ. එහෙම නැත්නම් පොලීසියේ ඉඳලා පහුවැනිදා තමයි එන්න තිබුණේ. ඔවුන්ට ඒ නිදහස ලැබිලා තිබුණා මේ යුද්ධයෙන් පස්සේ. නමුත් අද ඊළඟට නැවතත් මේ අයව වෙනත් ආකාරයට පොළඹවන වැඩ පිළිවෙළක්ද කියන එක ඇත්තටම අපට හිතාගන්න බැහැ. මම වැඩිදුර කථා කරන්නේ නැහැ. මොකද, ඇත්තටම මේ කාරණා වෙනුවෙන් ගොඩක් කථා කළා. අපි ඒ වෙනුවෙන් පෙනී නොසිටියා නම් ඒක වරදක් හැටියට දකිනවා වාගේම කනගාටු වෙනවා එක්සත් ජාතික පක්ෂයේ අයට. මොකද ඒ අයට මේක හොඳ හෝ නරක මොකක් හරි ක්‍රමවේදයක් මේ අයට සඳහන් කරන්නේ නැතිව ලිස්සලා යාම පිළිබඳව විශේෂයෙන්ම ආණ්ඩුවත් කරන්නේ ඒ කාරණයමයි. අද එක්සත් ජාතික පක්ෂයත් කළේ නිකන් ලිස්සලා ගිය එක තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කිසිම දෙයකට මුහුණ නොදී ඒ තමන්ගේ කොන්දක් නැති බව අද ඔප්පු කළා. මේ ආණ්ඩුවට කොන්දක් නැහැ වාගේ තමයි අද එක්සත් ජාතික පක්ෂයත්, ෆොන්සේකා මහත්මයා නියෝජනය කරන පක්ෂයත් කළේ.

ඒ වාගේම විශේෂයෙන් එක කාරණාවක් මතක් කරන්න ඕනෑ. නිශාන්ත වර්ණසිංහ අපේ හිටපු ගරු ඇමැතිතුමාට ඇමැතිකමක් නැති වුණා වාගේම එතුමා මේ මෑතකදී ඇවිල්ලා පෞද්ගලික පැහැදිලි කිරීම්වල

[ගරු ලලිත් වර්ණකුමාර]

මහා හයියෙන් කෑ ගැහුවා මේ බුදු පිළිම කඩනවා. අපේ ආගමට මෙහෙම කරනවා කියලා. එතුමා අද මේ යෝජනාව ගේන්න රීති අත්හිටුවීමේ වැඩ පිළිවෙළ තුළ එතුමායි, එතුමාගේ නැගණියයි අරගෙන බොහොම ඉක්මණට එළියට ගියා. එළියට ගිහිල්ලා ඡන්දය දෙන්න හිටියේවත් නැහැ. එදා මේ ආණ්ඩුව හදන්න, ආණ්ඩු ගේන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහේද ගියේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මෙතැනින් එළියට ගියා. මේ ආණ්ඩු හදන්න, මේ ආණ්ඩු ගේන්න වැඩ කරලා ආණ්ඩු ගෙන යන වැඩ පිළිවෙළවල් කෙළ වුණාම මෙතැන ඇවිල්ලා කෑ ගහනවා වාගේම අනික් පැත්තෙනුත් හොඳ නාමය ගන්න ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. මේක මහා මවා පෑමක්. මේක නිකන් ආලේප කිරීමක් විතරයි මේ අය රටට ජාතියට කරන්නේ. ඒ නිසා ඇත්තටම ඒ ගැන කනගාටු වෙමින් මේ වැඩ පිළිවෙළවල්වලට යම්කිසි ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. මේවා සමහර විට කීහිප දෙනෙකුගේ අවශ්‍යතාවයන් තුළ මේ රට අස්ථාවර කරන්න, එහෙම නැත්නම් මේ රටේ තවත් යුද්ධයක් ඇති කරන්න, මේ රටේ ජනතාවගේ තිබෙන එකමුතු භාවය, දකුණේ තිබෙන එකමුතු භාවය නැති කරන්න ගෙනෙන වැඩ පිළිවෙළවල් කියන එකයි මතක් කරන්නේ. ඒ නිසා මම මීට වැඩිය කථා කරන්නේ. ඒක අපි හොඳට තේරුම් ගත යුතුයි. ඊයේ පෙරෙයිදා තිබුණු වතුවල උද්ඝෝෂණ අපි හිතන්න ඕනෑ. දෙමළ ජනතාව ඇයි පාරට ඇවිල්ලා ඉන්නේ. අර නිවේදනවල එළ විපාක වෙන්න ඇති. ඒ නිසා මේක බුද්ධියෙන් හිතලා කටයුතු කළ යුතු කාලයක් හැටියට මම දකිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාවේ පිළිතුරු කථාව සඳහා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 02.31 ]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා අපේ ආණ්ඩු පක්ෂයේ කථා කළ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට. නම් වශයෙන් කියන්න යන්නේ නැහැ. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණෙන් කථා කළ මන්ත්‍රීවරුන්ටත්. අපේ මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණා සරත් ෆොන්සේකා මහත්තයාගේ පක්ෂය කියලා. ඒ පක්ෂයේ දෙදෙනෙක් රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමා සහ අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා යන දෙදෙනාත් අපට සහයෝගය දක්වන්න මෙතැන හිටියා. ඒ නිසා සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂය සහ අනෙකුත් පක්ෂ නියෝජනය කරන අය මෙතැනින් පිටවීම සම්බන්ධව කනගාටු වෙනවා. මොකද, මේක අත්‍යවශ්‍යම යෝජනාවක්. මීට ඉහත ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු වෙලාවේත් මේ ගැන සාකච්ඡා කළා. නමුත් එතුමා කියපු විධියට මේක කාලෙන් කාලෙට ගේන්න වුණේ මෙතැන පුවත්පත්වල ඒවා සඳහන් කළා. පුවත්පත්වලට වැඩිය එක පැත්තකින් විද්‍යුත් මාධ්‍යවල සජීවීව කථා කරන අය මුළු රටම දැක්කා. අන්තර්ජාලය හරහා ඒ වාගේම Facebook හරහා දැක්කා. ඒ නිසා මේක ආන්දෝලනාත්මක කථාවක්. අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කිව්වා, ඊයේ ජාතික ක්‍රීඩා උළලේදී අපේ වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉන්න උත්සවයේදී විග්නේෂ්වරන් මහත්තයා කථා කරලා කිව්වා, එතුමාගේ කථාව අහන්න කියලා. නමුත් අපි දැක්කා රූපවාහිනීවල, විද්‍යුත් මාධ්‍යවල ආණ්ඩු පක්ෂ යහපාලනයේ ඉන්න එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න නායකයින් ඒ වාගේම පක්ෂ නායකයින් කථා කරලා ඉල්ලීමක් කෙරුවා, මේ කරපු ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියලා. නමුත් අද වනතුරු විග්නේෂ්වරන් මහත්තයා මේ කථාව ඉල්ලා අස් කර ගත්තේ නැහැ. ඒ වාගේම තව පැත්තකින් රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමා පෙන්නුවා වාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කරපු ප්‍රකාශයක් - අපි දන්නවා සාමාන්‍යයෙන් පත්තරේ මුල් ප්‍රකාශය දාන්නේ වෙනත් වාක්‍යයක්. පත්තරේ විකුණ ගන්න සහ බලාගන්න ඕනෑ විධියට. හැබැයි කථාව කියවගෙන යනකොට දැක්කා එතුමා පැහැදිලිව කියලා තිබෙන්නේ දේශපාලනයට එන්න පෙර ජාතිවාදයෙක් නොවෙයි කියලා. නමුත් දේශපාලනයට ආවාට පස්සේ එතුමා ජාතිවාදියෙක් බව අද විශ්වාස කරන

විධියට තමයි ප්‍රකාශ කරලා තිබෙන්නේ. එය අද දිනමිණ පත්තරේ පමණයි තිබෙන්නේ. වෙන එකම පත්තරේකවත් නැහැ. රජයෙන් ඒක මහින්ද රාජපක්ෂ මහත්තයා කියපු විධියට ප්‍රකාශ කරන්න දීලා තිබෙනවා. අපි ඒක විශ්වාස කරන්නේ නැහැ. මොකද, පුවත්පත්වල එක එක විධියේ ප්‍රකාශ කරන නිසා. නමුත් මේක ආන්දෝලනාත්මක වුණේ, විග්නේෂ්වරන් මහත්තයා ප්‍රසිද්ධියේ සජීවීව ප්‍රකාශ කළ නිසා. ඒ නිසා අපි එතුමාට මතක් කරන්න ඕනෑ 88 පළාත් සභා ක්‍රමය ගෙනාවේ විශේෂයෙන් උතුරු පළාතේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න. නමුත් එදා උතුරු පළාත් සභාව පිහිටුවලා වර්ධරාජා පෙරුමාල් කරපු මේ වාගේ ප්‍රකාශ නිසා එතුමාට පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධූරයෙන් ඉවත් වෙන්න සිද්ධ වුණා. ඒ වාගේම නැවත අවුරුදු 30 ක යුද්ධයෙන් පස්සේ නැවත ඡන්ද අයිතිය ලබා දීලා, උතුරේ මහ ඇමැතිවරයෙක් පත් කරලා, ලබන අවුරුද්දේ පළාත් සභාව ඉවර වෙන්න කාල සීමාව තියෙද්දී මේ වාගේ ප්‍රකාශ කිරීම තුළ මම හිතන්නේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට දෙමළ ජාතික සන්ධානයට කියා ගන්න බැරි දේවල් මේ පළාත් සභාව තුළ ප්‍රධාන අමාත්‍යතුමා හරහා මේවා කියා ගන්න එක්තරා උවමනාවකට පසුබිම හදාගෙන ඇති කියලා අපි විශ්වාස කරනවා.

මම මීට වැඩිය දීර්ඝව කථා කරන්නේ නැහැ. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමාට, ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ මේ වනතෙක් හිටපු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට, රීති අත්හිටුවීමේ යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දීපු අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම විශේෂයෙන්ම විරුද්ධ පක්ෂය වශයෙන් පෙනී සිටින ජනතා විමුක්ති පෙරමුණේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම සරත් ෆොන්සේකා මහත්තයාගේ පක්ෂයේ අපත් සමග සම්බන්ධ වී කටයුතු කරන රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමාට සහ අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. එතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. විවිධ අදහස් දැක්වුවා. ඒ යෝජනාව පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.35 ට, 2016 ඔක්තෝබර් මස 18 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 02.35 p.m till 09.30 a.m, on 18.10.2016.*